# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

*වාර්ෂික වාර්තාව - 2016*

මේ වූ කලී, 2016 වසර තුළ ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එළි දක්වනු ලබන වාර්ෂික වාර්තාවයි. 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පණතේ 30 වන ඡේදය පරිදි එය ඉදිරිපත් කෙරේ.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**ප්‍රධාන කාර්යාලය**
**අංකඃ 14, ආර්.ඒ ද මෙල් මාවත,කොළඹ 04**
**දු.ක.(94) 0112505580, 2505581, 2505582**
**ෆැක්ස්: (94)0112505591**
**වි.තැ. sechrcsl@gmail.com**
**වෙබ් අඩවියඃ www.hrcsl.lk**

# කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය - 2016

**සභාපතිනී**

ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මැතිතුමිය

**කොමසාරිස්වරු**

එච්.ගසාලි හුසේන් මහතා

ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා,

අම්බිකා සත්කුණනාදන් මිය

ආචාර්ය උපනන්ද විදානපතිරණ මහතා

# සභාපතිතුමියගේ පණිවුඩය

2016 වසරින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විශේෂිතවූ වර්ෂයක් සනිටුහන් කෙරේ. එය ප්‍රතිසංස්කරණ වර්ෂය ලෙස විග්‍රහ කිරීම වඩාත් යෝග්‍ය වෙයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය (2015) යටතේ ස්ථාපිත නව කොමිෂන් සභාව 2015 ඔක්තෝබර් මාසය අවසානයේදී ස්වකීය රාජකාරි කටයුතු අරඹන ලදී. 2015 වසරට අදාළ මාගේ වාර්ෂික වාර්තාවේද සඳහන් කරන ලද පරිදි, 19 වන සංශෝධනය යටතේ ව්‍යවස්ථාදායක සභාව විසින් නම් කරන ලදුව පත්වීම් ලද සාමාජිකයින්ගෙන් ප්‍රතිස්ථාපිත වීමෙන් අනතුරුව, තමන් වෙත යොමුව ඇති උච්චතම ජනතා අපේක්ෂාවන් කොමිෂන් සභාව විසින් දැඩිව ග්‍රහණය කර ගන්නා ලදී. ස්වකීය කාර්ය මණ්ඩලය, සිවිල් සමාජ, රාජ්‍ය නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් හා සමග පෘථුල උපදේශනයන්හි නියැලීමේ අවස්ථාව 2015 වසෙර්දී ශේෂිත මාස කිහිපයේදීම උදාකර ගත් කොමිෂන් සභාව, එකී දැනුම මත පිහිටා, ප්‍රතිසංස්කරණ අපේක්ෂාවන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සැලසුම්කරණය සහ ආයතනික සංවර්ධනය 2016 වසරේදී සාක්ෂාත් කර ගැනීමේ මාර්ගයට අවතීර්ණ වූවාය.

ප්‍රතිපත්ති ප්‍රමුඛතාව සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයන් සම්බන්ධයෙන් වඩාත් පැහැදිලි චින්තනයකින් කටයුතු කිරීමේ අරමුණ පෙරදැරිව, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්ගේ සහභාගිත්වය ද ඇතිව කොමසාරිස්වරුන් අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ සංවාදයක නිරත වීම වර්ෂය ආරම්භයේදීම සිදුවිය. ඉනික්බිති, 2017-2019 තෙවස් කාල පරාසයක් සඳහා කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලසුම සම්පාදනය කර ගැනීම පිණිස සමස්ත දිවයින පුරා විවිධ පාර්ශ්වකරුවන් හා සමග උපදේශන මාලාවක් පැවැත්වීමද මෙම වර්ෂය තුළම සිදු විය. මෙහිලා ප්‍රාදේශීය කාර්යාල දහය මගින්ද ප්‍රමුඛ දායකත්වයක් සැපයිණ. බහුතරයක ශ්‍රී ලාංකිකයනට මෙකී ප්‍රාදේශීය කාර්යාල තුළින් පිළිබිඹුවන්නේ මානව හිමිකම් කොමිෂන් සභාවේ ජනහිතකාමී ප්‍රතිමූර්තියම බව කොමිෂන් සභාව මැනවින් වටහා ගෙන සිටී. දීර්ඝ වූ විචාරශීලී සාකච්ඡා වලින් අනතුරුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලසුම් සම්පාදනය නිම කර සම්මත කර ගැනිණ.

සමස්තයක් වශයෙන්, 2015 වසෙර්දී රට තුළ නිරීක්ෂණය වූ මානව අයිතිවාසිකම් තත්ත්වයෙහි වැඩි දියුණුව අඛණ්ඩව පවත්වා ගෙන යාම සිදුවූ බවට 2016 වසර සාක්ෂි දරයි. බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන්වීම් හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ

බාහ්‍ය-අධිකරණ ඝාතනයන් සම්බන්ධ සිද්ධි කිසිවක් වාර්තා නොවීය. විස්තාරණය වූ ප්‍රජාතාන්ත්‍රික අවකාශය හේතු පාදකව, මාධ්‍ය නිදහස ඇතුළු භාෂණයේ, රැස්වීමේ හා සමාගමයේ නිදහස භුක්ති විඳීම රිසි සේ සිදුවිය.

කෙසේවුවද, හිංසනයට අදාළ පැමිණිලි අධික ලෙස කොමිෂන් සභාව වෙත ගලා ඒම සිදුවිය. හිංසනයට අදාළ පැමිණිලි අඛණ්ඩව ගලා ආ ආකාරය කොමිෂන් සභාවේ හද දැඩිව සසල කරවන්නක් විය. විශේෂයෙන්ම 2011 වසරේදී හදිසි අවස්ථාව ඉවත් කිරීමෙන් පසුව පස්වසරක ඇවෑමෙන් සහ 2009 වසරේදී සිවිල් යුද්ධය අවසානවී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත් විධිවිධාන භාවිතය අතිශයන්ම අවම වී තිබූ අවධියක මෙසේ සිදුවීම දැඩි කණස්සල්ලට හේතු විය. හිංසන වින්දිතයින් ස්මරණය කිරීමේ ජාත්‍යන්තර දිනයේදී, ජූනි මස 26 වන දින, ජනරජයේ ජනාධිපතිවරයාගේ සහභාගිත්වයෙන් " වධ හිංසනයට තිත" ව්‍යාපාරය දීප ව්‍යාප්තව දියත් කිරීමට හේතු පාදක වූයේ මෙකී කොමිෂන් සභා උද්වේගයයි.

සමාජයෙහි බහුවිධත්වය ධනාත්මකව පිළිගන්නාවූ ශක්තිමත් පශ්චාත්-යුද මානව හිමිකම් සංස්කෘතියක් නිර්මාණය කර ගැනීම ශ්‍රී ලංකාවේ ඒකායන අපේක්ෂාව වන්නේ නම්, නීතිය හා පිළිවෙත් යන දෙපාර්ශ්වයෙහිදීම වෙනස්ව සැළකීම කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම පිළිගනිමින්, ආන්තරික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය මත පියවර ගැනීමටද කොමිෂන් සභාව විසින් කටයුතු කෙරිණ. මේ කරුණු විෂයයෙහි ලා, සමාජභාවී සාධාරණත්වය, ආබාධිතයින්, ලිංග විෂයික සුළුතරයන්, වියපත් හා සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් වැනි තේමාවන් නියෝජනය කෙරෙන්නාවූ මානව අයිතිවාසිකම් හා සිවිල් සමාජ ක්‍රියාකාරීන් යන දෙපාර්ශ්වයෙන්ම සමන්විත තේමාත්මක අනු කාරක සභා කමිටු ස්ථාපනය කෙරිණ.

රාජ්‍ය කටයුතු වලට උපදේශනාත්මකව මැදිහත්වීමේ ස්වකීය කාර්ය භාරය ප්‍රමුඛතාගත කළ යුතුය යන නව කොමසාරිස්වරුන්ගේ චින්තනය මත පිහිටා, වර්ෂය තුළදී, ප්‍රමුඛතම ප්‍රතිපත්තිමය නිර්දේශයන් කිහිපයක්ම ඉදිරිපත් කරන ලදී. මරණීය දණ්ඩනය අහෝසි කළ යුතු යැයි ජනවාරි මස 01 වන දින රජය වෙත ඉල්ලීමක් කිරීම මෙම ව්‍යායාමය දියත් කිරීමේ මූලාරම්භය විය. අනෙකුත් ප්‍රධානතම උපදේශක නිර්දේශ මාලාවට, ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් නීතියට විෂයය වන අයිතිවාසිකම් ලෙස නීතිගත කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරෙන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන් සඳහා වූ යෝජනා මාලාවක්ද අන්තර්ගත විය. ඉදිරියේදී සම්පාදනය කරනු ලබන ව්‍යවස්ථාවක අන්තර්ගත කිරීම පිණිස, ව්‍යවස්ථාවේ ආධිපත්‍යය සහ බලය බෙදීම ඇතුළු මූලික ව්‍යවස්ථාමය මූලධර්ම මාලාවක් ද යෝජනා කෙරිණ. ඒ හා සමානවම, දැනට සෙමින් ඉස්මතුවෙමින් පවතින සංක්‍රාන්තික සාධාරණත්ව රාජ්‍ය පාලන ක්‍රමය සම්බන්ධයෙන් සමාලෝචනය හා උපදේශ කෙරෙහි තීක්ෂණ අවධානය යොමු කිරීමද කොමිෂන් සභාව විසින් සිදු කෙරිණ.

කොමිෂන් සභාව විසින්, විශේෂයෙන්ම කලාපීය මට්ටමින් සිවිල් සමාජ හා සමග වඩාත් ශක්තිමත් සම්බන්ධතා අලුත් කර ගැනීමේ සහ පවත්වා ගැනීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කරලීමද මෙම වසර තුළදී කැපී පෙනිණ. ප්‍රජා උපදේශනය සහ පරිවර්තනය සඳහා අධි සම්භාව්‍යතාවයක් ගම් මට්ටමේ සිවිල් සමාජය සතුවන බවට කොමිෂන් සභාව විසින් දරනු ලබන දැඩි පරිකල්පනය මත පිහිටා, උපදේශනය සහ සහයෝගිත්වය උදෙසා වසර තුළදී ප්‍රාදේශීය සිවිල් සමාජ කමිටු ස්ථාපිත කිරීමට කොමිෂන් සභාවේ සෑම ප්‍රාදේශීය කාර්යාලයක් විසින්ම පියවර ගන්නා ලදී.

එයට සමගාමීව, ආයතනික සංවර්ධනයෙහි නිමග්නවීමේ ප්‍රමුඛතම පරිශ්‍රමයක්ද දියත් කෙරිණ. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්, ක්‍රියාදාමයන් (විශේෂයෙන්ම විමර්ශන සහ පරීක්ෂණ) විධිමත් කිරීම, තොරතුරු තාක්ෂණ භාවිතය දිරිමත් කිරීම සහ කාලයක් තිස්සේ නොවිසඳී පවත්නා, විශේෂයෙන්ම බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියක් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාදාමය ආරම්භ කිරීම වැනි කාර්ය මණ්ඩල දුක්ගැනවිලි කෙරෙහි අවධානය යොමු කිරීම වැනි විෂයයන් මෙයට ඇතුළත් විය. ප්‍රධාන වශයෙන්, කල් ඉකුත්වූ රාජ්‍ය පරිපාලන හා මුදල් රෙගුලාසි වැනි බාධක ගණනාවකට මුහුණ දීමට සිදුවිය. කෙසේවතුදු, දේශපාලනමය මැදිහත්වීම් වලින් තොර නිදහස් හා ස්වෛරී පරිසරයක ස්වකීය කටයුතුවල යෙදීමට කොමිෂන් සභාව පොහොසත් විය.

එක්සත් ජාතින්ගේ මහලේකම් බැන් කී මූන්ගේ සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් සෙයිඩ් බින්රා'ඩ් ගේ ප්‍රශංසා වලින් කාර්ය බහුල සහ ඵලදායී වසර වර්ණවත් විය. කොමිෂන් සභාවේ ප්‍රයත්නයන් ධනාත්මකව පිළිගන්නා ලදැයි යන හැඟීම සතුට දනවයි. අපගේ ප්‍රයත්නයන් අර්ථවත් කිරීම පිණිස බහුතරයක් විසින් දක්වන ලද නොකැළැල් සහයෝගය ගැන, කොමිෂන් සභාව වෙනුවෙන් අපගේ උණුසුම් කෘතවේදීත්වය සටහන් කර තැබීමද මාගේ අපේක්ෂාවයි.

**ආචාර්ය නෙළුම් දීපිකා උඩගම**
**සභාපතිනී**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

# පටුන


| | | |
|---|---|---|
| අ. | කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය | 3 |
| ආ. | සභාපතිතුමියගේ පණිවුඩය | 4 |
| ඇ. | පටුන | 7 |
| කෙටි යෙදුම් ලේඛනය | | 9 |
| **1 වන පරිච්ඡේදය** | **: කොමිෂන් සභාව** | **11** |
| 1.1. | කොමිෂන් සභාවේ දළ විශ්ලේෂණය | 11 |
| | 1.1.1. දැක්ම | |
| | 1.1.2. මෙහෙවර | 11 |
| | 1.1.3. හර පද්ධතිය | 12 |
| | 1.1.4. කොමිෂන් සභා ලාංඡනය | 12 |
| 1.2 | පැවරුම් භාරයේ ස්වභාවය සහ විෂය පථය | 12 |
| 1.3. | සංවිධාන ව්‍යුහය | 14 |
| **2 වන පරිච්ඡේදය** | **: සමාලෝචිත වර්ෂය** | **17** |
| 2.1. | ප්‍රමුඛතම මස්තකප්‍රාප්තීන් | 17 |
| | 2.1.1. විමර්ශන හා පරීක්ෂණ | 18 |
| | 2.1.2. බාහිර විහිදුම් වැඩසටහන් | 18 |
| | 2.1.3. සංවිධානීය කාර්ය සම්පාදනයන් | 19 |
| | 2.1.4. උපායමාර්ගික සැලැස්ම | 20 |
| 2.2. | රජය වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ | 20 |
| 2.3. | ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් සඳහා වූ වෙනත් පක්ෂපාත ක්‍රියාමාර්ග | 25 |
| 2.4. | එක්සත් ජාතීන්ගේ සාම හමුදාවල සේවයේ යෙදවීමට නියමිත ශ්‍රී ලංකා යුද හමුදා පිරිස් නිෂේධනය | 25 |
| 2.5. | අභියෝග | 26 |
| **3 වන පරිච්ඡේදය** | **: පරීක්ෂණ හා විමර්ශන** | **27** |
| 3.1. | දළ විශ්ලේෂණය | 27 |
| 3.2. | අයිතිවාසිකම් අනුව ගොනුකරන ලද ඒකභාවී පැමිණිලි නියැදි | 32 |
| | 3.2.1. සමානාත්මතාවය සහ නොවෙනස්ව සැළකීම | 32 |
| | 3.2.2. අත්අඩංගුවේදී ප්‍රචණ්ඩත්වය | 35 |
| 3.3. | ස්වයං-මෙහෙයවීමෙන් කෙරෙන පරීක්ෂණ | 36 |

**4 වන පරිච්ඡේදය : පර්යේෂණ හා අධීක්ෂණ කටයුතු** **39**

4.1. තේමාත්මක අනු කාරකසභා 39

4.2. දියත් කරන ලද අධ්‍යයන 40

4.3. මෙහෙයුම් පාලන ක්‍රියාකාරකම් 41

**5 වන පරිච්ඡේදය: අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්** **45**

5.1. ජනතා දැනුවත්බව ඉහළ නැංවීම 45

5.2. මාධ්‍ය හා නිමග්නවීම 49

5.3. සිවිල් සමාජ හා නිමග්නවීම 50

5.4. උපදේශනය 51

**6 වන පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගිතාවය** **53**

6.1. ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම් වලට අනුගතවීම් ප්‍රවර්ධනය 53

6.2. ආසියානු ශාන්තිකර සංසදය සමග සබඳතා ශක්තිමත් කිරීම 56

6.3. ජාත්‍යන්තර සංවිධාන වලට වාර්තා සහ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම 56

6.4. ජාත්‍යන්තර සංවිධාන සහ විශේෂඥයින් සමග වෙනත් සහයෝගිතා 56

**7 වන පරිච්ඡේදය: ප්‍රාදේශීය හා උප කාර්යාල** **59**

7.1. දළ විශ්ලේෂණය 59

7.2. අවශ්‍ය කටයුතු කළ පැමිණිලි 60

7.3. අධීක්ෂණ ක්‍රියාකාරකම් 62

7.4. අධ්‍යාපන හා විහිදුම් ක්‍රියාකාරකම් 63

**8 වන පරිච්ඡේදය : පරිපාලන හා මුදල්** **65**

8.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 65

8.2. සේවා නියුක්ති ප්‍රතිලාභ 67

8.3. සේවා නියුක්තිය හා පුරප්පාඩු 67

8.4. වාර්ෂික මුල්‍ය ප්‍රකාශන 67

**පරිශිෂ්ඨ** **71**

පරිශිෂ්ඨ 1 : ශ්‍රී ලංකා සිතියම : ශ්‍රීලංමාහිකොස පිහිටීම 71

පරිශිෂ්ඨ 2 : නිර්දේශ ලැයිස්තුව 72

පරිශිෂ්ඨ 3 : ආරම්භ කරන ලද ස්වයං-මෙහෙයුම් පරීක්ෂණ 73

පරිශිෂ්ය 4 : 2016 වසරේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමිය හා කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද රැස්වීම්/ වැඩසටහන්/වැඩමුළු ලැයිස්තුව 74

පරිශිෂ්ය 5 : එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්ගේ 2016 මාර්තු මස 08 දින දරන ලිපිය 79

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| **ඒඩ්ස්** | - | පරිචිත ප්‍රතිශක්ති ඌණතා සහසාධකය |
| **ඒපීඑෆ්** | - | ආසියානු ශාන්තිකර සංසදය |
| **බීඑම්අයිසීඑච්** | - | බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| **සීඊඩීඒඩබ්** | - | කාන්තාවන්ට එරහිව සියළුම වෙනස්ව සැළකීම් පිටුදැකීමේ සම්මුතිය |
| **එච්අයිවී** | - | මානව ප්‍රතිශක්තිකරණ ඌනතා වෛරසය |
| **එච්ආර්සීඑස්එල්** | - | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| **අයිඩීපී** | - | අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින් |
| **අයිටී** | - | තොරතුරු තාක්ෂණය |
| **එල්ජීබීටීඅයික්‍යු** | - | සමකාමි, සමලිංගික, ද්විලිංගික, අන්තර් ලිංගික සහ විමසුම් |
| **එන්එච්අයිආර්එස්** | - | ජාතික මානව හිමිකම් ආයතන |
| **ඕඑච්සීඑච්ආර්** | - | මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කාමසාරිස් කාර්යාලය |
| **පීටීඒ** | - | ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත |
| **යූඑන්** | - | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| **යූඑන්ඩීපී** | - | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| **යූඑන්එච්සීආර්** | - | සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් |

**1 වන පරිච්ඡේදය :**

# කොමිෂන් සභාව

1.1. උපාය මාර්ගික දළ විශ්ලේෂණය
 1.1.1. දැක්ම
 1.1.2. මෙහෙවර
 1.1.3. හර පද්ධතිය
 1.1.4. කොමිෂන් සභා ලාංඡනය
1.2. වගකීම් භාරයේ ස්වාභාවය සහ විෂය පථය
1.3. සංවිධාන ව්‍යුහය

# 01 කොමිෂන් සභාව

## 1.1 කොමිෂන් සභා දළ විශ්ලේෂණය

### 1.1.1 දැක්ම

සැමගේ මානව අයිතිවාසිකම් සහතිකවීම සහ නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය සහ සුරැකීම

### 1.1.2 මෙහෙවර

සැමගේ මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය උදෙසා ක්‍රියා කරන්නාවූ සියළුම පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය සහ සහයෝගය ඇතිව, ශ්‍රී ලාංකික පුරවැසියන් උදෙසා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් කෙරෙහි විශේෂ අවධාරණයක් සහිතවූ ගෝලීය වශයෙන් පිළිගත් මානව අයිතිවාසිකම් සම්මත සහ මූලධර්ම වලට අනුගත වෙමින්, නීති, ප්‍රතිපත්ති සහ පිළිවෙත් මගින් සැම වෙනුවෙන් මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම ඔස්සේ, ශ්‍රී ලංකාවෙහි වඩාත් හොඳ මානව අයිතිවාසිකම් සංස්කෘතියක් එළිදැක්වීම.

### 1.1.3 හර පද්ධතිය

- මානව අභිමානයට ගරු කිරීම
- බහුවිධත්වයට ගරු කිරීම
- සමානාත්මතාවය සහ නොවෙනස්ව සැළකීම
- සාමය, සත්‍යය සහ සාධාරණත්වය
- ස්වාධීනත්වය
- වගවීම
- සේවය
- මනුෂ්‍යත්වය
- සාධුගුණය
- පාරදෘශ්‍යතාවය

### 1.1.4 කොමිෂන් සභා ලාංඡනය

ජාතික මට්ටමින් මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය උදෙසා ජාතික මානව හිමිකම් ආයතනවල වගකීම කොමිෂන් සභා ලාංඡනයෙන් පිළිබිඹු වෙයි. තිල්පැහැයෙන් හුවා දැක්වෙන්නේ මිනිස් සංහතියේ ජීවගුණය සහ නිර්මාණශීලී භාවයයි. දෙඅතින් දක්වනු ලබන්නේ ආරක්ෂාව සහ ආරක්ෂාව සැපයීම සඳහා ක්‍රියා කිරීමයි. පෘථිවිගෝලය කියා පාන්නේ මානව අයිතිවාසිකම් වල පොදු විශ්ව භාවිතය සහ ජාත්‍යන්තර මට්ටමින් සැලසෙන්නාවූ ආරක්ෂාවයි. ශ්‍රී ලංකා සිතියම හුවා දක්වන්නේ මානව හිමිකම් ජාතික මට්ටමින් ආරක්ෂා කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවයයි. ස්ත්‍රියකගේ. පුරුෂයෙකුගේ සහ දරුවෙකුගේ රූප සටහන් වලින් පිළිබිඹු වන්නේ සැම වෙනුවෙන් මානව හිමිකම් සුරැකීම සමානව සලසා දිය යුතු බවයි.

## 1.2 පැවරුම්භාරයේ ස්වාභාවය සහ විෂයය පථය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (එච්ආර්සීඑස්එල්) වූ කළී, දිවයිනෙහි මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව උදෙසා ස්ථාපිත ස්වාධීන කොමිෂන් සභාවකි. ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් මත ශ්‍රී ලංකාවේ වගකීම් භාරය ගැනද සවිඥානකව කටයුතු කරන්නාවූ කොමිෂන් සභාව, අප රට මෙකී වගකීම් නොපිරිහෙළා ඉටු කරන බව සහතිකවීම පිණිස මහත් පරිශ්‍රමයක නියැලී සිටී.

කොමිෂන් සභාව 1996 දී ස්ථාපනය කරන ලද්දේ 1996 අංකː 21දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත (මින් මතු පනත යැයි කියැවෙන) යටතේය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නෛතික පදනම සහ මෙහෙයුම් මූලධර්මයන් පනතේ දැක්වේ. එය ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ උපලේඛණගත කොමිෂන් සභාවක් වුවද, එය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සම්ප්‍රදායිකව ස්ථාපනය කරන ලද්දක් නොවේ. එහි සභාපතිනිය සහ මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලබන්නේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසිනි. කොමිෂන් සභාව වගකිවයුතු වන්නේ පාර්ලිමේන්තුවටය.

මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම්වලට අදාලව කොමිෂන් සභාවේ අධිකරණ පාත්‍රතාවය පනතේ පිළිගෙන ඇත. මූලික අයිතිවාසිකම් යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ තහවුරු කර ඇති ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් මෙන්ම යම් යම් සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම්ය. මානව අයිතිවාසිකම් වූ කළී, “සිවිල් හා දේශපාලනමය අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය මගින් ප්‍රකාශ කොට පිළිගෙන ඇත්තාවූ අයිතිවාසිකම් ” ලෙස පනතෙහි විග්‍රහ කර ඇති අතර, ඒ අනුව ජාතික ප්‍රමිතීන් ජාත්‍යන්තර නීතිය හා සැසඳෙන බවව සහතිකවීමට කොමිෂන් සභාවට බලය පැවරේ.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ( පනතේ 10 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි) වන්නේ :

- මූලික අයිතිවාසිකම්වලට අදාළව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින්, සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීමට අදාල කාර්ය පරිපාටි සම්බන්ධයෙන් වන පැමිණිලි විභාගකිරීම සහ විමර්ෂණය කිරීම;

- මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වන පැමිණිලි විභාග කිරීම සහ විමර්ෂණය කිරීම;
- මූලික අයිතිවාසිකම් වැඩි දියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය හා පරිපාලනමය විධාන හා කාර්ය පරිපාටි සකස් කිරීමෙහි ලා රජයට උපදෙස් දීම සහ සහාය වීම;
- ජාතික නීති සහ පරිපාලන පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වලට, නියමයන්ට හා සම්මුතිවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ ගිවිසුම්වලට හා වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායකවීමේ හා එකඟවීමේ අවශ්‍යතාවය පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම;
- මානව අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් වීම් ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය සැලසීම

ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමෙහි ලා, ( පනතේ 11 වන පරිච්ඡේදයෙහි දක්වා ඇති පරිදි)


- මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනයක් හෝ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට;
- කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි කොමිෂන් සභා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව අදහස් කරනු ලබන පළාත් සහා මට්ටමේ උපකමිටු යම් සංඛ්‍යාවක් පත් කිරීමට;
- යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනය වෙමින් පවත්නා මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකට හෝ අත්‍යාසන්න උල්ලංඝනයකට හෝ අදාළ යම් නඩු කටයුත්තකට එකී අධිකරණයෙහි අවසරය ඇතිව මැදිහත්වීමට;
- අධිකරණමය ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ රඳවා ගෙන සිටින තැනැත්තන්ගේ සුභ සිද්ධිය, ඔවුන් රඳවා ගෙන සිටින ස්ථාන නිරතුරුවම පරීක්ෂා කිරීමෙන් සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවා ගෙන සිටීමේ තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීමට;
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගතයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි පියවර ගැනීමට;
- මානව අයිතිවාසිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පවැත්වීමෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ එකී පර්යේෂණවල ප්‍රතිඵල ප්‍රචාරණය කිරීම සහ බෙදා හැරීමට;
- අතෘප්තියට පත් තැනැත්තෙකු හෝ අතෘප්තියට පත් තැනැත්තෙකු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමේදී, ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් පියවීම පිණිස අවශ්‍ය මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීමට; සහ
- කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නාවූ හෝ හිතකර වන්නාවූ වෙනත් සියළු දේ කිරීමට:

කොමිෂන් සභාවට බලය ඇත්තේය.

## 1.3 සංවිධාන ව්‍යුහය

154 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සහිත කොමිෂන් සභාව, අංශ 4 කින්, එනම්; පරීක්ෂණ හා විමර්ශන, අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්, පර්යේෂණ හා මෙහෙයුම් අධීක්ෂණ සහ පාලන හා මුදල් යන අංශ වලින් සමන්විතය. අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ හැකියාව ලත් වහාම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අංශයක්ද ස්ථාපිත කෙරෙනු ඇත. මෙයට අමතරව, ප්‍රාදේශීය කාර්යාල 10ක් (අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව,යාපනය,කල්මුණේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය සහ වවුනියාව) සහ, උප කාර්යාල 06ක් (කිලිනොච්චි, මන්නාරම, මුලතිව්, නුවරඑළිය, පොලොන්නරුව සහ පුත්තලම) හරහා කොමිෂන් සභාවේ කටයුතු ක්‍රියාත්මක වේ (පරිශිෂ්ඨ: 1 බලන්න). එකී සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකු යටතේ සහ එක් එක් ප්‍රාදේශීය කාර්යාල ප්‍රාදේශීය සම්බන්ධීකාරකයෙකු යටතේ ක්‍රියාත්මක වේ. සභාපතිනිය සහ/හෝ කොමසාරිස්වරයෙකු/ කොමසාරිස්වරු එකී අංශය සහ ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණයෙහි යෙදෙති.

# සංවිධාන ව්‍යුහය


සභාපතිනි
කොමසාරිස්වරු
ලේකම්
අතිරේක ලේකම්
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ පරීක්ෂණ හා විමර්ශන
අධ්‍යක්ෂ අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්
අධ්‍යක්ෂ පර්යේෂණ හා අධීක්ෂණ
අධ්‍යක්ෂ පරිපාලන හා මුල්‍ය
අධ්‍යක්ෂ ජාත්‍යන්තර සබඳතා
නි. අධ්‍යක්ෂ
නි. අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි
නි. අධ්‍යක්ෂ
නීති නිලධාරීන්
විමර්ශණ නිලධාරීන්
නීති නිලධාරි
විමර්ශණ නිලධාරි
නීති නිලධාරි
ගණකාධිකාරි
පද්ධති පරිපාලක
පරිපාලන නිලධාරි
පුස්තකාල හා ප්‍රලේඛණ නිලධාරි
අධ්‍යාපන නිලධාරි
පර්යේෂණ නිලධාරි
කළ.සහකාරවරුන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළ.සහකාරවරුන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළ.සහකාරවරුන් සහ රියදුරු, කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළ.සහකාරවරුන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලය
කළ.සහකාරවරුන් සහ රියදුරු, කණිෂ්ඨ කාර්ය මණ්ඩලය

# 2 වන පරිච්ඡේදය :

# සමාලෝචිත වර්ෂය

**2.1. ප්‍රමුඛතම මස්තකප්‍රාප්තීන්**

2.1.1. විමර්ශන හා පරීක්ෂණ

2.1.2. විහිදුම් වැඩසටහන්

2.1.3. සංවිධානීය කාර්ය සම්පාදනයන්

2.1.4. උපායමාර්ගික සැලැස්ම

**2.2. රජය වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ**

**2.3. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් සඳහා වූ වෙනත් උපදේශනයන්**

**2.4. එක්සත් ජාතීන්ගේ සාම හමුදාවල සේවයට නම් කරන ලද ශ්‍රී ලංකා යුදහමුදා පිරිස් නිෂේධනය**

**2.5. අභියෝග**

# 02 සමාලෝචිත වර්ෂය

## 2.1 ප්‍රමුඛතම මස්තකප්‍රාප්තීන්

2016 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් මුදුන් පමුණුවා ගන්නාලද ඇතැම් කාර්යයන් කිහිපයක සාරාංශයක් මෙම ඡේදයෙහි දැක්වෙයි. මෙහි දක්වා ඇති ක්‍රියාකාරකම්වල වැඩිමනත් විස්තර තදනන්තර ඡේදවල මෙන්ම පරිශිෂ්ඨයන්හිද දක්වා ඇත.

### 2.1.1 විමර්ශන සහ පරීක්ෂණ

2016 වසරේදී, ස්වකීය ඒකභාවී පැමිණිලි යාන්ත්‍රණය මෙන්ම ස්වයංකාරක ක්‍රියාදාමයන් ඔස්සේ විශාල පිරිසකට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය. විමර්ශන හා පරීක්ෂණ ක්‍රියාදාමය විධිමත් කිරීමට ක්‍රමවේදයන් හඳුන්වා දෙන ලද අතර, ප්‍රතිසංස්කරණයන් සුසාධ්‍යකරණය උදෙසා කාර්ය මණ්ඩල පුහුණුව ලබාදීම කෙරෙහි අවධානය යොමු කෙරිණ. ස්වකීය පැවරුම් කාර්ය භාරය යටතේ නොගැණෙන දුක් ගැනවිලි සහිත පුද්ගලයින්, එවන් පැමිණිලි සම්බන්ධයෙන් වඩාත් යෝග්‍ය ලෙස ක්‍රියා කළහැකි ආයතන වෙත යොමු කිරීමේ සක්‍රීය යොමු කිරීම් යාන්ත්‍රණයක්ද කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කෙරිණ. විශේෂඥ කාර්ය භාරයක් පැවරී ඇති, ඔම්බුඩ්ස්මන් කාර්යාලය වැනි වෙනත් සහන සැලසුම් යාන්ත්‍රණයන් ගැන ප්‍රමාණවත් ලෙස දැනුවත්වී නොමැති මහජනයා, විවිධාකාරවූ සියළුම පැමිණිලි කොමිෂන් සභාව වෙත යොමු කරන බව පෙනී යන ලදී.

මානව අයිතිවාසිකම් උල්ලංඝනයට අදාල නිර්දේශ ක්‍රියත්මක කරන ලෙස විධානය කරමින් අදාල බලධාරීන්ට නිර්දේශ නිකුත් කිරීමට කොමිෂන් සභවට පැවරී ඇති පැවරුම් භාරය නොතකා, සමථකරණය හා සමාදානය හරහා ආරාවුල් සමථයට පත්කරලීම සුසාධ්‍යකරණය කිරීම් වස් නිරන්තරයෙන් ප්‍රයත්න දැරීමට කොමිෂන් සභාව ඉදිරිපත් වූ අතර, ඒ ඒ ආරාවුල් සමථයට පත් කර ගැනීමේ කඩිනම් හා හුදෙක් චාරිත්‍රානුකූල නොවූ ක්‍රමවේදයක් මෙමගින් සැලසිණ. 2014 වසරට පෙර නොනිමිව පැවැති පැමිණිලි විශාල සංඛ්‍යාවක් නිරාකරණය කර ගැනීම සඳහා පමාගොනු නිෂ්කාශන ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක විය.

2016 වසරේදී, පැමිණිලි 9171 ක් ගොනු කරන ලද අතර, එය 2015 ට වඩා 425 ක වැඩිවීමකි. 2016 වසරේදී පැමිණිලි 4739 ක කටයුතු නිම කරන ලදී. පැමිණිලි 727 කට සහනය ලබා දෙන ලද අතර, පැමිණිලි 803 ක් අයිතිවාසිකම් උල්ලංඝනයකට තුඩු දෙන ගණයේ පැමිණිලි නොවන බව හඳුණා ගන්නා ලදී. පැමිණිලි 408 ක් කොමිෂන් සභාවේ පැවරුම් කාර්යභාරය යටතේ නොගැණෙන බවද හඳුනා ගැණින. කරුණු 1162 ක් සම්බන්ධයෙන් සාර්ථක ලෙස සමථකරණයෙහි යෙදීමට හැකි වූ අතර, පැමිණිලි 127 ක් යෝග්‍ය පරිදි ක්‍රියා කිරීම පිණිස වෙනත් බලධාරීන් වෙත යොමු කෙරිණ. 2016 වර්ෂයදී කොමිෂන් සභාවෙහි ගොනු කරන ලද ඒකභාවී පැමිණිලිවලට ප්‍රතිචාරය ලෙස නිර්දේශ 44 ක් නිකුත් කරන ලද අතර, විවිධාකාර ප්‍රභේදයන්හි ගැටළු සම්බන්ධයෙන් ස්වයංකාරක පරීක්ෂණ 17 ක් දියත් කරන ලදී.

## 2.1.2 බාහිර විහිදුම් වැඩසටහන්

මානව අයිතිවාසිකම් ගැටළු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත්වීම ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපනය ලබාදීම පිණිස කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේදී බාහිර විහිදුම් වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. මෙකී වැඩ සටහන්වලට, අධ්‍යයන, දේශණ, ජංගම සායන, වැඩමුළු, ජනතා පා ගමන් මෙන්ම මාධ්‍ය ව්‍යාපාරද ඇතුළත් විය.

2016 වසරේදී කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද වඩාත් කැපී පෙනෙන සුළු වැඩ සටහන වූයේ හිංසන වින්දිතයින් සැමරීමේ ජාත්‍යන්තර දිනය වන ජූනි මස 26 වන දින, දියත් කරන ලද **'වධහිංසනයට තිත'** වැඩසටහනයි. කොමිෂන් සභාව විසින් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල



ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුමේදී ස්ටිකර ඇලවීමේ වැඩසටහන දියත් කිරීම

දහය හරහා දිවයින පුරා විවිධ ජනතා වැඩසටහන් පවත්වන ලදී. සිවිල් සමාජ, පාසල් දරු දැරියන්, තරුණ කණ්ඩායම්, ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ සහභාගිත්වයෙන් අගනුවර පා ගමනක් සංවිධානය කිරීමට ප්‍රධාන කාර්යාලය විසින් පියවර ගන්නා ලදී. මෙහිදී රාජ්‍ය සහයෝගය දක්වමින් අතිගරු ජනාධිපතිතුමන් සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමන්ද මෙම පා ගමනට සහභාගී වූ බව විශේෂයෙන් සඳහන් කළ මනාය.

අනෙකුත් වැදගත් බාහිර විහිදුම් වැඩසටහන් වලට, ස්ටිකර් ව්‍යාපාර, ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් කෙටි වීඩියෝ තරග, ස්වකීය අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරලීම පිණිස මානව හිමිකම් වලට අදාළ වැදගත් පණිවුඩ රැගත් ඩිජිටල් සංඥා පුවරු කොළඹ පුරවරය පුරා ඉදි කිරීම සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙහි සිංහල හා දමිළ ගුවන් විදුලි නාලිකාවල 'මානව අයිතිවාසිකම් පිළිබඳ කෙටි උද්ධෘත පාඨ' විකාශනය ඇතුළත් විය.

ජාත්‍යන්තරව පිළිගත් යහපිළිවෙත් අනුව, ආබාධ සහිත පුද්ගලයින් පොදු ස්ථාන කරා ප්‍රවේශවීම කෙරෙහි අවධානය යොමු කිරීම සහ අධීක්ෂණය උදෙසා ස්වකීය ආයතනික ධාරිතාවය ගොඩනගා ගැනීම පිණිස, ඕස්ට්‍රේලියානු මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව හා සමග අවබෝධතා ගිවිසුමකට එළඹීමටද කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. ආබාධිතත්ව ප්‍රවේශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අදාල පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කිරීමද ආරම්භ කෙරිණ.

## 2.1.3. සංවිධානීය කාර්ය සම්පාදනයන්

2015 පශ්චිම භාගයේදී වත්මන් කොමිෂන් සභාවේ කාර්යාවලිය ආරම්භවීමෙන් පසු, කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්යක්ෂමභාවය සහ ප්‍රතිචාර දැක්වීමෙහි ගුණාත්මකභාවය වර්ධනය

කරගැනීම උදෙසා සංවිධානීය කාර්ය සම්පාදන ක්‍රියාදාම ගණනාවක නියැලීම 2016 වර්ෂය තුළ සිදුවිය. එකී භාවාර්ථයෙහි පිහිටා, කොමිෂන් සභාවෙහි කාර්ය භාරය සැළසුම් කිරීම සහ ප්‍රමුඛතාගත කිරීම පිණිස, ආසියා ශාන්තිකර සංසදයේ (ඒපීඑෆ්) සහාය ඇතිව, 2016 ජනවාරි මාසයේදී ඉහළ මට්ටමේ සංවාදයක් පැවැත්විණ. ඒ හා සමගම, කොමිෂන් සභාවේ ආයතනික යාන්ත්‍රණය ශක්තිමත් කිරීම පිණිස කොමිෂන් සභා කාර්ය මණ්ඩලීය ධාරිතා සංවර්ධන ප්‍රතිපත්තිය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ කොමිෂන් සභා ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.

උද්වේගකාරී මානව අයිතිවාසිකම් ගැටළු සම්බන්ධයෙන් හඬ නැගීම සහ නිරාකරණය සහ ඉදිරි කටයුතු සඳහා මෙකී ගැටළු අදාල රාජ්‍ය බලධාරීන්ට යොමු කිරීමේ සංසදයක් සිවිල් සමාජයට තනාදීමේ අරමුණින්, රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක් සහ සිවිල් සමාජ සංවිධානවල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක් ස්වකීය ප්‍රාදේශීය කාර්යාල තුළ ස්ථාපනය කිරීමට ප්‍රාදේශීය කාර්යාල දහයම මෙහෙයවන ලදී. ප්‍රාදේශීය කලාපයන්හි පවත්නා, කොමිෂන් සභාවට අදාලවූ ගැටළු ඉස්මතු කරවා, ඵලදායී ලෙස මෙකී ගැටළු කෙරෙහි ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව කොමිෂන් සභාවට සලසා දීම මෙමගින් සාර්ථකව ඉටුකර ගන්නා ලදී.

### 2.1.4. උපායමාර්ගික සැලසුම

2017-2019 කොමිෂන් සභා උපාය මාර්ගික සැලසුමෙහි සාරගර්භය සකසන්නාවූ උපායමාර්ගික නාභිගත ප්‍රදේශ හඳුණාගැනීමේ අරමුණින්, කොමිෂන් සභාව විසින් විවිධ පාර්ශ්වකරුවන් හා සමග රැස්වීම් සහ උපදේශනමාලා පවත්වන ලදී. උපායමාර්ගික සැලසුම්කරණය සම්බන්ධයෙන් ජ්‍යෂ්ඨ කළමණාකාරිත්වය උදෙසා වැඩමුළුවක් පවත්වන ලද අතර, උපායමාර්ගික සැලසුමෙහි අන්තර්ගත කළ යුතු කොමිෂන් සභා අනාගත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදහස් සහ චින්තනයන් විමසා බැලීම පිණිස ස්වකීය කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්, සෑම පළාතකම රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජ සංවිධාන මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයින්ද සමග උපදේශන ගණනාවක්ම පවත්වන ලදී. තවද, අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් සහ පුරවැසියන්ගෙන් කොමිෂන් සභා වෙබ් අඩවිය හරහා ඉල්ලා සිටින ලදී. උපායමාර්ගික සැලසුම් සම්පාදනය 2016 සැප්තැම්බර් මාසයේදී නිම කරන ලද අතර, 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම කොමිෂන් සභා ක්‍රියාදාමයට ආසියා ශාන්තිකර සංසදයේ (ඒපීඑෆ්) සහාය ලැබිණ.

## 2.2. රජය වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ

පනතේ 10(ඇ) සහ 10 (ඈ) ඡේද අනුව, මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ නීතිමය හා පරිපාලනමය විධිවිධාන හා කාර්ය පරිපාටි සකස් කිරීමෙහි ලා රජයට උපදෙස් දීම සහ සහාය වීම මෙන්ම ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වල නියමයන්ට හා සම්මතවලට අනුකූළ බව සහතික කිරීම පිණිස ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු කාර්යයන් වේ. 2016 වසරේදී, රජයට උපදෙස් දීමේ ස්වකීය භූමිකාව ප්‍රමුඛතාගත කිරීමට කොමිෂන් සභාව විසින් ප්‍රයත්න දරන ලදී. එකී වර්ෂය තුළදී, ස්වකීය මැදිහත්වීම අවශ්‍ය යැයි අදහස් කරන ලද මානව අයිතිවාසිකම් ගැටළු සම්බන්ධයෙන් නිර්දේශ ගණනාවක්ම රජය වෙත ඉදිරිපත් කෙරිණ.

- **ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන් සඳහා යෝජනා**

කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන් සඳහා වූ ස්වකීය යෝජනා ගරු අග්‍රාමාත්‍යතුමන්ට, ගරු කථානායකතුමන්ට සහ ව්‍යාවස්ථාමය ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුවට ඉදිරිපත් කරන ලදී. ඉදිරියේදී සකස් කරනු ලබන ව්‍යවස්ථාවකට නිත්‍ය අයිතිවාසිකම් පනත් කෙටුම්පතක් ඇතුළත් කිරීමේ නිර්දේශය සාදරයෙන් පිළිගන්නා ලද අතර, ප්‍රතිසංස්කරණ ක්‍රියදාමයෙහිදී සැළකිල්ලට ගතයුතු තීරණාත්මක වශයෙන් වැදගත් මානයන් ද්විත්වයකට, එනම්: බලතල වෙන්කරදීම සහ යහපත් සංවරණ හා තුලන ක්‍රමවේදයක් සහතික කිරීමකට සහ මහජන ආරක්ෂණ තන්ත්‍රය දැඩිව නියාමනය කිරීමකට අවධානය යොමු කරවන ලදී. මෙයට අමතරව, පදනම්ගත ව්‍යවස්ථාපිතමය මූලධර්ම, ශක්තිමත් අයිතිවාසිකම් පනත් කෙටුම්පතක්, ශක්තිමත් සංවරණ හා තුලන ක්‍රමවේදයක්, ගිවිසගත් කාලරාමුවක් තුළ බලය පැවරීමේ නීති මාලාවක් ඉදිරිපත් කිරීමේ වගකීමක් සහිතව ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ගිවිසුම් අපරානුමත කිරීමේ ක්‍රියාදාමයක්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (එච්ආර්සීඑස්එල්) ව්‍යවස්ථාමය වශයෙන් පිළිගැනීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයෙහි සහ ව්‍යවස්ථාමය පාලනය නීත්‍යානුකූල කිරීමෙහි ලා මූලික ප්‍රතිපත්තිමය වැදගත් කමකින් යුත් වාග්විද්‍යාමය ප්‍රවේශ්‍යතාවය සහතික කිරීම යන කරුණු අන්තර්ගත කිරීම කොමිෂන් සභාව විසින් යෝජනා කෙරිණ.

- **ශ්‍රී ලංකාවේ මරණීය දණ්ඩනය අහෝසි කිරීමේ නිර්දේශය**

මානව අයිතිවාසිකම් මූලධර්ම සහ සාරධර්ම වලට ගැලපෙන්නාවූ වඩාත් මානුෂීය සමාජයක් උදෙසා ශ්‍රී ලංකාවේ කැපවීමට අනුකූලව, ශ්‍රී ලංකාවේ මරණීය දණ්ඩනය අහෝසි කිරීම නිර්දේශ කෙරිණ. ජීවත්වීමේ අයිතිය සහ කෲර හා අමානුෂික දඬුවමකින් නිදහස්වීම ඇතුළු මානව අයිතිවාසිකම් ගණනාවක්ම බරපතල ලෙස උල්ලංඝණය කරන්නාවූද, අන්තවාදී සහ අප්‍රතිවර්ත්‍ය දඬුවමක් වන්නාවූද මරණීය දණ්ඩනය, අපරාධ වළක්වාලීමේ සාධකයක් වශයෙන් නිරර්ථක ක්‍රියාදාමයක් බවට ගොඩ නැගෙමින් පවත්නා ගෝලීය පිළිගැනීම සැළකිල්ලට ගෙන, අහෝසි කිරීම සළකා බලන ලෙස කොමිෂන් සභාව විසින් රජයෙන් ආයාචනය කර සිටින ලදී.

තවද, කොමිෂන් සභාවේ මතය අනුව, මරණීය දණ්ඩනය කෲර, අමානුෂික හා නින්දා සහගත දඬුවමක් මෙන්ම, මනුෂ්‍ය ජීවිතයේ පූජනීයත්වය කෙළසීමක්ද වන බවත්, ජීවත්වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පැහැදිලිව ප්‍රකාශිතව නැත්තේ වී නමුදු, එය ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ගම්‍යව ඇති බවට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය නිගමනය කර ඇති බවත් නිර්දේශයේ වැඩිදුරටත් සඳහන් විය.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ දෙවන වරණීය ගිවිසුම අපරානුමත කොට, මරණීය දණ්ඩනය වහාම අහෝසි කිරීමට ශ්‍රී ලංකාව කටයතු කළ යුතු බව නිර්දේශ කරන අතරතුර, මරණීය දණ්ඩනය වෙනුවට එක් එක් අපරාධයේ බරපතළකමට ඔබින බන්ධනාගාරගත කිරීමේ කාලපරාසයක් ආදේශ කළ යුතු බවද නිර්දේශ කරන ලදී.

- **ඉදිරි ව්‍යවස්ථාමය පනත් කෙටුම්පත්වලට ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් අන්තර්ගත කිරීමේ අවශ්‍යතාවය**

ඉදිරි ව්‍යවස්ථාමය පනත් කෙටුම්පත්වලට ආර්ථික,සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් මුළුමණින්ම ආරක්ෂිත අයිතිවාසිකම් ලෙස අන්තර්ගත කිරීමේ අවශ්‍යතාවය ගැන කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කරන ලදී. අයිතිවාසිකම්වල අභේද්‍යත්ව මූලධර්මයන් උල්ලංඝනය කරමින්, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් අන්තර්ගත කිරීම වළක්වාලීමට යම් යම් පාර්ශ්වයන් විසින් දරන ලද ප්‍රයත්නයන් ගැන ස්වකීය දැඩි උද්වේගය ප්‍රකාශ කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කෙරිණ. අධ්‍යාපන අයිතිවාසිකම්, ප්‍රමාණවත් සෞඛ්‍ය ප්‍රමිතීන්, නිවාස, සහ සාධාරණ කම්කරු කොන්දේසි වැනි අයිතිවාසිකම්වලට ව්‍යවස්ථාමය ආරක්ෂාව ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සලසා දිය යුතු බවට බලකරමින් මහජන උපදේශන ක්‍රියාදාමයේදී මහජනතාව විසින් ව්‍යක්තව ප්‍රකාශ කරනලද අදහස් ව්‍යවස්ථා-සම්පාදන ක්‍රියාවලියේදී අවශ්‍යයෙන්ම පිළිගත යුත්තේය යන කාරණයට අවධානය යොමු කරවන ලදී. කොමිෂන් සභාව විසින් හුවා දක්වන ලද්දේ, එසේ කටයුතු කිරීමට අපොහොසත්වීමද, විශේෂයෙන්ම ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (1966) යටතේ, ශ්‍රී ලංකාව විසින් භාර ගෙන ඇති නෛතිකමය වගකීම් පැහැර හැරීමක් බවය. එය ශ්‍රී ලංකාවේ වැඩි දියුණු වෙමින් පවතින මානව අයිතිවාසිකම් වාර්තා කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරවිය හැකි අතර, ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙරෙහි තබා ඇති ජනතා විශ්වාසය බරපතල ලෙස පිරිහීමකට ලක්විය හැකි බවද තවදුරටත් සඳහන් කෙරිණ.

- **පෞද්ගලික ලිපිලේඛනවල ස්වකීය ලිංගභේදය වෙනස් කිරීමට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට හැකියාව සැලසීමේ නිර්දේශය**

කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයකට අනුගාමීව, ජාතික හැඳුණුම්පත වැනි පෞද්ගලික ලිපිලේඛණවල ස්වකීය ලිංගභේදය වෙනස් කිරීමට සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට හැකියාව සලසමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් නිකුත් කිරීම. සෞඛ්‍ය අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජෙනරල් දෙපාර්තමේන්තුව සහ සිවිල් සමාජ හා සමග පැවැති පුළුල් උපදේශනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීමේ සහතිකය මත පදනම්ව, උප්පැන්න සහතිකයෙහි ලිංග භේදය සහ නම වෙනස් කරන ලෙස දිවයිනේ සියළුම රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් දෙමින් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින්ද චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- **1979 අංක: 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (තාවකාලික විධිවිධාන) යටතේ අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම මත නියෝග**

කොමිෂන් සභාව විසින්, 1979 අංක: 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (තාවකාලික විධිවිධාන (පීටීඒ)) යටතේ අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් නියෝග නිකුත් කෙරිණ. අත්අඩංගුවට ගනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් වලට ගරු කෙරෙන බව හ ආරක්ෂා කෙරෙන බව සහ එවන් පුද්ගලයින්ට මානුෂික අන්දමින් සළකන බව සහතිකවීම පිණිස, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් අත්අඩංගුවට ගන්නා නිර්දිෂ්ටිත නිලධාරීන්ට මෙකී නියමයන් නිකුත් කරන ලදී.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සියුම්ව අර්ථකථනය කරමින්, භාවිතා කළ යුත්තේ අතිශයින් විශේෂිත අවස්ථාවලදී බවත්, සාමාන්‍ය අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා භාවිතා නොකළයුතු බවත්, මෙකී නියෝගවල නියම කර ඇත. මෙම නියෝග නිකුත් කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් පෙර රාජ්‍ය නායකයින් විසින් නිකුත් කරන ලද නියෝග සහ බන්ධක ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ නීති ප්‍රමිතීන් පදනම් කර ගනිමිනි.

- **1979 අංක: 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කර ඇති නියෝග පිළිගැනීම**

1979 අංක: 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කර ඇති නියෝග, කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත්කිරීම මගින් සාදරයෙන් පිළිගන්නා ලදී. මෙම කාරණයේදී, කොමිෂන් සභාවේ බලතල, කාර්ය භාරය සහ රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම සුසාධ්‍යකරණයෙහි ලා මෙම නියෝග ඉවහල්වී, අතිවිශේෂ නීති යටතේ අත්අඩංගුවට සහ රඳවා ගැනීම්වලට පාත්‍රවන පුද්ගලයින්ට සලසා ඇති ආරක්ෂාව එමගින් වඩාත් ප්‍රතිසාධනය වේයැයි කොමිෂන් සභාවේ විශ්වාසය විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා රජය ගත් තීරණයද සාදරයෙන් පිළිගත් කොමිෂන් සභාව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ආදේශ කිරීමට යෝජිත ජාතික සුරක්ෂිතතා නීතිය ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බවට සහතික වීමේ අවශ්‍යතාවයද අවධාරණය කර සිටින ලදී. කොමිෂන් සභාව විසින් තවදුරටත් සඳහන් කර සිටින ලද්දේ, හදිසි අවස්ථාවක් පවතින කාලවලදී මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිගැනීම ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිවලට පමණක් සීමාවූ දෙයක් නොවන අතර, එය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නීති දර්ශනයේද පවතින්නක් බවය. මෙම පසුබිම යටතේ, ත්‍රස්තවාදයට ප්‍රතිපක්ෂව කටයුතු කරනා'තුර මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධන කිරීමේ එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිතවරයා විසින් හඳුණා ගෙන ඇති යම් යම් මූලධර්මයන්, ත්‍රස්තවාදය විග්‍රහ කිරීම, රැඳවුම් නියෝග සම්බන්ධ අපක්ෂපාතී සමාලෝචනය, සාධාරණ විනිශ්චයකට ඇති අයිතිය, මරණීය දණ්ඩනය භාවිතයට නොගැනීම, ස්වාධීන නෛතික නියෝජනයකට ඇති ප්‍රවේශය ආදිය, ඉදිරි ජාතික ආරක්ෂා නීති මාලාවක පරිපූර්ණත්වයට අවශ්‍ය සාධක ලෙස, කොමිෂන් සභාව විසින්ද නිර්දේශ කරන ලදී.

- **නීතිය හා සාමය පිළිබඳ පාර්ලිමේන්තු අනු කාරක සභාව වෙත යොමු කළ යෝජනා**

නීතිය හා සාමය පිළිබඳ පාර්ලිමේන්තු අනු කාරක සභාව වෙත ස්වකීය යෝජනා ඉදිරිපත් කරමින්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පුන පුනා සඳහන් කරන ලද්දේ පොදු ආරක්ෂා පාලන තන්ත්‍රයක් අත්‍යාවශ්‍ය වන අතරම, එය ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් වගකීම්වලට අනුකූල විය යුතු බවයි. පොදු ආරක්ෂා පාලන තන්ත්‍රයක ප්‍රධානතම කාර්යය වන්නේ ජනතාව ආරක්ෂා කිරීම වන හෙයින්, එය සම්පාදනය විය යුත්තේ ජනතාවගේ උච්චතම යහපත සැලසෙන අන්දමින් විය යුතු බව විශ්වාස කළ කොමිෂන් සභාව, දකුණු අප්‍රිකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 198 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති ජාතික ආරක්ෂා පාලන මූලධර්ම කෙරෙහි අනුකාරක සභාවේ අවධානය යොමු කර සිටින ලදී.

මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ සකස් කරන ලද්දේ, මානව අයිතිවාසිකම් කමිටුවේ නීති දර්ශනය, හදිසි තත්ත්වයක් පවතින අවස්ථාවකදී මානව අයිතිවාසිකම් ධර්මතාවයන් පිළිබඳ පැරිස් අවම ප්‍රමිතීන් සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ, සීමා බන්ධන සහ අවඥාකිරීම් පිළිබඳ විධිවිධානවලට අදාළ සිරකුසා මූලධර්ම පදනම් කර ගනිමිනි. හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ යුතු වන තථ්‍ය හෝ අත්‍යාසන්න අර්බුදයකට හෝ පොදු අනතුරකට මුහුණ පා ඇති අසාමාන්‍ය අවස්ථාවක් වන 'ජාතියේ ජීවනයට තර්ජනයක් එල්ල වී ඇති' අවස්ථාවකදී පමණක් හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම සහ දීර්ඝකිරීම, හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව අධිකරණමය සමාලෝචනයක් සහතික කිරීමේ අවශ්‍යතාවය, හදිසි අවස්ථා රෙගුලාසි සහ නියෝග සම්බන්ධයෙන් කොමිෂන් සභා නිර්දේශයන් මගින් අවධාරණය කරන ලද අතර, හදිසි අවස්ථා කාල පරිච්ඡේදයක් තුළ අයිතිවාසිකම් අවඥාවට භාජනය වීමට අදාලව සම්පාදිත අයිතිවාසිකම් ප්‍රඥප්ති කෙටුම්පතෙහි(2009) සලසා ඇති විධිවිධාන කෙරෙහි අනුමැතිය පළ කර සිටින ලදී. මහජන ආරක්ෂාවට අදාල ව්‍යවස්ථාදායක පාලන තන්ත්‍රය පිළිසකර කිරීමේ කාර්යය උදෙසා වන මහජන ආරක්ෂාව පිළිබඳ ආඥාපනත සමාලෝචනයට භාජනය කිරීමද කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරිණ.

- **නීතිඥයෙකුගේ සහාය ලබා ගැනීමට සැකකරුවෙකුට ඇති අයිතිය සීමා කරමින් අපරාධ නඩු විධිවිධාන පරිපාටි සංග්‍රහ පනතේ යෝජිත සංශෝධන සම්බන්ධයෙන් උද්වේගය**

නීතිඥයෙකුගේ සහාය ලබා ගැනීමට සැකකරුවෙකුට ඇති අයිතිය සීමා කරමින් අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය සංශෝධනය කිරීම යෝජනා කරමින්, 2016 අගෝස්තු මස 12 වන දින ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙන් උද්වේගය පළ කරමින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ගරු අග්‍රාමාත්‍යතුමන් අමතා ලිපියක් යවන ලදී. (මෙය පසුව ප්‍රසිද්ධියට පත් කරන ලදී) යෝජිත සංශෝධනය ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, තමන්ගේ නීතිඥයින්ට ප්‍රවේශවීම සඳහා සැකකරුවන්ට ඇති අයිතිවාසිකම් පිළිගැනීම සහ වර්ධනය කිරීම අඛණ්ඩව පවත්වා ගෙනයන ලෙසත් මෙම ලිපිය මගින් ලංකාණ්ඩුවෙන් ඉල්ලා සිටින ලදී. තදන්තරව, යෝජිත සංශෝධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් සංවිධානය කරන සංවෘත රැස්වීමකට කොමිෂන් සභාවද සහභාගී විය.

- **අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**

අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල (ස්ථාපනය, පරිපාලනය හා කාර්ය භාරය ඉටු කිරීම) පනත අනුමත කිරීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් ඔස්සේ ප්‍රසාදය පළකර සිටින ලද අතර, මෙම කාර්යාලය ස්ථාපනය කිරීමෙහි ලා දැඩි සැළකිල්ලට ගතයුතු වැදගත් මූලිකාංගයන් ගණනාවකට අවධානය යොමු කරවන ලදී. ප්‍රමුඛතම මූලිකාංග කිහිපයක් නම්: අතුරුදහන්වූ තැනැත්තන්ගේ කාර්යාලය සම්බන්ධයෙන් පැතිර යන දූසමාන ආරංචි පහකරලීම සහ ජනතා සිත් සතන්හි ජනිත වෙමින් පවතින නොමග යවන සුළු සහ සාවද්‍ය තොරතුරුවලට ප්‍රතිපක්ෂවීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්වල අවශ්‍යතාවය; ශක්තිමත් ආයතනයක් ගොඩනගා, පරිණත, සුදුසුකම්ලත් හා ඇපකැපවූ කාර්ය මණ්ඩලයක සේවය ලබා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් මුල්‍ය සම්පත් ලබාදීම; අතුරුදහන්වූ තැනැත්තන්ගේ කාර්යාලයට ප්‍රවේශ්‍යතාවය සහ පොදු ජනතා අයිතිවාසිකම වැඩිදියුණු කරලීම පිණිස ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම; කාර්යාලීය සාමාජිකත්වයෙන් ශ්‍රී ලංකාවේ බහුත්වවාදි ස්වාභාවය පිළිබිඹු වීම;

සුචරිතවත් පුද්ගලයින් බඳවා ගැනීම සහ එසේ බඳවා ගන්නා ලද්දවුන්ට ප්‍රමාණවත් සහ අඛණ්ඩ පුහුණුව ලබාදීම; කාර්යාලයෙන් ස්ථානීය-මානසික-සාමාජීය සහාය අපේක්ෂා කරන්නවුන්ට සහායවීම පිණිස අවශ්‍ය පිරිස් සිටීම; අනභිමුඛ සහතිකය සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම්, ප්‍රායෝගික වින්දිතයින් හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සලසා ලන ප්‍රායෝගික ක්‍රියා පරිපාටියක්; සහ ප්‍රමාණවත් හා විශ්වාසදායක දත්ත වාර්තා කිරීමේ හා ආරක්ෂා කිරීමේ ක්‍රියාපරිපාටි ගැන එකී පවුල් දැනුවත් කිරීම.

## 2.3. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් සඳහා වූ වෙනත් පක්ෂපාත ක්‍රියාමාර්ග

- **අධ්‍යාපනයට ඇති අයිතිය**

ස්වකීය මවගේ සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් එච්අයිවී/ඒඩ්ස් ආසාදනයට භාජනය වී ඇති පදනමින්, කුලියාපිටියේ, ඉළුක්හේන, සම්බෝධි ප්‍රථමික විදුහලට භාර නොගන්නාලද පස් වියැති දරුවාගේ අධ්‍යාපනයට ඇති අයිතිය සම්බන්ධයෙන්, බලධාරීන්ගේ සහ මහ ජනතාවගේ කඩිනම් අවධානය යොමු කරවමින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සහ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සභාපතිනියන්ගේ අත්සනින් පුවත්පත් නිවේදනයක් නිකුත් කෙරිණ. එම දරුවාගේ අධ්‍යාපනයට ඇති අයිතිය සහතික කිරීමේ රාජ්‍ය වගකීම මෙම පුවත්පත් නිවේදනයෙන් අවධාරණය කරන ලද අතර, එම දරුවා ස්වකීය මව සමග ගොඩ නගා ගෙන ඇති දැඩි බැඳීම ඔස්සේ දරුවාගේ සුබ සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරන ලෙස සමාජයෙන් ඉල්ලා සිටිමින්, මෙවන් තත්ත්වයක් යටතේ, දරුවා ආයතනගතකරණයට භාජනය කිරීම සළකා බැලීම මෙම පුවත්පත් නිවේදනයෙන් තවදුරටත් අධෛර්යමත් කරවන ලද අතර, අදාල පවුලේ පෞද්ගලිකත්වයෙහි සහ මවගේ වෛද්‍ය වාර්තාවල රහස්‍යභාවයෙහි ගරුත්වය ආරක්ෂා කරන මෙන් දේශපාලන නායකයින්ගෙන්, නිලධාරීන්ගෙන් සහ මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටින ලදී.

- **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 15 වන ව්‍යවස්ථාව**

1978 - ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ, 16 වන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පළවී ඇති විවිධ නියෝජනයන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ආශ්‍රිත බැඳීම් හා වගකීම් සැළකිල්ලට ගෙන, එකී ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථාවරය ජනතාව හමුවේ ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී, ව්‍යවස්ථා ආධිපත්‍ය මූලධර්මය පිළිගත යුතු බවට නිර්දේශ කෙරිණ. එසේම, ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා අනනුකූලත්වයේ වපසරිය මත සියළුම ලිඛිත හා ව්‍යවහාරික නීති ඒ අනුව අවලංගු වනු ඇත.

## 2.4. එක්සත් ජාතීන්ගේ සාම හමුදාවල සේවයේ යෙදවීමට නියමිත ශ්‍රී ලංකා යුද හමුදා පිරිස් නිෂේධනය

එක්සත් ජාතීන්ගේ සාම හමුදාවල සේවයේ යෙදවීමට නියමිත ශ්‍රී ලංකා යුද හමුදා පිරිස් නිෂේධනය කිරීමේ ක්‍රියාවලියේ නිරත වීමට කොමිෂන් සභාවට ඇති හැකියාව සාකච්ඡා කිරීම පිණිස රැස්වීම් මාලාවකට සහභාගී වන ලෙස 2016 ජූනි මාසයේදී විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආරාධනය කෙරිණ. කොමිෂන් සභාව මෙම ක්‍රියාදාමයට එකඟත්වය පළකර, 2016 සැප්තැම්බර් මාසයේදී

අතිගරු ජනාධිපතිතුමන් වෙත ස්වකීය එකඟත්වය දන්වා සිටින ලදී. සාම හමුදා බලඇණි නිෂේධනයට භාජනය කිරීමේ කර්තව්‍යය ජාතික ආයතනයකට පවරන ලද ප්‍රථම අවස්ථාව මෙය වේ.

## 2.5. අභියෝග

2016 වසර තුළදී කොමිෂන් සභාව විසින් ප්‍රගතිය අත්පත් කරගන්නා ලද අතර, අභියෝග ගණනාවකට මුහුණ පෑමටද සිදුවිය. ස්වකීය පැවරුම් කාර්ය භාරය ඉටු කිරීමෙහි ලා, කොමිෂන් සභාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරලීමට මූලික වේයැයි අදහස් කරන ලද, අභ්‍යන්තර ව්‍යුහයන් සහ ක්‍රියාදාමයන් ප්‍රතිසංස්කරණයට භාජනය කිරීම පිණිස ප්‍රමාණවත් සභායක් ඒකරාශී කර ගැනීමට සමහර අවස්ථාවලදී අළුතින් පත් කරන ලද කොමිෂන් සභාවට දුෂ්කර විය. ක්‍රියාකාරකම් ප්‍රමාද කිරීමට හේතු පාදකවූ පීඩාකාරී නිලධාරිවාදී ක්‍රියාපරිපාටින් නිසා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වයට බාධා පැමුණන අතර, මෙමගින් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයටද බලපෑමක් සිදු කළ හැකිව තිබුණි.

පරිපාලනමය ස්වාධීනත්වයක අඩුපාඩුව, කොමිෂන් සභාවෙන් අපේක්ෂිත ප්‍රගති මට්ටම සාක්ෂාත් කරගැනීම වළක්වාලීමට තවදුරටත් ඉවහල් විය. බඳවා ගැනීම්, නව ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීම් සහ යටිතල පහසුකම් ලබා ගැනීමටද මෙය අහිතකර ලෙස බලපෑමක් ඇති කරවන ලදී.

ප්‍රමාණවත් මානව සම්පත් නොතිබීමද, පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමට බාධා පමුණුවන ලද සාධකයකි. ප්‍රමාණවත් මූල්‍යමය, භෞතිකමය සහ මානව සම්පත් සැපයීමෙන් මෙන්ම එහි කාර්යභාරය විධිමත්ව ඉටු කිරීම පිණිස ප්‍රමාණවත් කාර්ය මණ්ඩල පුහුණුව සහ විශේෂඥ දැනුම සපයා දීමෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශක්තිමත් කළ යුතු බව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තා සපයන ලද එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිතයින් කිහිප පළක්ම ස්වකීය වාර්තාවල නිර්දේශ කර ඇත.

කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමද නිරන්තරයෙන් ගැටළු මතු කරන සාධකයක් වූ අතර, මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ස්වකීය පැවරුම් කාර්යභාරය ඉටු කිරීමෙහි ලා කොමිෂන් සභාවට මුහුණ පෑමට සිදුවූ අභියෝගයකි. කොමිෂන් සභාවේ අවසාන නිගමනයන් සහ නිර්දේශයන් ක්‍රියාත්මක වන බවට සහතිකවීම පිණිස බලාත්මක කිරීමේ බලතල නොමැතිවීම කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වයට බාධාවක් බව, විනිසුරුවරුන්ගේ සහ නීතිඥයින්ගේ ස්වාධිපත්‍යය පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා මෙන්ම සුළුතර ප්‍රජාවන් පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා විසින් ස්වකීය වාර්තාවල හුවා දක්වමින්, පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකෙන බවට සහතික වීම පිණිස අදාල ආයතනයන් තමන් වෙත ඉදිරිපත් කෙරෙන නිර්දේශයන් කෙරෙහි වඩාත් සවිඥානකව කටයුතු කරන බවට රජය සහතිකවීම නිර්දේශ කර ඇත.

# 3 වන පරිච්ඡේදය :

# පරීක්ෂණ සහ විමර්ශන

3.1. දළ විශ්ලේෂණය

3.2. අයිතිවාසිකම මත පිහිටා ගොනුකරන ලද ඒකභාවී පැමිණිලි නියැදි

3.2.1. සාධාරණත්වය සහ නොවනස්ව සැළකීම

3.2.2. අත්අඩංගුවේදී ප්‍රචණ්ඩත්වය

3.3. ස්වයං-මෙහෙයුම් පරීක්ෂණ

# 03 විමර්ශන සහ පරීක්ෂණ

## 3.1. දළ විශ්ලේෂණය

ජනතාව වෙතින් කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබෙන අතර තුර, මූලික අයිතිවාසිකම් උල්ලංඝණයන් හෙළිදරව් කෙරෙන ගැටලු සම්බන්ධයෙන්, ස්වයං-මෙහෙයුම් පරීක්ෂණයන් පැවැත්වීමටද පනතේ 14 වන ඡේදයෙන් කොමිෂන් සභාවට බලය පැවරී ඇත.

2016 වර්ෂා'රම්භයේදී, තමන් වෙත ලැබෙන පැමිණිලි නිරාකරණයෙහි ලා කොමිෂන් සභාව වඩාත් හොඳින් යෝග්‍ය වන්නේද යන්න නිගමනය කිරීම පිණිස, එකී පැමිණිලි දැඩි නිෂේධනයකට භාජනය කිරීමට කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබිණ. මෙම තීරණයට එළඹෙන ලද්දේ, පරිපාලනමය සාධාරණත්වා'ශ්‍රිත පැමිණිලි කොමිෂන් සභාව තුළ ඒකරාශී වී ඇති හෙයින් සහ එකී පැමිණිලි සහන ප්‍රදානය සඳහා වෙනත් ආයතන වෙත යොමු කිරීම කළහැකි හෙයිනි. කොමිෂන් සභාවට පැවරී ඇති කාර්ය භාරයේ ගුණාත්මකභාවය පවත්වා ගෙනයමින්, ස්වකීය සම්පත් මානව අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති කාරණවලදී වින්දිතයින්ට සහන සැලසීම සඳහා භාවිතයට ගැනීම මෙමගින් සහතික කර ගත හැකිවිය. මෙම ප්‍රතිපත්ති තීරණයට තදනන්තරව, ස්වකීය නිලධාරීන්ට සවිස්තරාත්මක යොමු කිරීම් ක්‍රමවේද පුහුණුවක් ලබා දෙන ලද අතර, කොමිෂන් සභාවේ විෂය පථය යටතේ නොගැණෙන පැමිණිලි යොමු කළ යුතු වන යෝග්‍යතම බලධාරියා හඳුණා ගැනීමට මෙම පුහුණුව බෙහෙවින් ඉවහල් විය. දැනට, කිසියම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් යොග්‍යතම බලධාරියා කොමිෂන් සභාව නොවන අවස්ථාවලදී, එකී පැමිණිලි යොමු කළයුතු වන ආයතනය සම්බන්ධයෙන් සෑම පැමිණිලිකරුවෙකුම දැනුවත් කෙරේ.

මෙ අතරතුර, 2014 වසරට පෙර ඒකරාශී වී ඇති නොවිසඳන ලද පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස, ස්විස් සමූහාණ්ඩුවෙන් අරමුදල් යෙදවෙන ව්‍යාපෘතියක් හරහා නව නිලධාරීන් බඳවා ගෙන ඇත. කාලීනව මැදිහත්වී ආයතනය කෙරෙහි ඇති ජනතා විශ්වාසය යළිත් ගොඩනැගීමට හැකිවන පරිදි, කාර්යක්ෂමව හා කඩිනම්ව එකී කල්ගතවූ පැමිණිලි විමර්ශනය කර, නිරාකරණය කර ලීම පිණිස මෙම ව්‍යාපෘතිය කොමිෂන් සභාව වෙත ප්‍රදානය කෙරිණ. අතිරේක නිලධාරීන් බඳවා ගන්නා ලද්දේ, දැනට සේවයේ යෙදී සිටින්නාවූ කාර්ය මණ්ඩලයට වර්තමාන පැමිණිලි කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩ සලසනු පිණිස වන අතර, නැවත එසේ පැමිණිලි ගොනු ඒකරාශිවීම වළක්වාලීම පිණිස වර්තමාන පැමිණිලි හැසිරවීමේ ක්‍රමවේදය සමාලෝචනයට කිරීමට සහ ශක්තිමත් කිරීමට කොමිෂන් සභාව කටයුතු කරන්නීය.

- **නව ක්‍රියාකාරී ක්‍රමවේද හඳුන්වාදීම**

පරීක්ෂණ සහ විමර්ශන අංශයේ කාර්යක්ෂමභාවය සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය වැඩිදියුණු කරලීම පිණිස නව ක්‍රියාකාරී ක්‍රමවේද හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරිණ. මූලික පියවරක්

ලෙස, පැමිණිලි හැසිරවීමේ ක්‍රියාදාමය විධිමත් කිරීමේ අරමුණින්, පැමිණිලි වර්ගීකරණය කිරීමේ නව පිළිවෙතක් හඳුන්වා දෙන ලදී.

පැමිණිලි යොමු කිරීම පිණිස පරීක්ෂණ සහ විමර්ශන අංශය තුළ නව ඒකක ස්ථාපිත කෙරිණ. එක් එක් වර්ගයේ පැමිණිලි ඇපකැපවීමෙන් හසුරුවනු ලබන ඒකක වලින් අපේක්ෂා කෙරෙන්නේ, කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් සක්‍රියව හා කඩිනම්ව ප්‍රතිචාරය දැක්වීමට මග සලසා දීමයි. එකී ඒකක වන්නේ:

- ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්
- අධ්‍යාපන අංශයේ පැමිණිලි
- හිංසනය/ අත්අඩංගුවේදී ප්‍රචණ්ඩත්වය
- පොදු පැමිණිලි ඒකකය


මීට අතිරේක වශයෙන්, පැමිණිලි භාර ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම සඳහා නව ආකෘති සහ මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලද අතර, එනයින්ද අපේක්ෂා කරනු ලබන්නේ අංශයේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කරලීමයි.

- **ලත් පැමිණිලි සංඛ්‍යා විස්තරය**

2016 වසරේද කොමිෂන් සභාව වෙත ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාව 9171 කි. පසුගිය වසරේ ලද පැමිණිලි සංඛ්‍යාව සංසන්දනාත්මකව 8949 කි. ලත් වැඩිම පැමිණිලි සංඛ්‍යාව, එනම් ලද පැමිණිලි වලින් 20%ක්, අත්අඩංගුවේදී හිංසනය, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් ඇතුළු පෞද්ගලික නිදහස උල්ලංඝණය කිරීමට අදාළ පැමිණිලිය. දෙවන වැඩිම පැමිණිලි සංඛ්‍යාව සේවා නියුක්තියට අදාළ වන අතර, එය සමස්ත පැමිණිලි සංඛ්‍යාවෙන් 16 % කි. තෙවන ඉහළම පැමිණිලි සංඛ්‍යාව, 14% ක් වන, රාජ්‍ය බලධාරීන්ගේ අක්‍රීයත්වයට අදාළ පැමිණිලිය. ලත් පැමිණිලි 7712 න්, 3704 ක් ප්‍රාදේශීය කාර්යාලවල ගොනු කරන ලද පැමිණිලි වන අතර, ශේෂය ප්‍රධාන කාර්යාලය වෙත ලද පැමිණිලිය.

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | සමස්ත එකතුව |
|---|---|---|---|
| පෞද්ගලික නිදහස | 796 | 1018 | 1814 |
| හිංසනය ( ශාරීරික/මානසික) | 129 | 286 | 415 |
| පොදු හිරිහැර | 52 | 193 | 245 |
| ලිංගික හිරිහැර | 6 | - | 6 |
| තර්ජන | 229 | 263 | 492 |
| අවමන්කිරීම | 62 | 67 | 129 |
| අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්/රඳවාගැනීම් | 251 | 190 | 441 |
| රඳවාගැනීමේ තත්ත්වයන් | 2 | 1 | 3 |
| අත්අඩංගුවේදී මියයාම | 2 | 3 | 2 |
| බලහත්කාරයෙන් හෝ අනිච්චානුගත අතුරුදහන්වීම් | 1 | - | 1 |
| පැහැර ගෙන යාම් | 1 | - | 1 |
| බාහ්‍ය-අධිකරණ ඝාතන | 2 | - | 2 |

| | | | |
|---|---|---|---|
| අහඹු මරණ | - | - | - |
| සිරකරු අයිතිවාසිකම් | 6 | 4 | 10 |
| අතුරුදහන්වූවන් | 51 | 11 | 6 |
| වෙනත් | 2 | - | 2 |
| වෙනත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් | 9 | 22 | 62 |
| භාෂණයේ නිදහස | 2 | 3 | 5 |
| රැස්වීමේ නිදහස | 2 | - | 2 |
| සමාගමයේ නිදහස | 3 | 16 | 19 |
| යාම් ඊම් නිදහස | - | 1 | 1 |
| තොරතුරු දැනගැනීමේ නිදහස | - | 1 | 1 |
| සේවා නියුක්තිය | 749 | 725 | 1474 |
| අධ්‍යාපනය | 357 | 390 | 747 |
| ජනප්‍රිය පාසල් වලට ඇතුළත්වීම් | 157 | 207 | 364 |
| අධ්‍යපන අයිතිවාසිකම් මත වෙනත් පැමිණිලි | 210 | 183 | 383 |
| රාජ්‍ය සුබසාධන සේවා | 123 | 14 | 137 |
| යටිතල උපයෝගිතා | 110 | 49 | 137 |
| ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමට අදාළ පැමිණිලි | 3 | 4 | 7 |
| රාජ්‍ය ආයතනවල අක්‍රියත්වයට අදාළ පැමිණිලි | 769 | 362 | 1131 |
| පොලිස් | 464 | 190 | 654 |
| අනෙකුත් රාජ්‍ය බලධාරීන් | 305 | 172 | 477 |
| ළමා අයිතිවාසිකම් | 14 | 5 | 19 |
| විශේෂ අවශ්‍යතා සහිතවූවන්ගේ පැමිණිලි | 7 | - | 7 |
| භාෂා අයිතිවාසිකම් | 3 | 1 | 4 |
| සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් | 33 | 20 | 53 |
| සම ලිංගික ප්‍රභේද (සමකාමී, සමලිංගික, ද්විලිංගික, අන්තර් ලිංගික සහ විමසුම් | - | 1 | 1 |
| සෞඛ්‍ය | 13 | 6 | 9 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 626 | 184 | 810 |
| අස්ථානගතවූවන්/ පෙරළා පැමිණෙන සරණාගතයන් | 17 | 1 | 18 |
| පාරිසරික | 40 | 31 | 71 |
| පරිපාලන කරුණු | 212 | 346 | 558 |
| අවසරපත්/බලපත් | 24 | 37 | 61 |
| අපයෝජනය/බලය අවභාවිතය | 107 | 265 | 372 |
| වෙනත් පරිපාලනමය කරුණු | 81 | 44 | 125 |
| කාන්තා අයිතිවාසිකම් | 29 | 3 | 32 |
| වැඩිහිටි අයිතිවාසිකම් | - | 1 | 1 |
| විෂය පථයෙන් බැහැර/ක්‍රියා කළ හැකි, නොහැකි | 292 | 1786 | 2078 |
| **එකතුව** | **4202** | **3969** | **9171** |




- **නිරාකරණය කරන ලද පැමිණිලි සංඛ්‍යා විස්තරය**

2016 වසරේදී කොමිෂන් සභාව විසින් පැමිණිලි 4387ක් නිරාකරණය කරන ලදී. එයින් 3418ක් නිම කරන ලද්දේ ප්‍රාදේශීය කාර්යාල විසිනි. කාරණා 727 දී සහනය සලසා දෙන ලද අතර, කාරණා 1162ක් සාර්ථකව සමථයට පත් කිරීම සුසාධ්‍යකරණය කරන ලද අතර, කරුණු 127ක් වෙනත් යෝග්‍ය ආයතන වෙත යොමු කෙරිණ. පැමිණිලි 803ක අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් හෙළිදරව් නොවීය. පැමිණිලි 896කදී, පැමිණිලි ඉල්ලා අස්කර ගැනීම හෝ පරීක්ෂණ ඉදිරියට ගෙනයාමට පැමිණිලිකරුවන් උත්සුක නොවීම සිදුවිය.

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|
| මූලික අයිතිවාසිකම් උල්ලංඝණය | 607 | 196 | 803 |
| සමථයට පත්කිරීම් | 1079 | 83 | 1162 |
| සහන ප්‍රදානය | 640 | 87 | 727 |
| වෙනත් ආයතන වෙත යොමු කිරීම් | 56 | 71 | 127 |

| | | | |
|---|---|---|---|
| නියෝග ලබාදුන් | 00 | 34 | 34 |
| අධිකරණ කටයුතු සිදු කෙරෙමින් | 100 | 97 | 197 |
| පැමිණිලිකරු උනන්දු නොවීම | 445 | 132 | 577 |
| විෂය පථය යටතේ නොගැණෙන | 328 | 80 | 408 |
| ඉල්ලා අස්කර ගැනීම් | 132 | 187 | 319 |
| කාලය ඉක්මවන ලද (කාලාවරෝධ) | 31 | 2 | 33 |
| **එකතුව** | **3418** | **969** | **4387** |

- ## නිර්දේශ


2016 වසරේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද සමස්ත නිර්දේශ සංඛ්‍යාව 44 කි. මින් බහුතරය අධ්‍යාපන අයිතිවාසිකම් උල්ලංඝණයට අදාළ වන අතර, කොමිෂන් සභාව විසින් නිශ්චිතව පිළි නොගත් නමුදු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තහවුරු කර ඇති සමානාත්මතාව සහ නොවෙනස්ව සැළකීමේ විධිවිධාන උල්ලංඝණයන්ට තඩු දෙන කරුණු වේ. (2016 වසරේදී නිකුත් කරන ලද සම්පූර්ණ නිර්දේශ ලැයිස්තුව සඳහා පරිශිෂ්ඨ 2 බලන්න)

| විෂයය / ක්ෂේත්‍රය | සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යාපනයට අදාළ අයිතිවාසිකම් | 20 |
| ආර්ථික,සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් | 11 |
| පෞද්ගලික නිදහසට අදාළ අයිතිවාසිකම් | 09 |
| වෙනත් | 04 |
| **එකතුව** | **44** |

ප්‍රභවය: ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා දත්ත සමුදාය

අධ්‍යාපනයට අදාළ අයිතිවාසිකම් ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් යටතේ ගැණෙන නමුදු, ලද අධිකතර පැමිණිලි සංඛ්‍යව නිසා එය වෙනම වර්ගයක් ලෙස හඳුණා ගෙන ඇත. මෙම නිර්දේශ අදාළ වන්නේ පාසල් වලට දරුවන් ඇතුළත් කිරීම්, ශිෂ්‍යයින්ගේ විනයානුකුල කරුණු, විශ්වවිද්‍යාල වලට ඇතුළත් කර ගැනීම්, අධ්‍යාපනික ආයතනවල හිරිහැර කිරීම් සහ අධ්‍යාපනික ආයතනවල උසස්වීම් වලටය.

ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් වලට අදාළ වෙනත් නිර්දේශ වලට විශ්‍රාම වැටුප්, ජීවනෝපාය, වැටුප් වර්ධක, ස්ථාන මාරුවීම්, බඳවා ගැනීම්, සේවා කොන්දේසි, වැඩ තහනම් කිරීම්, සේවය අත්හිටුවීම්, වන්දි සහ බලය අවභාවිතය යනාදිය ඇතුළත්ය. පෞද්ගලික නිදහසට අදාළ වන්නේ, නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම්, හිංසනය සහ අත්අඩංගුවේදී සිදුවන මරණ ය.




## 3.2. අයිතිවාසිකම් අනුව ගොනු කරන ලද ඒකභාවී පැමිණිලි නියැදි

### 3.2.1. සාධාරණත්වය සහ නොවනස්ව සැළකීම

- **රජයේ පාසලකට පැමිණීම අත්හිටුවීම (පැමිණිලි අංක: එච්ආර්සී/2124/16/1-23)**

විනයානුකුල හේතු මත දළ වශයෙන් මාස 3 ක කාල පරාසයකට පාසලට පැමිණීම තාවකාලිකව අත්හිටුවන ලද ශිෂ්‍යයෙකුගේ අධ්‍යාපනයේ නිදහස උල්ලංඝණය වීමේ හේතුවෙන්, 12(1) ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති සැමට නීතියේ රැකවරණය සර්ව සාධාරණවිය යුතුය යන මූලික අයිතිය උල්ලංඝණය වීමක් කොමිෂන් සභාව වෙත යොමු විය. කිසියම් ශිෂ්‍යයෙකු විෂමාචාරයකට වගකිවයුතු වන්නේ නම්, අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය දැක්වෙන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක: 2005/ 17දරණ චක්‍රලේඛය මෙම කාරණයේදී පාසල් බලධාරීන් විසින් අනුගමනය කර නැත. ශික්ෂකයින් ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් (loco parents) වන හෙයින් ඔවුන් ශිෂ්‍යයින්ගේ සුබසිද්ධිය වෙනුවෙන් නොවළහා කටයුතු කිරීමට බැඳී සිටින බවට කොමිෂන් සභාව විසින් තවදුරටත් මත ප්‍රකාශයක් කරන්නට යෙදුණි. විදුහල්පතිට විරුද්ධව විනයානුකුල සම්බාධක පැනවීමට මග පාදන, අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක: 2012/37 දරන චක්‍රලේඛයේ සඳහන් ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝණය කිරීම මගින් අදාළ විදුහලේ විදුහල්පතිවරයා ස්ථානීය දෙමාපිය සංකල්පයට පටහැනිව කටයුතු කර ඇත. කිසියම් හෝ බාධාවකින් තොරව ස්වකීය අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට පහසුකම් සලසන ලෙස විදුහල්පතිවරයා මෙහෙයවමින් නිර්දේශයක් නිකුත් කිරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. මෙකී චක්‍රලේඛවල අන්තර්ගතයන් සම්බන්ධයෙන් වැටහීමක් නොමැතිකම නිසා පාසල් බලධාරීන් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීමට පෙළඹී ඇති හෙයින්, මෙම චක්‍රලේඛ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලෙස කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තවදුරටත් නිර්දේශ කරන ලදී.

- **රජයේ පාසලක 2 වන ශ්‍රේණියට ඇතුළත් කිරීම (පැමිණිලි අංකඃ එච්ආර්සී/2694/15)**

අවශ්‍ය සියළුම උපමානයන් අයදුම්පතෙහි අන්තර්ගතව තිබියදීත්, 2015 වර්ෂයේදී තම පුත්‍රයා රජයේ පාසලක 2 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම නිර්දේශ නොකිරීම මගින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ඡේදය යටතේ තහවුරු කර ඇති තම පුත්‍රයාගේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම උල්ලංඝණය කරන ලදැයි පැමිණිලිකාරිය චෝදනා කර සිටින්නිය. මුලදී විදුහල්පති විසින් අංකඃ 2008/38 දරන චක්‍රලේඛයේ සඳහන් අවශ්‍යතාවයන් අනුව දරුවා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත භාර ගෙන අනුමැතිය පතා අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත. කෙසේවුවද, තදනන්තරව සියළුම පාසල්වල ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අභියාචනා සළකා බැලීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අභියාචනා කමිටුවක් පත් කර ඇත. අභියාචනා ඉදිරිපත් කරන ලෙස දන්වමින් ජාතික පුවත්පත් වල නිවේදනයක් පළ කර ඇත. තම පුත්‍රයාගේ අයදුම්පත සාර්ථකවූ හෙයින් මෙම මව එකී කමිටුවකට අභියාචනයක් ඉදිරිපත් කර නැත. කෙසේවුවද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින්, ඉහත දක්වා ඇති චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව විදුහල්පති විසින් ගනු ලැබූ තීරණය නොසළකා, ඇතුළත් වීම සඳහා අනුමත කර ඇත්තේ විශේෂ අභියාචනා කමිටුවලට අයදුම් කර සාර්ථක වූ දරුවන් පමණකි.

විශේෂ අභියාචනා කමිටු පිහිටුවීම සඳහා විධිවිධාන අංකඃ 2008/38 දරණ චක්‍රලේඛයෙහි සලසා නොමැති බවත්, එසේ කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ස්වකීය බලතල අභිභවා කටයුතු කර ඇති බවත් කොමිෂන් සභාව හෙළිදරව් කර ගෙන ඇත. එම නිසා, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් සිදුවී ඇති හෙයින්, 2016 වසරේදී අදාළ වින්දිත දරුවා 3 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම නිර්දේශ කෙරිණ.

- **රාජ්‍ය ආයතනයකට බඳවා ගැනීම (පැමිණිලි අංකඃ එච්ආර්සී/2449/15)**

2016 මැයි මාසයේදී, සම්මුඛ පරීක්ෂණ ක්‍රියාදාමයකදී ආණ්ඩු ක්‍රමව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය වීමක් හෙළිදරව් වීමෙන් පසු, ලංකා විදුලි බල මණ්ඩලයේ කාර්යාල සහකාර තනතුරකට පෙත්සම්කරු පත් කිරීම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරිණ. පෙත්සම්කරු මෙම තනතුරට අයදුම්කර ඇත්තේ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් ලබාගත් බාහිර උපාධියක් සහ සමාන තනතුරක පෙර පළපුරුද්ද සහිතව අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සුදුසුකම් සහිතවය. කොමිෂන් සභාවේ උපකල්පනය වූයේ, අවශ්‍ය අවම සදුසුකම් වලට වඩා වැඩි සුදුසුකම් තිබීම නුසුදුස්සෙකු වීමට පදනමක් නොවිය යුතු බවයි. ඒ අනුව, සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලබා දිය යුතු වූ අයදුම්කරුගේ අධ්‍යාපනික සුදුසුකම් සඳහා ලබා දිය යුතු ලකුණු 20 න් 10 ක් පමණක් ලබා දීම කොමිෂන් සභාව විසින් අනුමත නොකරන ලදී. තවද, සම්මුඛ පරීක්ෂණ නිලධාරීන්ගේ අභිමතය පරිදි කාර්ය සාධනය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 60%ක් වෙන් කිරීම හෝ සම්මුඛ පරීක්ෂණ නිලධාරීන් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීමේ නිර්ණායකයන් සතුටුදායක ලෙස සාධාරණීකරණය කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් බවද කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරිණ. එමනිසා, සම්මුඛ පරීක්ෂණ නිලධාරීන් අයදුම්කරුවාගේ අධ්‍යාපනික සුදුසුකම්වලට ප්‍රමාණවත් වැදගත්කමක් ආරෝපණය කර නැති අතර, මූලික අයිතිවාසිකම්

උල්ලංඝණයකට තුඩු දෙන පරිදි, ඔවුන්ගේ තක්සේරුව පාරදෘෂ්‍යභාවයෙන් යුක්තව කර නොමැති බවද කොමිෂන් සභාවට හෙළිවිය.

- **රාජ්‍ය විශ්ව විද්‍යාලවල විභාග ප්‍රතිපත්ති (පැමිණිලි අංක: එච්ආර්සී/4326/15)**

රාජ්‍ය විශ්ව විද්‍යාලයක ජාත්‍යන්තර වෙළඳ නීති විෂයය සඳහා විශ්ව විද්‍යාලයේ නීති ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදෑරූ අයදුම්කරුවෙකු වන පෙත්සම්කරු, විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලෙස අවශ්‍ය පැමිණීමේ ප්‍රතිශතය සපුරා නොමැත්තේය යන පදනම මත, ඔහුගේ විභාග ප්‍රතිඵල මුදා නොහරින නිසා, එකී ප්‍රතිඵල මුදා හරින සේ දන්වමින් නිර්දේශයක් එකී රාජ්‍ය විශ්ව විද්‍යාලයට නිකුත් කර ඇත. කොමිෂන් සභාව විසින් මෙම නිර්දේශය කරන ලද්දේ, එහි අතුරු නිර්දේශය; එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය වී ඇති බව හෙළිවී, ඉහත කී විෂයයට අදාළ විභාගයට පෙනී සිටීමට පෙත්සම්කරුට ඉඩ දෙන ලෙස දන්වමින් ලබා දෙන ලද නිර්දේශය තහවුරු කරමිනි. පෙත්සම්කරු චෝදනා කරන ලද්දේ, පාඨමාලාව හදාරණ ලද කාලය තුල කොයියම් හෝ අවස්ථාවකදී වත්, විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් දේශන 50% කට පැමිණ සිටිය යුතු බවට ශිෂ්‍යයින් විධිමත්ව දැනුවත් කිරීමේ දැන්වීමක් විශ්ව විද්‍යාලය විසින් නොකරන ලද බවයි. තවද, විශ්ව විද්‍යාලයේ මුල් වාර තුනේදීද එවන් අවශ්‍යතාවයක් සපුරාලිය යුතු යැයි සඳහන් නොකරන ලද බවද පවසා සිටී. පූර්ව දැනුම්දීමකින් තොරව, අවසාන විභාගයට මාස දෙකකට පෙර එකී ප්‍රතිපත්තිය තරයේ ක්‍රියාත්මක කිරීමට විශ්ව විද්‍යාලයය තීරණය කර ඇත. විශ්ව විද්‍යාලයය විසින් එකකාර ක්‍රමවේදයකට අනුගත නොවී, තත්කාර්ය ක්‍රමවේද කෙරෙහි වැඩි අභිරුචියකින් මෙම තොරතුර හෝ වෙන යම් තොරතුරු ශිෂ්‍යයින් වෙත සංනිවේදනය කිරීම පිණිස සතුටුදායක ප්‍රමිතියක ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බවද කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරිණ. එම නිසා, විශේෂයෙන්ම, ප්‍රතිපත්ති වෙනසක් නිසා, එවන් ප්‍රතිපත්ති වලින් බලපෑමකට ලක්වන පුද්ගලයින්ගේ නීත්‍යානුකූල අපේක්ෂාවන් භංගත්වයට පත්වීමට ඉඩකඩ සැලසෙන හෙයින්, සෑම අයදුම්කරුවෙකු වෙතම ළඟා වන පරිදි නිර්මාණය කරන ලද නීත්‍යානුකූල ප්‍රමිතකරණිත සංනිවේදන ක්‍රමවේදයක් භාවිතා කිරීමට විශ්ව විද්‍යාලයට වගකීමක් පැවරී ඇති බවත්, මේ අවස්ථාවේදී එකී අවශ්‍යතාවය සපුරා නොමැති බවත් කොමිෂන් සභාවේ මතය විය.

- **දෘශ්‍ය කලා ශිල්පීන්ට වෙනස්ව සැළකීම (පැමිණිලි අංක: එච්ආර්සී/2037/15), 2038/16, 1994/15)**

2016 ඔක්තෝබර් මාසයේදී, පෙත්සම්කරුවන්ගෙන් එක් අයෙකු විසින් අධ්‍යක්ෂණය කරන ලද ටෙලි නාට්‍යයක් විකාශනය කිරීම අත්හිටුවීමට ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව විසින් ගන්නා ලද තීරණය අත්තනෝමතික ලෙස ගන්නා ලද තීරණයක් බව හෙළිවූ හෙයින්, එකී ටෙලිනාට්‍යය මුළුමණින්ම නැවත විකාශනය කරන ලෙස කොමිෂන් සභාව විසින් සංස්ථාවට නියම කරන ලදී. පෙත්සම් ඉදිරිපත් කරන ලද්දේ පිළිවෙලින් අධ්‍යක්ෂ, නිෂ්පාදක හා එක් ප්‍රේක්ෂකයකු විසිනි. ඔවුන් ඉල්ලා සිටින ලද්දේ එකී ටෙලිනාට්‍යය නැවත විකාශනය කරන ලෙස සහ කීර්ති නාමයට වූ හානිය සහ මූල්‍ය හානි වෙනුවෙන් වන්දියක් ගෙවන ලෙසය. අවම ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුපාතයන් සහ වෙළඳ දැන්වීම්වලින් ජනනය වූ ආදායම අවම වීම හේතු ලෙස දක්වමින් එකී ටෙලි නාට්‍යය විකාශනය_අත්හිටුවීමට සංස්ථාව විසින් ගන්නා ලද තීරණය නිසා, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1)ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව කොමිෂන් සභාවට හෙළිවිය. පාර්ශ්වයන් අතර ගිවිස

ගන්නා ලද පරිදි, අදාල කාල සීමාවන් තුළ සහ සතියේ දින 4 කදී එකී ටෙලි නාට්‍යය විකාශනය නොකිරීම නිසා, අදාළ කොන්ත්‍රාත්තු වගකීම්ද සංස්ථාව විසින් පැහැර හැර ඇති බවද හෙළිවිය. ලිඛිත කොන්ත්‍රාත්තුව අනුව, මෙම හේතු දෙපාර්ශවය අතර ගිවිසුම අත්හිටුවීමට ඉවහල් කර ගත හැකිව තිබුණද, ප්‍රේක්ෂක ප්‍රතිචාර සමීක්ෂණ පවත්වන ලද පෞද්ගලික අලෙවි පර්යේෂණ සමාගම විසින් ප්‍රමාණවත් ප්‍රේක්ෂක නියැදි සංඛ්‍යාවක් සාර්ථකව ග්‍රහණය කර ගැනීමට අපොහොසත්වීම නිසා, එකී සමීක්ෂණය සංස්ථාවේ අත්හිටුවීමේ තීරණය සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් නොවීය. තවද, මෙම විකාශනයෙන් සංස්ථා ආදායමට හානියක් වූයේ නම්, ඔවුන්ගේ තීරණය සාධාරණීකරණය කළ හැකිව තිබුණද, එසේ තම ආදායමට හානියක් වූ බව සාර්ථකව ඔප්පු කිරීමටද සංස්ථාව අපොහොසත් විය. එම නිසා, දෙපාර්ශවයන් අතර ගිවිස ගත් පරිදි ටෙලිනාට්‍යය නැවත විකාශනය කරන ලෙසත්, පෙත්සම්කරුවන් විසින් විකාශනය සඳහා ඉදිරියේදී ස්වකීය කෘති ඉදිරිපත් කළහොත්, ඒවා නොසළකා හැරීමෙන් හෝ වෙනස්ව සැළකීමට භාජනය කිරීමෙන් වළකින ලෙසද කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාවට නියම කෙරිණ.

### 3.2.2. අත්අඩංගුවේදී ප්‍රචණ්ඩත්වය

- **පොලිස් අත්අඩංගුවේදී ශාරීරික හිංසනය (පැමිණිලි අංක: එච්ආර්සී/ඒපී/734/2013)**

පෙත්සම්කරු පැමිණිලි කර සිටින ලද්දේ පොලිසිය විසින් අත්තනෝමතික ලෙස තමා අත්අඩංගුවට ගත් බවත්, රඳවා ගෙන සිටියදී හිංසනයට භාජනය කරන ලද බවත්ය. මෙම චෝදනාව ප්‍රතික්ෂේප කරමින් පොලිසිය විසින් සඳහන් කරන ලද්දේ එම පෙත්සම්කරු අත්අඩංගුවට ගන්නා ලද්දදේ ඔහු බීමත්ව අශෝභන ලෙස හැසිරීම නිසා බවය. මෙම ප්‍රකාශය පොලිස් ක්ෂේත්‍ර වාර්තාවල සටහන් වලින් සනාථ විය. එයට විරුද්ධව සාක්ෂි ඉදිරිපත් කිරීමට පෙත්සම්කරු අපොහොසත්වූ හෙයින්, අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව උල්ලංඝණය වීමක් හෙළිදරව් නොවීය. කෙසේවුවද, තමාට සිදුවූ ශාරීරික හානි සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් ලබා ගත් නේවාසික ප්‍රතිකාර සඳහා පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය වාර්තා සහ අනුරාධපුර ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තා මත පදනම්ව, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ පෙත්සම්කරුගේ අයිතිවාසිකම් උල්ලංඝණයකට භාජනය වී ඇති බව කොමිෂන් සභාව විසින් නිගමනය කෙරිණ. ඒ අනුව, පෙත්සම්කරුට රුපියල් 25,000.00 ක වන්දියක් ගෙවන ලෙස පොලිසියට නියම කෙරිණ.

- **රජයේ පාසලකදී ශාරීරික හා මානසික හිංසනය (පැමිණිලි අංක: එච්ආර්සී/1862/15/1-23)**

2016 අගෝස්තු මාසයේදී, රජයේ පාසලක විනය භාර ගුරුවරයා විසින් ප්‍රකෝප කිරීමකින් තොරව ශිෂ්‍යයෙකුට පහර දී, සිදුවූ ශාරීරික තුවාල සහ මානසික කම්පනය නිසා අණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය වීමක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැන ගන්නට ලැබිණ. එකී උල්ලංඝණයට වග කිවයුතු ගුරුවරයාට විරුද්ධව යෝග්‍ය විනයානුකූල පියවර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයට දන්වන ලද අතර, පාසල් තුල විනය පවත්වා ගෙන යාමට අදාළ අංක: 2005/17 දරණ චක්‍රලේඛයේ අන්තර්ගතය තම පාසලටද අදාළ කර ගැනීම පිණිස දීර්ඝකාලීන

ක්‍රියා පරිපාටියක් ක්‍රියාත්මක කරන ලෙසත්, එහි ප්‍රගතිය කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසත් විදුහල්පතිට නියම කෙරිණ.

## 3.3. ස්වයං-මෙහෙයවීමෙන් කෙරෙන පරීක්ෂණ (Suo Motu)

පනතේ 14 වන පරිච්ඡේදය යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති ස්වයං-මෙහෙයවීමෙන් පරීක්ෂණ කිරීමේ බලතල ප්‍රකාර, කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මැදිහත්වීමක් සිදු කෙරිණ. මැදිහත්වීමක් අවශ්‍ය වන කරුණු හඳුනාගනු ලබන්නේ මධ්‍ය වාර්තා ආශ්‍රයෙන් සහ යම් යම් පුද්ගලයින් විසින් එකී අවස්ථා කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන කල්හිය. සමස්තයක් වශයෙන්, පහත දක්වා ඇති පරිදි, කොමිෂන් සභාව විසින් විවිධ සිද්ධීන් සම්බන්ධයෙන්, ස්වයං-මෙහෙයුම් පරීක්ෂණ 17 ක් දියත් කරන ලදී. ( ස්වයං-මෙහෙයුම් පරීක්ෂණ සම්පූර්ණ ලැයිස්තුව සඳහා පරිශිෂ්ඨ 3 බලන්න)

- **ඇඹිලිපිටියේ පොලිසිය සහ උත්සවයක සංවිධායකයින් අතර ගැටුමකදී සිදුවූ ඒක පුද්ගල මරණයක් සම්බන්ධ පරීක්ෂණය**

ඇඹිලිපිටියේ පොලිසිය සහ උත්සවයක සංවිධායකයින් අතර ගැටුමකදී සිදුවූ ඒක පුද්ගල මරණයක් සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂනයක් දියත් කරන ලදී. මෙම සිද්ධිය මාධ්‍ය වාර්තා හරහා කොමිෂන් සභාවේ අවධානයට යොමු අතර, එකී මාධ්‍ය වාර්තාවල සඳහන්වූයේ, ගැටුම අතරතුරදී නිවසේ ඉහළ මාළයකින් ඇදවැටී සිදුවුන බහුවිධ තුවාල හේතුවෙන් එකී පුද්ගලයා මිය ගොස් ඇති බවයි. කෙසේවුවද, මිය ගිය පුද්ගලයාගේ පවුලේ සාමාජිකයින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කර ඇති නිසාද, ඒ අනුව කොමිෂන් සභාව විමර්ෂණයක් කිරීමේ ක්‍රියාදාමයෙන් ඉවත් කෙරෙන නිසාද, කොමිෂන් සභාව විසින් ස්වකීය විමර්ශනයන් අත්හිටුවන ලදී.

- **කළුතර සහ මතුගම පාසල් දෙකක 1 වන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරන ලෙස අදාළ විදුහල්පතිවරුන්ට දේශපාලනඥයෙකු විසින් කරන ලද බලකිරීමට අදාල පරීක්ෂණය**

දේශපාලනඥයෙකු කළුතර පාසල් භූමියට බලහත්කාරයෙන් ඇතුල්වී, පාසලට දරුවෙකු ඇතුළත් කරගන්නා ලෙස බල කිරීම් කළ බවටත්, එම දේශපාලනඥයාම එයට සමාන ඉල්ලීමක් සම්බන්ධයෙන් මතුගම පාසලක විදුහල්පතිගේ ගෙල මිරිකීමට සහ සියදිවි නසා ගැනිමට උත්සාහ කිරීමක් ගැන පළවූ පුවත්පත් වාර්තාවලින් අනතුරුව, මෙකී සිද්ධීන් දෙක සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී. ඒ හා සමගම, මේ කාරණ දෙක සම්බන්ධයෙන් ගත් පියවරට අදාල විස්තරද බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කැඳවන ලදී.

- **කොළඹ, කජිමාවත්තෙහි, නිවසක් බිඳ හෙළීම ගැන මැදිහත්වීම**

පූර්ව දැනුම්දීමකින් තොරව, තම නිවාස බිඳ හෙළීමට විරුද්ධව කොළඹ, කජිමාවත්තේ, පදිංචිකරුවන් විසින් දක්වන ලද විරෝධතාවය සම්බන්ධයෙන් මාධ්‍යයෙහි පළවූ වර්තාවකින්

අනතුරුව, ස්වකීය ස්වයං-මෙහෙයුම් බලතල භාවිතා කරමින් මෙයට මැදිහත්වීමට කොමිෂන් සභාව විසින් පියවර ගැණිින. කරුණු විමසීම පිණිිස එකී ස්ථානයට යෑමෙන් පසු, ඉවත් කරන ලද පුද්ගලයින්ට අවශ්‍ය කඩිනම් ඉඳුම් හිටුම් පහසුකම් සැපයීම ඇතුළු වහාම මැදිහත්විය යුතු ගැටලු කිහිපයක් කොමිෂන් සභාව විසින් හඳුණා ගන්නා ලදී. මෙම ඉවත් කිරීම් සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ රැස්වීමක් කැඳවා, පූර්ව දැනුම්දීමකින් තොරව කටයුතු කිරීම කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කර, ඉවත් කිරීමේදී ගත හැකිව තිබූ යම් යම් විකල්ප පියවර යෝජනා කරන ලදී. එසේම, අදාළ ප්‍රජාව වහාම වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම හෝ පදිංචි කරවීම සැලසුම් කරන ලෙස අදාළ බලධරීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

# 4 වන පරිච්ඡේදය :

# පර්යේෂණ හා අධීක්ෂණ කටයුතු

4.1. තේමාත්මක අනු කාරක සභා

4.2. දියත් කරන ලද අධ්‍යයන

4.3. මෙහෙයුම් පාලන ක්‍රියාකාරකම්

# 04 පර්යේෂණ හා අධීක්ෂණ කටයුතු

## 4.1. තේමාත්මක අනු කාරක සභා

කොමිෂන් සභාව විසින්, මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම උදෙසා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට උපදෙස් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස තමන් වෙත පැවරී ඇති කාර්ය භාරය ප්‍රකාර, විශේෂිත තේමාත්මක ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස අනු-කාරක සභා 09ක් පත් කරන ලදී. ශ්‍රී ලංකා රජය හා කළ යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් මෙන්ම ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයන් ඉදිරියේ අවශ්‍ය නියෝජනයන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස එක් එක් තේමාවට අදාළ නීති, ප්‍රතිපත්ති සහ නිල වත්පිළිවෙත් සමාලෝචනය කිරීම අනු-කාරක සභා වලින් අපේක්ෂිත කාර්යයයි. අනු කාරක සභා සාමාජිකත්වය විශේෂඥයින්ගෙන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විතය. එක් එක් කාරක සභාව කොමසාරිස්වරයෙකුගේ හෝ කොමසාරිස්වරුන් වැඩි සංඛ්‍යාවකගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩල සාමාජිකයෝ මෙම අනුකාරක සභාවල ලේකම්වරුන් ලෙස කටයුතු කරති. අනු කාරක සභා නම්:

1. ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ අනු-කාරක සභාව
2. අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ අනු-කාරක සභාව
3. සමලිංගික හා ඒ ආශ්‍රිත(LGBTIQ) පුද්ගලයින් පිළිබඳ අනු කාරක සභාව
4. වතු සේවක අයිතිවාසිකම් පිළිබඳ අනු-කාරක සභාව
5. හිංසනය සහ අත්අඩංගුවේදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ අනු-කාරක සභාව
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනු-කාරක සභාව
7. වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ අනු-කාරක සභාව
8. ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අනු-කාරක සභාව
9. සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් පිළිබඳ අනු-කාරක සභාව

2016 වසර තුළදී, බොහෝ අනු -කාරක සභා, එක් එක් තේමාත්මක වපසරිය තුළ ප්‍රමුඛත්වය දිය යුතු ගැටලු හඳුණා ගැනීමෙහි නියැලුණාහ. උදාහරණයක් වශයෙන්, වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීතිරීතිවල ප්‍රමාණවත්බව, සෞඛ්‍ය සත්කාර සහ නීති සහනාධාර ඇතුළු වැඩිහිටි සේවාවන්ට ප්‍රවේශවීමේ අවශ්‍යතාවය වැනි මැදිහත්වීමක් අවශ්‍ය කරුණු වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ අනු-කාරක සභාව විසින් හඳුණා ගන්නා ලදී; ආබාධ සහිත

පුද්ගලයින් පිළිබඳ අනු-කාරක සභාව විසින් ආබාධිතත්ව අයිතිවාසිකම් පනත් කෙටුම්පත අනුමත කරවා ගැනීමේ ක්‍රියාදාමය සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ අදාළ නිර්දේශ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන ලදී; සමලිංගික හා ඒ ආශ්‍රිත (LGBTIQ) පුද්ගලයින් පිළිබඳ අනු කාරක සභාව විසින්, සමලිංගික හා ඒ ආශ්‍රිත (LGBTIQ) පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වලට අදාළ වූ නීති සංශෝධනයන්, සමාජභාවය පිළිබඳ සහතික නිකුත් කිරීම පිළිබඳ චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය, සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින්ගේ වෛද්‍ය අවශ්‍යතා සඳහා රාජ්‍ය සහාය, පාසල් විෂය මාලාවලට ලිංගික අධ්‍යාපන විෂයය ඇතුළත් කිරීම වැනි කරුණු මැදිහත්වීමක් අවශ්‍ය කාරණා ලෙස හඳුණා ගන්නා ලදී.; අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳ අනු-කාරක සභාව විසින්, අධ්‍යාපනයේ දර්ශන විද්‍යාව, ශික්ෂක වර්ධනය, පාසල් ව්‍යුහය සහ වැඩසටහන් වල අන්තර්ගතය සහ පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ අවශ්‍යතාව තවදුරටත් අධ්‍යයනය කළයුතු විෂයයන් ලෙස හඳුණා ගන්නා ලදී.

## 4.2. දියත් කරන ලද අධ්‍යයනයන්

කොමිෂන් සභාව විසින්, නිදහස අහිමිවූ දරුවන් සම්බන්ධයෙන් බහු-ශික්ෂිත අධ්‍යයනයක් දියත් කෙරිණ. ඒ සඳහා ළමා සත්කාරක ආයතන වෙත විසැරි 12ක් සංවිධානය කරන ලදී. පර්යේෂණයට උරදුන් බහු-ශික්ෂිත කණ්ඩායම නීතිඥයෙකු, මනෝ විද්‍යාඥයෙකු සහ සමාජ ක්‍රියාකාරකයෙකුගෙන් සමන්විත විය. අධ්‍යයනය පවත්වා ගැනීමෙහිලා ප්‍රාදේශීය කාර්යාලවල සම්බන්ධීකරකවරුන් සහ කාර්ය මණ්ඩලවල සහාය කණ්ඩායමට ලැබිණ. එහි නිර්දේශ පරිවාස දෙපාර්තමේන්තුව, පරිවාස කොමසාරිස්වරුන්, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වැනි රාජ්‍ය බලධාරීන් වෙත 2017 වසරේදී ඉදිරිපත් කිරීමට නියමිතය.

## 4.3. මෙහෙයුම් පාලන ක්‍රියාකාරකම්

රැඳවියන්ගේ සුබ සාධන කටයුතු අධීක්ෂණය කිරීම පිණිස රැඳවුම් ස්ථාන කරා යාමට සහ රඳවා ගෙන සිටින්නවුන්ගේ අයිතිවාසිකම්වල ගරුත්වය සහ ආරක්ෂාව සහතික කිරීමේ අරමුණින් රැඳවුම් තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය, පනතේ 11 සහ 28(2) ව්‍යවස්ථා යටතේ කොමිෂන් සභාවට පැවරී ඇත. එකී බලතල භාවිතා කරමින්, රාත්‍රිය සහ සති අන්ත ඇතුළුව, වර්ෂය මුළුල්ලේ නොදන්වා (අනපේක්ෂිතව) රැඳවුම් ස්ථාන පරීක්ෂා කිරීම් කොමිෂන් සභාව විසින් සිදු කෙරේ. මෙකී පරීක්ෂාවන් ප්‍රධාන කාර්යාලය මෙන්ම ප්‍රාදේශීය කාර්යාල විසින් ද සිදු කෙරේ. ක්‍රමිකව පොලිස් ස්ථාන පරීක්ෂාවට යාමට අමතරව, බන්ධනාගාර, රක්ෂිත බන්ධනාගාර, ළමා නිවාස, ආබාධිත පුද්ගල නිවාස, සහ ආගමන රැඳවුම් මධ්‍යස්ථාන වැනි අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථානද එසේ පරීක්ෂාවට ලක් කෙරේ. මෙම පරීක්ෂණ විසැරිවලදී, රැඳවියන් විසින් හිංසනය සහ නීතිවිරෝධීව සැළකීම් සම්බන්ධයෙන් කරනු ලබන චෝදනා කොමිෂන් සභාව විසින් විමර්ශනයට භාජනය කෙරේ.


- **පොලිස් ස්ථාන පරීක්ෂාව**

2016 දී, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය විසින් නියැලෙන ලද පොලිස් ස්ථාන විසැරි සංඛ්‍යාව 579 කි. මෙකී විසැරි සමස්ත දිවයින පුරා විහිදී ඇති හඳුණාගත් මාර්ග 16ක් ඔස්සේ සිදු කෙරේ. මෙම විසැරිවල අරමුණ වන්නේ, කාර්යක්ෂම ප්‍රගාමී සහ ප්‍රතික්‍රීය පියවර ඔස්සේ, හිංසන සිද්ධීන් ශ්‍රී ලංකාවෙන් මුලිනුපුටා දැමීම, එවන් උල්ලංඝණයන් සිදු කරනු ලබන නිලධාරීන් හඳුණා ගැනීමට

සහ කළ යුතු පිළියම් නිර්දේශ කිරීමට පියවර ගැනීමට අමතරව, හිංසන සිද්ධීන් වළක්වාලීම පිණිස අනෙකුත් අදාළ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය නොවන හා සමග සම්බන්ධීකරණය සහ සහයෝගීතාවය පවත්වා ගෙන යාමයි.

| ගමන් මාර්ගය ( අංකය) | මාර්ගස්ථ විසැරි සංඛ්‍යාව-2016 |
|---|---|
| දෙමටගොඩ-මෝදර ( 1ඒ) | 04 |
| මරදාන-පිළියන්දල ( 1(බී) | 03 |
| නාරාහේන්පිට-කොල්ලුපිටිය ( 1-සී) | 07 |
| ගල්කිස්ස-අළුත්ගම (2) | 08 |
| කඩවත-කෑගල්ල (3) | 04 |
| මහරගම-රත්නපුර (4) | 03 |
| රත්නපුරෙන් බැහැර- කලවාන-උඩවලව (5) | 02 |
| කුරුණෑගලින් බැහැර - අඹන්පොල (6) | 01 |
| මිනුවන්ගොඩ-කුලියාපිටිය (7) | 01 |
| නාරම්මල-ආනමඩුව (8) | 02 |
| වත්තල-මීගමුව (9) | 07 |
| වැල්ලම්පිටිය-යටියන්තොට-අවිස්සාවේල්ල (10) | 04 |
| පෑලියගොඩ-දොම්පේ (11) | 08 |
| කොච්චිකඩේ-කල්පිටිය (12) | 04 |
| දොඩංගොඩ-මතුගම (13) | 01 |
| වේවැල්වත්ත-පනාමුර (14) | 00 |
| මාර්ගස්ථ විසැරි එකතුව | 58 |
| විසැරියෙහි යෙදුණ පොලිස් ස්ථාන සංඛ්‍යාව | 579 |

මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය විසින් එක් එක් මාසයෙහිදී කරන ලද මාර්ගස්ථ විසැරි සංඛ්‍යාව සහ එක් එක් මාසයේදී නියැලෙන ලද පොලිස් ස්ථාන විසැරි සංඛ්‍යාව පහත දැක්වෙන ප්‍රස්තාරයෙහි දැක්වේ. ප්‍රාදේශීය කාර්යාල නියැලෙන ලද පොලිස් ස්ථන විසැරි විස්තර සඳහා 7 වන ඡේදය බලන්න)



මෙම විසැරිවලදී, පහත දැක්වෙන ගැටලු ඇතුළු පොදු ගැටළු කිහිපයක් හඳුණා ගන්නා ලදී.

- අත්අඩංගුවට ගැනීමේදී විධිමත් ක්‍රියාදාමයට අනුගතවීමට අපොහොසත්වීම
- අත්අඩංගුවේ පසුවෙද්දී නොමනා ලෙස සැළකීම සහ හිංසනය
- උසාවි වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය
- සිරකුටි තුළ තදබදය සහ මූලික උපයෝගිතා හිඟය

හිංසනය, නොමනාලෙස සැළකීම සහ රැඳවුම් තත්ත්වයන් ගැන අවධානය යොමු කරවාලීම පිණිස කොමිෂන් සභාව විසින් කෙරෙන ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලදී, මෙම නිරීක්ෂණයන් පුනර්කෘතව මතුකර පෙන්වාදීමට ක්‍රියා කර ඇත.

## ▪ අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථාන ( පොලිස් ස්ථාන නොවන) අධීක්ෂණය

සෑම මසකම, යටත් පරිසෙයින් පොලිස් ස්ථාන නොවන රැඳවුම් ස්ථාන විසැරි 02 ක වත් නියැලීමට කොමිෂන් සභාව වගබලා ගනී. මෙම විසැරි සාමාන්‍යයෙන් කරනු ලබන්නේ කොමිෂන් සභාවෙහි බහුවිධ-ශික්ෂිත කණ්ඩායමක් විසිනි. බන්ධනාගාර විසැරිවලදී, සිර කුටිවල තදබදය සහ සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිවීම නිරීක්ෂණය කරන ලද අතර, සමහර අවස්ථාවලදී බලධාරීන් හා සාකච්ඡා කර ස්ථානීයව පියවර ගන්නා ලදී. අනෙකුත් රැඳවුම් ස්ථානවල නිරීක්ෂණය කරන ලද ආරක්ෂාවේ සහ රැඳවුම් තත්ත්වයන්හි අඩුපාඩු අප්‍රමාදව අදාල බලධාරීන්ගේ අවධානයට යොමු කරවන ලදී. (ප්‍රාදේශීය කාර්යාල විසින් අනෙකුත් රැඳවුම් ස්ථානවලදී කරන ලද අධීක්ෂණයන් පිළිබඳ විස්තර සඳහා 7 වන පරිච්ඡේදය බලන්න.)

| ආයතනය | ප්‍රධාන කාර්යාලය නියැලෙන ලද විසැරි සංඛ්‍යාව |
|---|---|
| බන්ධනාගාර | 14 |
| ත්‍රස්ත විමර්ශන දිසාව | 14 |
| ළමා සත්කාරක නිවාස | 13 |
| ගැසට් කර ඇති රැඳවුම් ස්ථාන | 1 |
| පුනරුත්ථාපන මධ්‍යස්ථාන | - |
| වැඩිහිටි නිවාස | - |
| විදේශිකයින් රඳවා ඇති ස්ථාන | 3 |
| **එකතුව** | **45** |

( අනෙකුත් රැඳවුම් ස්ථානවල නියැලෙන ලද අධීක්ෂණ විසැරි)

- **අනෙකුත් අධීක්ෂණ ක්‍රියාකාරකම්**

උපදේශන ක්‍රියාදාමයෙහි නියැලෙන පිරිසට එල්ල වන තර්ජන සහ හිරිහැර වලට අදාළ පැමිණිලි භාර ගැනීමට සහ ප්‍රතිචාරය දැක්වීම පිණිස කොමිෂන් සභාවෙහි ඒ සම්බන්ධයෙන් නිලධාරියෙකු පත් කිරීම මගින්, සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ උපදේශන කාර්යසාධන බලකායෙහි කටයුතු සුසාධ්‍යරකණය කිරීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

මෙයට අතිරේකව, ස්වකීය පැවරුම් කාර්ය භාරය ඉටු කිරීමෙහිලා, කොමිෂන් සභාව විසින් කරුණු විමසීමේ විසැරි ගණනාවක සහ පසු විපරම් විසැරි ගණනාවක නියැලෙන ලද අතර, දරුවෙකුගේ අධ්‍යාපන අයිතිවාසිකම් අහිමි කිරීමේ සිට දිවයිනේ විවිධ පළාත් මහත් පීඩාවන්ට භාජනය කරමින් පැතිරෙන පාරිසරික ගැටළු දක්වා දහසකුත් එකක් ගැටළු විමර්ශනයට භාජනය කෙරිණ.

- රතුපස්වල ප්‍රදේශයේ, කර්මාන්තශාලාවක නිෂ්පාදන මෙහෙයුම් නිසා ඇතිවූ ජලය අපවිත්‍රවීමට එරෙහිව ප්‍රදේශවාසීන් විසින් දියත් කරන ලද විරෝධතාවයකට එල්ල කරන ලද ප්‍රහාරයට ප්‍රතිචාර වශයෙන් , පානීය ජල අයිතිවාසිකම් පිළිබඳ රාජ්‍ය ආයතනවල වගකීමට අදාලව 2014 වසරේදී නිකුත් කරන ලද ස්වකීය වාර්තාවට තදනන්තරව, රතුපස්වල ප්‍රදේශයේ පසු විපරුම් විසැරියක නියැලීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා තරුණ පුවත්පත්වේදීන්ගේ සම්මෙලනය හා සමග සමාලෝචන රැස්වීමක්ද පවත්වන ලදී.

- එච්අයිවී ආසදනයට භාජනය වී ඇතැයි යන සැකය මත අධ්‍යාපන අයිතිවාසිකම් අහිමිවීමේ තර්ජනයට මුහුණ පා ඇති පාසල් දරුවාගේ ගැටළුවට අදාලව කරුණු එක්රැස්කිරීමේ විසැරියක් කුලියාපිටියේදී සිදු කරන ලදී.

- සාලාව ප්‍රදේශයේ යුද හමුද කඳවුරේ ඇතිවූ යෝධ ගින්න නිසා සිදුවූ පිපිරීම් සහ සිවිල් ජනතාව කෙරෙහි ඇතිවූ බලපෑම් විමර්ශනය කිරීම පිණිස තවත් විසැරියක නියැලුණි.

- මහනුවර, අම්බුලුව ප්‍රදේශයේ කුණු කසළ බැහැර කිරීම හේතු කොට ගෙන ඇතිවී තිබෙන්නාවූ පරිසර දූෂණය නිසා ප්‍රදේශවාසීන්ට අත්විඳින්නට සිදුවී ඇති බරපතල සෞඛ්‍ය උපද්‍රවයන් හා පාරිසරික ගැටළු පරීක්ෂණයකට කොමිෂන් සභාව එම ප්‍රදේශයේ විසැරියක නියැලෙන ලදී.

- ස්වාභාවික ආපදාවන්ගෙන් පසු සහන සැලසීමේ ප්‍රයත්න මාලාවන් අධීක්ෂණය කිරීමේ කාර්යභාරය උදෙසා, අරණායක සහ මීරියබැද්ද නායයෑම්වලින් පීඩාවට පත්වූවන්ගේ සැපදුක් සොයා බැලීමටත්, 2016 වසරේදී අධික වර්ෂාපතනය නිසා පීඩාවට පත් ප්‍රදේශ අධීක්ෂණය කිරීමටත් කොමිෂන් සභාව විසින් පියවර ගැණින.

# 5 වන පරිච්ඡේදය :

## අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්

5.1. ජනතා දැනුවත්බව ඉහළ නැංවීම

5.2. මාධ්‍ය හා සමග නිමග්නවීම

5.3. සිවිල් සමාජ හා නිමග්නවීම

5.4. උපදේශනය

# 05 අධ්‍යාපනය සහ විශේෂ වැඩසටහන්

## 5.1. ජනතා දැනුවත්බව ඉහළ නැංවීම

පනත යටතේ පැවරී ඇති ආකාරයට, මානව අයිතිවාසිකම් ගැටලු සම්බන්ධයෙන් ජනතා දැනුවත්වීම සහ සංවේදනීයතාවය ඉහළ නැංවීමෙහි සක්‍රියව නිමග්නවීමට කොමිෂන් සභාව දැඩි උත්සාහයක නියැලී සිටී. කොමිෂන් සභාවේ පැවැත්ම හුදෙක් පුරවැසි සමූහයාගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ ඒකායන අරමුණ උදෙසාම වන හෙයින්, ජනතාව කොමිෂන් සභා කාර්යභාරයෙහි අඛිල හා අනුකලනීත කොටසක් ලෙස සැළකේ. එමනිසා, මෙකී අරමුණ සාක්ෂාත්කර ගැනීමෙහි ලා ඉතා වැදගත් සිද්ධීන් ගණනාවකින් 2016 වසර සනිටුහන් වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද, ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් දින සැමරුම, සිවිල් සමාජයේ, ආරක්ෂක හමුදාවල, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල හා විදේශීය රාජ්‍ය දූතමණ්ඩලවල නියෝජිතයින්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන්, 2016 දෙසැම්බර් මස 09 වන දින, කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ, බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.



ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් දිනය-2016

'යමෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න' තේමාව මත පදනම්ව, සභාපතිතුමිය විසින් ස්වකීය පිළිගැනීමේ දේශනයේදී, අද ලෝකයේ අනෙකාගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටීමේදී බහුවිධත්වය පිළිගැනීම මුහුණ පෑමට සිදුවන බරපතල අභියෝගය ලෙස හඳුනා ගනිමින්, අවධාරණය කරන ලද්දේ, ප්‍රධානතම අදියර හතරකින්, එනම්: මානව අයිතිවාසිකම් ප්‍රමිතීන් පිළිගැනීම; මානව අයිතිවාසිකම් යාන්ත්‍රණයන් පිළිගැනීම; මානව අයිතිවාසිකම් අධ්‍යාපනය සුසධ්‍යකරණය; සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමදී අපගේ වගකීම හඳුනා ගැනීම ; සමන්විත මානව අයිතිවාසිකම් රැකගැනීමේ පරිපූර්ණ කවයක් අප විසින් සම්පූර්ණ කර ඇති බවය.

වැඩ සටහනෙහි ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ, ශ්‍රී ලංකාවේ, කටුනායක නිදහස් වෙළඳ කලාපයෙහි කාන්තා ශ්‍රමිකයින් නියෝජනය කරමින් සපැමිණි, ශ්‍රමික සංසදයක් වන 'දා බිඳු' එකමුතුව සංවිධානයේ වැඩසටහන් සම්බන්ධීකාරකතුමියයි. නිදහස් වෙළඳ කලාපයෙහි කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා 21ක් වසරක් පුරා සේවයෙහි යෙදී ලත් අත්දැකීම් හා පළපුරුද්ද ඇය මෙහිදී බෙද හදා ගත්තාය. මෙයට අමතරව, කාන්තා හිංසනය, ආබාධිතයින්ගේ අයිතිවාසිකම්, සහ කාන්තා අභිවෘද්ධිය වැනි ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන්නාවූ මානව



ආබාධිතත්ව අයිතිවාසිකම් ක්‍රියාකාරකයෙකු සභාව අමතමින්

අයිතිවාසිකම් ක්‍රියාකාරීන් කිහිප දෙනෙක්ද 'යමෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න' තේමාව'ශ්‍රිත අත්දැකීම් සහ පළපුරුද්ද බෙදා හදා ගත්හ.

- **ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුම**

ව්‍යාපාර ලාංඡනය

2016 ජාත්‍යන්තර කාන්තා දින සැමරුමේ තේමාව වූයේ 'ඇගෙන් තොර ලොවක් ? ' යන්නයි. සැමරුමෙහි කොටසක් ලෙස දීපව්‍යාප්තව විහිදී ගිය ඉසව් ගණනාවක්ම පවත්වන ලදී. සමස්ත තේමාවම ආවරණය වන පරිදි, ලාංඡනයක් නිර්මාණය කිරීමට සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ චන්ද්‍රගුප්ත තේනුවර මහතා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය.

උත්සවයෙහි විශේෂිත අවස්ථාව වූයේ, විවිධ අංශයන්හි අනූපම නායකත්ව ගුණාංගයන් ගෙන් හෙබි කාන්තාවන්ගෙන් සැදුම්ලත් බහුවිධ මඩුල්ලකට ආරාධනය කරමින් පවත්වන ලද මඩුලු සාකච්ඡාවයි. මෙම මඩුල්ල ඇඟළුම් කර්මාන්ත අංශයෙහි කාන්තා තාක්ෂණික ශිල්පිනියක්, මධ්‍යම පළාත් පළත් සභාවේ සාමාජිකාවක්, මොණරාගල දිස්ත්‍රික්කයේ, සිවිල් සමාජ සම්පත් ආරක්ෂණ ප්‍රධානි, ධනාත්මක කාන්තා පද්ධතියේ, එච්අයිවී ආසාදිත සිවිල් සමාජ ක්‍රියාකාරිණියක්, මුලතිව් දිස්ත්‍රික් පුරවැසි කමිටුවේ ලේකම්, තරුණ නීති වේදිනියක් සහ නායකත්ව කාර්යභාර සිවිල් සමාජ ක්‍රියාකාරීන් දෙපළකින් සමන්විත විය. මඩුලු සාකච්ඡාවේ අරමුණ වූයේ, නිසි පිළිගැනීමකට ලක් නොවී දිවයින පුරා සැඟවී ඇති කාන්තා නායකත්වය කරළියට ගෙන ඒමයි.



සෞන්දර්යකලා විශ්ව විද්‍යාලයේ ආචාර්ය සෞම්‍ය ලියනගේ මහතා ප්‍රධාන දේශනය පවත්වමින්, සමාජයක කාන්තා භූමිකාවේ සිත්ගන්නා සුළු ඇතුළාන්තය පිරිමි දෘෂ්ඨී කෝණයකින් විග්‍රහ කරමින් ඉසව්ව වර්ණවත් කළේය. පවුල් තුළ මෙන්ම පුළුල් සමාජයේදී ද කාන්තාව විසින් රඟ දක්වනු ලබන භූමිකාවෙහි බහුවිධතාවය, කාන්තාවන් ලෙස ඔවුන් මුහුණ දෙන අභියෝගයන් සහ සමාජය විසින් කාන්තාවට එරෙහිව බලාත්මක කර ඇති යටත් විජිත සංකල්ප එතුමාගේ දේශනයේ ගැබ්විය.



ආචාර්ය සෞම්‍ය ලියනගේ මහතා ප්‍රධාන දේශනය පවත්වමින්

සැමරුමෙහි කොටසක් ලෙස, කාන්තාවන්ගේ සහ ඔවුන්ගේ අයිතිවාසිකම්වල වැදගත්කම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම පිණිස, ස්ටිකර් ව්‍යාපාරයක්ද සංවිධානය කෙරිණ. පිටකොටුවේ ප්‍රධාන බස් නැවතුම්පළින් ආරම්භ වී කෙටි හා දුර ධාවනයේ යෙදෙන බස්රථවල, 2016 තේමාව නිරූපණය කෙරෙන ස්ටිකර් ප්‍රදර්ශනය කෙරිණ. ඉන් අනතුරුව, කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වැදගත්කම රැගත් පණිවුඩය ප්‍රචාරණය කිරීමේ ප්‍රයත්නයක් ලෙස, බස් මගීන් හා සමග නොනිල සාකච්ඡාවන්ද සිදු කෙරිණ.

තවද, පාසල් ශිෂ්‍යයින්ට මෙන්ම උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වයන්ට විවෘත වූ වීඩියෝ තරඟයක්ද පවත්වන ලදී. මෙම තරඟය හරහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අරමුණු කරන ලද්දේ සමකාලීන සමාජයෙහි කාන්තාවන් විසින් රඟ දක්වනු ලබන භූමිකාව අනුමාන කරමින්, වටහා ගන්නට පොදු ජනතාව තවදුරටත් උනන්දු කරවීමයි. මෙම තරඟයට සිංහල, දෙමළ හා ඉංග්‍රිසි පුවත්පත්වල ප්‍රසිද්ධිය ලබා දෙන ලදී. ප්‍රතිචාර ලෙස, වීඩියෝ 07ක් (පාසල් දරුවන්ගෙන් 02ක් සහ විවෘත කාණ්ඩයෙන් 05ක්) කොමිෂන් සභාව වෙත ලද නමුත්, අවාසනාවකට මෙන් එකම වීඩියෝවක් වත් තෝරා ගැනීම සඳහා සුදුසු තත්ත්වයක නොවීය.

- **ඩිජිටල් සංඥාපුවරු ප්‍රදර්ශනය**

ඩිජිටල් යුගය වැළඳ ගනිමින්, ජනතා අයිතිවාසිකම් මත වැදගත් පණිවුඩ රැගත් ඩිජිටල් සංඥා පුවරු මාසයක කාල පරාසයක් තුළ, කොළඹ නගරය පුරා ප්‍රමුඛ ස්ථානයන්හි ප්‍රදර්ශනය කිරීමට සීමාසහිත අබාන්ස් (පුද්.) සමාගම සමග ගිවිසුම්ගත වීමට කොමිෂන් සභාව කටයුතු කරන ලදී. තෝරාගත් එක් ස්ථානයක (ආර්.ඒ ද මෙල් මාවත) අතිරේක සති දෙකකට ගෙවීමකින් තොරව මෙම සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීමටද සමාගම එකග විය. කොමිෂන් සභාව විසින් නිර්මාණය කරන ලද, ' වධ හිංසාවට තිත' යන තේමාව මත තත්පර 12 ක සජීවී වීඩියෝ දර්ශනද, එකී පුවරු මත ප්‍රදර්ශනය කිරීමට කටයුතු කෙරිණ. ඩිජිටල සඥා පුවරු මගින් කොමිෂන් සභාවේ පණිවුඩ අති මහත් ප්‍රේක්ෂක ජනතාවකට සමීප කිරීමට ඇති හැකියාව නිසා, කොමිෂන් සභාව විසින් මෙම ප්‍රදර්ශන මාදිලිය තෝරා ගන්නා ලදී.

- **හිංසන වින්දිතයන්ට සහාය දැක්වීමේ ජාත්‍යන්තර දිනය සැමරීම**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හිංසන වින්දිතයන්ට සහාය දැක්වීමේ ජාත්‍යන්තර දිනය සමරන ලද්දේ ' **වධහිංසාවට තිත**' යන තේමාව පදනම් කර ගනිමිනි. දීපව්‍යාප්ත ව්‍යාපාරය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේදී දියත් කරන ලද අතර, එහි ප්‍රාදේශීය කාර්යාල 10 විසින් ක්‍රියාදාමය අනුගමනය කෙරිණ. ජාතික ව්‍යපාරය ජනතා පා ගමනකින් ආරම්භ කරන ලද අතර, සැමරුම් උත්සවය නිදහස් චතුරශ්‍රයේදී පවත්වන ලද්දේ, අතිගරු ජනාධිපතිතුමන් සහ නීතිය හා සාමය පිළිබඳ ගරු අමාත්‍යතුමන් මෙන්ම ආගමික නායකයින්, ස්වාධීන කොමිෂන් සභාවල නියෝජිතයින්, රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදා, පොලිසිය, සිවිල් ආරක්ෂක සේනා, පාසල් දරුවන්, තාරුණ්‍යය, සිවිල් සමාජ කණ්ඩායම්, හිංසන වින්දිතයින්ගේ පවුල්වල සාමාජිකයින් ඇතුළු පොදු ජනතා සාමාජිකයින්ගේ සහභාගිත්වයෙනි.




පා ගමනට සහභාගී වී




සැමරුම් උත්සවයේදී කාර්ය සාධනය

- **ලිංගික අනුස්ථාපනය, සමාජභාවී අනන්‍යතාවය සහ ලිංග නෛසර්ගික ලක්ෂණ වලට අදාළව මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ වැඩ මුළුව පැවැත්වීමට සත්කාරය (SOGI Rights)**

සමලිංගික (LGBTIQ) ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමට පක්ෂපාතබව ශක්තිමත් කිරීම පිණිස, ඔවුන් හා නිමග්නවීමෙහි ලා, කලාපයේ ජාතික මානව අයිතිවාසිකම් ආයතන සහ සිවිල් සමාජ සංවිධානයන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම උදෙසා, ආසියා ශාන්තිකර පදනම (ඒපීඑෆ්) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (යූඑන්ඩීපී) විසින් සංවිධානය කරන ලද ලිංගික අනුස්ථාපනය, සමාජභාවී අනන්‍යතාවය සහ ලිංග නෛසර්ගික ලක්ෂණ වලට අදාළව මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ වැඩමුළුව පැවැත්වීමට සත්කාරය දක්වන ලද්දේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසිනි. මෙය සංරචක දෙකකින්, එනම්: මාර්ගගත පාඨමාලාවක් සහ කොළඹදී මුහුණට මුහුණලා කෙරෙන වැඩමුළුවක්: සමන්විත මිශ්‍රිත ශික්ෂණ පාඨමාලාවක් විය. රටවල් 07ක නියෝජිතයෝ මෙයට සහභාගී වූහ.

- **ජංගම සේවා සඳහා සම්පත්**

මේ අතරතුර, කොළඹ නාගරික ප්‍රදේශවල ආන්තරික කණ්ඩායම් සඳහා ජාතික සහජීවනය, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජංගම සේවාවන් සඳහා කොමිෂන් සභාව විසින් සම්පත් සලසා දෙන ලදී.

- **කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සම්පත් දායකයන් ලෙස ලද ආරාධනා**

පෙර වර්ෂවලදී මෙන්ම, රාජ්‍ය අංශයෙහි බොහෝ බහුවිධත්ව සංසද මෙන්ම සිවිල් සමාජ සංවිධානයන් විසින්ද සම්පත්දායකයන් ලෙස කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ආරාධනය කෙරිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, මානව අයිතිවාසිකම් හා මානුෂීය නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සුළු ජාතික අයිතිවාසිකම් හා මානව අයිතිවාසිකම් යන මැයෙන් යුද හමුදා පිරිස් සඳහා පැවැත්වෙන සම්මන්ත්‍රණයකට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන්ට ආරාධනා කෙරිණ. එසේම, කොළඹ, තැපැල් කළමනාකරණ අභ්‍යාස විද්‍යාලයෙහි විමර්ශන නිලධාරීන් සඳහා වූ වැඩමුළුවකටද, කොළඹ දකුණ ශික්ෂණ රෝහලෙහි හෙදියන් සඳහා සංවිධානය කරන ලද රෝගීන්ගේ අයිතිවාසිකම්/මානව අයිතිවාසිකම් පිළිබඳ සැසියකටද ආරාධනා ලැබිණ. තවද, සංකාන්ත්‍රික සමාජභාවීන්ගේ මානව අයිතිවාසිකම් සහ අනන්‍යතාවයට අයිතිය මත වැඩ මුළුවකටද හාට් ටු හාට් සංවිධානයෙන් ආරාධනය කෙරිණ.

- **බාහිර ඉසව්වල සහභාගිත්වය**

අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලය සම්බන්ධව සිවිල් සමාජය හා සමග පැවැති විවෘත සංවාද සැසිය සහ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරනලද

ජාතික උපදේශන ක්‍රියාදාමය වැනි බාහිර පාර්ශ්වයන් විසින් සංවිධානය කරන ලද ඉසව් ගණනාවකටම සහභාගීවීමේ අවස්ථාවද කොමිෂන් සභාවට උදාවිය.

## 5.2. මාධ්‍ය හා සමග නිමග්නවීම

කොමිෂන් සභාව විසින්, ස්වකීය බාහිර විහිදුම් ප්‍රයත්නයක් ලෙස, තීරණාත්මක ප්‍රස්තුතයන් මෙන්ම ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කර තැබීම පිණිස මාධ්‍ය හා නිමග්න වෙයි. කොමිෂන් සභාව, ස්වකීය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා සම්ප්‍රදායික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මෙන්ම මාර්ගගත වේදිකාවන්ද භාවිතයට ගනී

- **මානව අයිතිවාසිකම් පිළිබඳ කෙටි උද්ධෘත පාඨ මෙහෙයුම**

'මානව අයිතිවාසිකම් පිළිබඳ කෙටි උද්ධෘත පාඨ මෙහෙයුම' ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ජාතික සහ ප්‍රාදේශීය නාලිකා ඔස්සේ සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම විකාශණය කිරීම පිණිස කොමිෂන් සභාව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග සාකච්ඡා පැවැත්වීය. මූලාරම්භක ගිවිසුම මාස 5 ක් සඳහා වූ අතර, පසුව එය වර්ෂයකට දීර්ඝ කෙරිණ. 2016 දී, කාන්තා අයිතිවාසිකම් සහ හිංසනයෙන් නිදහස යන විෂයයන්ට අදාල කෙටි උද්ධෘත පාඨ මෙහෙයුම් 03 ක් විකාශනය කෙරිණ.

- **සම්ප්‍රදායික මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සමග නිමග්නවීම**

හිංසන වින්දිතයින්ට සහායවීමේ ජාත්‍යන්තර දිනය සැමරීම වස්, කොමිෂන් සභාවේ හිංසන ප්‍රතිරෝධ ව්‍යාපාරය ගැන ජනතාව වෙත විස්තර ලබාදීම පිණිස 2016.06.29 වන දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන්නට යෙදුණි.

කිලිනොච්චි සහ යාපනය දිස්ත්‍රික්කවල පුවත්පත්කලාවේදීන් සඳහා මානව අයිතිවාසිකම් මත පුහුණු වැඩ සටහනක්ද කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

- **මාර්ගගත වේදිකා භාවිතය**

කොමිෂන් සභාව විසින් ස්වකීය නිර්දේශ සියල්ල කොමිෂන් සභා වෙබ් අඩවියෙහි උඩුගත කිරීම ආරම්භ කරන ලදී. කලාපයේ සහ ගෝලීය වශයෙන් පුළුල් ශ්‍රාවක පිරිසකට තම ක්‍රියාකාරකම් විස්තර ප්‍රචාරණය කිරීම සඳහා කොමිෂන් සභාව ආසියානු ශාන්තිකර සංසදයේ තොරතුරු ප්‍රකාශණ මාධ්‍යය භාවිතයට ගනී.

## 5.3. සිවිල් සමාජ ක්‍රියාකාරකම් හා නිමග්නවීම

කොමිෂන් සභාව, විශේෂයෙන්ම, ස්වකීය ප්‍රාදේශීය කාර්යාල ඔස්සේ, සිවිල් සමාජය හා නිමග්න වෙයි. සිවිල් සමාජය කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් ඔප්නංවන මහත් සම්පතක් ලෙස දකින අතර, කොමිෂන් සභාව පෙරළා සහාය වීමක් වශයෙන්, මානව අයිතිවාසිකම් මත සිවිල් සමාජ

ක්‍රියාකාරකම්වලට දායක වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පහත දක්වා ඇති අකාරයේ විවිධ මාර්ග ඔස්සේ සිවිල් සමාජ ක්‍රියාකාරකම් හා නිමග්න වෙයි.

- **ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු**

කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු හරහා පෝෂණය කරනු ලබන සමීපස්ථ සහයෝගිතාවය, කොමිෂන් සභාවේ මැදිහත්වීම යෝග්‍යයැයි සැළකෙන මානව අයිතිවාසිකම් උල්ලංඝණයන් හෝ තත්ත්වයන් හඳුනාගැනීමෙහිලා ඉවහල් වේ. පොදු විෂයය ක්ෂේත්‍රයෙහි මානව අයිතිවාසිකම් ආරක්ෂාව අධීක්ෂණයෙහි ලා මෙකී අනු කමිටුවල සහාය කොමිෂන් සභාව වෙත ලැබේ.

- **සිවිල් සමාජ නියෝජිතයින් තේමාත්මක අනු කමිටුවල සාමාජිකයින් ලෙස.**

සිවිල් සමාජවල සහ සිවිල් සමාජ සංවිධානවල ප්‍රමුඛ මට්ටමේ සාමාජිකයෝ තවදුරටත් කොමිෂන් සභා ක්‍රියාකාරකම්වලට දායක වෙමින් තේමාත්මක අනු කමිටුවල සාමාජිකයින් ලෙස ක්‍රියා කරති. කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති මට්ටමේ පරිශ්‍රමයන් වඩාත් සඵල කරලීමෙහි ලා සිවිල් සමාජ සාමාජිකයින්ගේ කෘතහස්ත නිපුණත්වයේ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමේ අවස්ථාව එකී අනු කමිටු හරහා කොමිෂන් සභාවට උදා වෙයි.

- **සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරනු ලබන ඉසව්වලට සහභාගීවීම**


සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද ඉසව් ගණනාවකට කොමිෂන් සභාව සහභාගී විය. තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් නීති හා සමාජීය භාරයේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් වැඩසටහන විසින් සංවිධානය කරන ලද මඩුලු සාකච්ඡාව; ආසියා පදනම විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍යය සහ මනෝසාමාජීය උපකාරක සේවා සංක්‍රාන්ති වාර්තා(2004-2015) එළිදැක්වීම; බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ කාන්තාව හා සංවර්ධනය සංසදය (FOKUS) විසින් සංවිධානය කරන ලද ‘ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීම: ශ්‍රී ලංකාව තුළ ගර්භාව නිරාකරණය කරලීමේ ප්‍රයත්නය’ වැඩ මුළුව; කාන්තා හා මාධ්‍ය එකමුතුව විසින් සංවිධානය කරන ලද සමාජභාවි ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති සම්පාදනය මත උපදේශණය; ඉන් සමහරකි.

ශ්‍රී ලංකාවේ, සහයෝගිතා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ‘ පොදු ලැදියා නඩුහබ සහ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සාධාණත්ව ප්‍රවේශට අදාළව නීතිඥයින් උදෙසා අනු කලාපීය වැඩමුළුව’ට සහ සුළු ජනතා අයිතිවාසිකම් සමූහ ජාත්‍යන්තරය විසින් සංවිධානය කරන ලද ‘ දකුණු ආසියාවේ ආගම් ඇදහීමේ නිදහස ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම මත මූලාරම්භක ජාතික පද්ධතිකරණ රැස්වීමට’ සභාපතිතුමිය සහභාගී වූවාය.

# 5.4. උපදේශනය

වර්ෂ ගණනාවක හිඩැසකින් පසු, රටෙහි තාරුණ්‍යයෙහි ආයෝජනය, විශේෂයෙන්ම මානව අයිතිවාසිකම් ආරක්ෂාව සහ ප්‍රවර්ධනයෙහි ලා, නිවැරදි ඉදිරි පියවරක් බව වටහා ගැනීම හේතුවෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා සීමාවාසික වැඩසටහන යළි කරළියට ගෙන ඒමට කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. 2017 වසර පුරා ස්වේච්ඡා පදනමින් සේවය කිරීම සඳහා ඕනෑම විෂය ධාරාවක උපාධි අපේක්ෂකයින්ගෙන් සහ මෑතකාලීන උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණ වූයේ, පර්යේෂණ ඇතුළු ප්‍රවර්ධන සහ ආරක්ෂණ ක්‍රියාකාරකම් සහිත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ භූමිකාවට තෝරාගනු ලබන අයදුම්කරුවන් නිරාවරණය කිරීමත්, තාරුණ්‍යය තුළ පොදු ජන හිතකාමී ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම හා කැපවීම පෝෂණය කිරීමත්ය. සීමාවාසික පුහුණුව මාස 3 අවම කාලපරාසයක් සඳහා වූ අතර, ඔවුන්ට සිය මනාපය පරිදි ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල ස්වකීය සේවා ස්ථානය ලෙස තෝරා ගත හැකි විය. 2016 වසරේදී කොමිෂන් සභාව වෙත ලද අයදුම්පත් 282 න්, 24 දෙනෙකු සාර්ථක වූ අතර, ඔවුන් ප්‍රධාන කාර්යාලයට (07) සහ ප්‍රාදේශීය කාර්යාලවලට(17) අනුයුක්ත කෙරිණ.

වැඩ සටහනෙන් ලබාගත් දැනුම සහ වැඩ සටහන තවදුරටත් ශක්තිමත් කිරීමේ මාර්ග සම්බන්ධයෙන් අභ්‍යාසලාභීන්ගෙන් ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම පිණිස 2016 ජූනි මාසයේදී ප්‍රතිපෝෂණ සැසියක් පවත්වන ලදී.



# 6 වන පරිච්ඡේදය:

# ජාත්‍යන්තර සහයෝගිතාව


6.1. ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුගතවීම් ප්‍රවර්ධනය

6.2. ආසියානු ශාන්තිකර සංසදය හා සමග සබඳතා ශක්තිමත් කිරීම

6.3. ජාත්‍යන්තර සංවිධානවලට වාර්තා සහ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම

6.4. ජාත්‍යන්තර සංවිධාන සහ විශේෂඥයින් සමග වෙනත් සහයෝගිතා

# 06 ජාත්‍යන්තර සහයෝගිතාව

## 6.1. ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුගතවීම් ප්‍රවර්ධනය

2016 වර්ෂයේදී, ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර මානව හිමිකම් වගකීම්වලට අනුගතවීම් ප්‍රවර්ධනය කිරීමෙහි ලා ජාත්‍යන්තර හා කලාපීය මානව අයිතිවාසිකම් සංවිධාන සහ ආරක්ෂණ යාන්ත්‍රණයන් හා සමග සක්‍රීයව සංනිවේදනයෙහි යෙදීම සහ සහයෝගයෙන් කටයුතු කිරීම අඛණ්ඩව කර ගෙන යාමට මැතකදී පත් කරන ලද කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනයෙහි සහ ආරක්ෂා කිරීමෙහි ලා කොමිෂන් සභාවේ සක්‍රිය නිමග්නය සහ කැපවීම, මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ 2016 මැයි මස 08 දින දරන ලිපියෙහි සඳහන් වූ අතර, කොමිෂන් සභාවේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ප්‍රශංසාව පළ කර තිබුණි (පරිශිෂ්ඨ: 5 බලන්න) 2016 සැප්තැම්බර් මාසයේදී ස්වකීය ශ්‍රී ලංකා සංචාරයේදී , එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බෑන් කී මූන් මහතා විසින් පවත්වන ලද ප්‍රශංසාත්මක දේශනය නිසා, කොමිෂන් සභාවේ කැපවීම සහ කාර්යභාරය තවදුරටත් ඔප ගැන්විණ. මහ ලේකම් මෙන්ම මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ නිලධාරීන් සමුවීමේ අවස්ථාවද 2016 දී කොමිෂන් සභාවට උදාවිය.

2015 ඔක්තෝබර් සහ 2017 ජනවාරි අතර කාල වකවානුව තුළ, ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය මත, මානව අයිතිවාසිකම් කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීමෙහිලා සාක්ෂාත් කර ගත් ප්‍රගතිය තක්සේරු කරමින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වාර්තාවෙහි සඳහන් වූයේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග සමීපස්ථව කටයුතු කිරීමට මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා අඛණ්ඩව ක්‍රියා කළ බවයි. වාර්තාවෙහි තවදුරටත් සඳහන් වූයේ, " තීරණාත්මක ගැටලු සම්බන්ධයෙන් හඬ නගමින් මානව හිමිකම් කොමිෂන් සභාව සක්‍රියව කටයුතු කරන ලද්දේ වී නමුදු, නීතිකාරක ක්‍රියදාමයන්හිදී උපදේශනයෙහි යෙදීමේ සම්භාව්‍යතාවය ඌනභාවිතයට ලක්වෙමින් පවතී. මානව හිමිකම් කොමිෂන් සභාවට සහාය දැක්වීමේ, ඒ හා සමග ධනාත්මකව හා සක්‍රියව නිමග්නවීමේ හා එහි නිර්දේශයන් සැළකිල්ලට ගැනීමේ වැදගත්කම රජයට පුන පුනා හුවා දැක්වීමට මහ කෙමසාරිස්වරයා කැමති වේ." යන්නයි. එසේම, " නීති සම්පාදනය සහ කෙටුම්පත් සම්පාදනය සමාලෝචනයට භාජනය කිරීම ඇතුළුව, මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය භාරය සර්වප්‍රකාරයෙන් ඉටු කිරීම සඳහා එයට අවශ්‍ය සම්පත් නොඅඩුව ලබාදීම සහතිකවීම සහ සහාය වීම " ද වාර්තාවේ නිර්දේශිතව ඇත.

2016 වසරේදී, විනිසුරුවන්ගේ හා නීතිඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිත; සත්‍යය, සාධාරණත්වය හා හානිපූරණය සහ පුනරාවර්තනය නොවීම

තහවුරු කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිත; වධහිංසනය හා අනෙකුත් කෲර, අමානුෂික හෝ දඬුවම් පැමිණවීමේ අවමන් සහගත සැළකීම පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිත; සහ මානව අයිතිවාසිකම් රැකවලුන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිත; යන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂිත කාර්යභාරයන් උසුලන පාර්ශ්වකරුවන් සමුවීමට කොමිෂන් සභාවට අවස්ථාව උදාවිය. සභාපතිතුමිය හා කොමසාරිස්වරු මෙම නියෝජිතයින් හා සමග අනෝන්‍ය අදාළත්වයකින් යුත් ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර, වහාම ප්‍රතිචාර දැක්විය යුතු කරුණු ලෙස විශේෂ කාර්ය භාර උසුලන්නන් විසින් හුවා දක්වන ලද යම් යම් ගැටලු පිළිගන්නා ලදී.

විනිසුරුවන්ගේ හා නීතිඥයින්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා සහ සුළු ජාතීන් පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා, ස්වකීය ශ්‍රී ලංකා සංචාරයෙන් පසු ඉදිරිපත් කරන ලද වාර්තාවල “ මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධානීන් ලෙස අතිශයින් විශ්වාසණීය හා පරිණත කොමසාරිස්වරුන් පත් කර ඇති බවත් ” සඳහන් කරමින්, “නොසරිලන මූල්‍යමය, භෞතිකමය සහ මානව සම්පත් මෙන්ම අල්පවූ කාර්ය මණ්ඩල පුහුණුව හා විශේෂඥ ඥාණය; පොලිසිය ඇතුළු රාජ්‍ය ආයතන වෙතින් එල්ලවන ආයතනික ප්‍රතිරෝධය: මෙන්ම අවසාන නිගමනයන් හා නිර්දේශයන් ක්‍රියාත්මක කෙරෙන බව සහතික වීම පිණිස අවශ්‍ය බලාත්මක කිරීමේ බලතල නොමැතිකම; වැනි අභියෝගවලට මුහුණදීමට කොමිෂන් සභාවට අඛණ්ඩව සිදුවී ඇති බව” දැඩිව අවධාරණය කර ඇත. මෙම වාර්තා දෙකෙහිම “ප්‍රමාණවත් මානව හා මූල්‍යමය සම්පත් සලසමින්, මෙම ආයතනවලට සහ යාන්ත්‍රණයන්ට පිරිපුන් ආයතනික සහයෝගය ලබා දිය යුතු බව” මෙම වාර්තාවල නිර්දේශිතව ඇත.

“සැකකරුවෙකුගේ ප්‍රකාශය සටහන් කර ගන්නාතුරු, ඔහුට හෝ ඇයට නීතිඥයෙකු හමුවීමට ඇති අවස්ථාව අහිමිකරමින් හා එමගින් හිංසනය හා නොමනා ලෙස සැළකීම වළක්වාලීමට ඇති ආරක්ෂාව අහිමි කරවමින් මෙන්ම නඩු විධිවිධාන සංග්‍රහයෙන් අපේක්ෂිතම කාර්ය භාරය බල රහිත කරවමින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(3) ව්‍යවස්ථාවේ තහවුරුකර ඇති සාධාරණ නඩු විභාගයකට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරමින්, ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට පටහැනිව, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනතට මෑතකදී යෝජිත සංශෝධනයන් ” සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තැවුල, වධහිංසනය හා අනෙකුත් කෲර, අමානුෂික හෝ දඬුවම් පැමිණවීමේ අවමන් සහගත සැළකීම පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා විසින් යළිත් හුවා දක්වා ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ආයතනික සංවර්ධනය සඳහා ඇති අවශ්‍යතාවය හුවා දක්වමින්,වාර්තාව තවදුරටත් නිර්දේශ කරන්නේ “ නව ජාතික ආරක්ෂා නීති කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් ජාතික මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශයන් අධ්‍යයන කර නීතිගත කිරීම.....; නිදහස අහිමිවූ සියළුම තැනැත්තන්ගේ සියළුම ලියාපදිංචි කිරීම් සහ වාර්තා සංඛ්‍යාංකනය කිරීම සහ ඒවාට ප්‍රවේශවීමට ජාතික මානව අයිතිවාසිකම් කොමිෂන් සභාවට ඉඩ සැලසීම ...... නිදහස අහිමි කළ ස්ථාන ක්‍රමිකව, සක්‍රීයව හා ස්වාධීනව අධීක්ෂණය කිරීමට ජාතික මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව ඇතුළු ජාත්‍යන්තර හා ජාතික අයතන වලට බලය දීම හා සුසාධ්‍යකරණය ..... බලධාරීන් විසින් සිදු කළ යුතු” බවය.

මීට අතිරේකව, සභාපතිතුමිය, දුරස්ථ ටෙලිසම්මන්ත්‍රණයක් ඔස්සේ, සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් මත එක්සත් ජාතීන්ගේ කමිටුව වෙත ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද සාමයික

වාර්තාව සමාලෝචනය කිරීමේ සැසියට සහභාගී වෙමින්, උචිත ගැටළු සම්බන්ධයෙන් කමිටු අවධානය යොමු කළාය.

ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් වගකීම්වලට අනුගතවීම පෝෂණ කිරීමේ ස්වකීය බැඳීම තවදුරටත් සනාථ කරමින්, සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් මත එක්සත් ජාතීන්ගේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද 2 වන සාමයික වාර්තාව සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාශය සමග; හිංසනය හා අනෙකුත් කෲර, අමානුෂික හ අවමන් සහගත සැළකිළි හෝ දඬුවම් ගැන එක්සත් ජාතීන්ගේ විශේෂ සන්ධාන නියෝජිතයා විසින් ඉදිරිපත් කර ඇති මූලික නිරීක්ෂණ සාකච්ඡා කිරීමටද එම අමාත්‍යාංශයම සමග; කාන්තාවන්ට එරෙහිව සෑම අන්දමකම වෙනස්ව සැළකීම් මුලිනුපුටා දැමීමේ සම්මුති කමිටුවට (CEDAW) ඉදිරිපත් කරන ලද 8 වන වාර්තාව සමාප්ති නිරීක්ෂණ සාකච්ඡා කිරීම පිණිස කාන්තා කටයුතු අමාත්‍යාංශය සමග; ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ විශේෂ සන්ධාන නියෝජිතයා විසින් තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳව කෙටුම්පත් ප්‍රතිචාරය සැකසීම පිළිබඳ උපදේශන සැසිය සංවිධානය කළ නීතිය හා සමාජ භාරය; වැනි සාකච්ඡාවලටද සහභාගීවීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

## 6.2. ආසියානු ශාන්තිකර සංසදය හා සමග සබඳතා ශක්තිමත් කිරීම

කොමිෂන් සභාවේ කාර්ය භාරයේ ප්‍රගතිය සහ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම්වල තත්ත්වය ගැන කරුණු හෙළි කිරීම පිණිස, සභාපතිතුමිය, 2016 ඔක්තෝබර් මාසයේදී තායිලන්තයේ, බැංකොක් නුවර පැවැති ආසියානු ශාන්තිකර සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වූවාය. ආසියානු ශාන්තිකර සංසදය වූ කළී, කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් දැනුම බෙදා හදා ගැනීම, විශේෂඥ ඥාණය හා සහයෝගිතාවය ඔස්සේ වඩාත් ශක්තිමත් ජාතික මානව අයිතිවාසිකම් ආයතන ගොඩනැගීමට සහාය දෙනු ලබන ජාතික මානව අයිතිවාසිකම් ආයතන(එන්එච්ආර්අයිඑස්) වල කලාපීය පද්ධතියකි. එය මානව හිමිකම් කොමිෂන් සභාවට කලාපයේ ස්වකීය ප්‍රතිපූරකයින් හා සමග සම්බන්ධතා ගොඩ නැගීම සඳහා කදිම හා වැදගත් වේදිකාවකි.

## 6.3. ජාත්‍යන්තර සංවිධානවලට වාර්තා සහ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම

2016 ඔක්තෝබර් මාසයේදී, ශ්‍රී ලංකාවේ 5 වන වාර වාර්තාව සමාලෝචනයෙහි නියැලුන හිංසනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කෙරිණ. 2016 නොවැම්බර් මස 14-17 ජිනීවාහි පැවැති සැසියට එක් කොමසාරිස්වරයෙකු සහභාගී විය. ශ්‍රී ලංකාවේ පවතින හිංසනය හා වෙනත් ස්වාභාවයේ නොමනා සැළකීම් වලට අදාළ ස්වකීය තැවුල; හිංසන සිද්ධි වළක්වාලීමට කොමිෂන් සභාව විසින් ගෙන ඇති පියවර; ස්වකීය වාර්තාවෙහි සඳහන් කරමින්, හිංසන විරෝධී සම්මුතියේ 1 වන ව්‍යවස්ථාව ප්‍රකාර, දැඩි වේදනා ඇති කරවන හිංසනයන්ද ඇතුළු සියළුම ආකාරයේ හිංසනයන් ආවරණය වන පරිදි හිංසන විග්‍රහය පුළුල් කිරීම,

අත්අඩංගුවට ගැනීම් භාර නිලධාරීන්ගේ කල්ක්‍රියාව, රැඳවුම් මධ්‍යස්ථාන අධීක්ෂණය සහ සරණාගතයන්ගේ තත්ත්වයට අදාල සම්මුති හා සරණාගතයින්ගේ තත්ත්වයට අදාළ ගිවිසුම්, රටවැසිකමක් අහිමි පුද්ගලයින්ගේ තත්ත්වයට අදාළ සම්මුති සහ රටවැසිකමක් අහිමිවීම අවම කිරීමේ සම්මුති අපරානුමත කිරීම ආවරණය වන පරිදි හිංසනය විරෝධී සම්මුති පනතේ අංක: 12 දරණ කොටසේ සහ 1994 අංක: 22 දරන වෙනත් කෲර, අමානුෂික හා අවමන් සහිත සැළකීම හෝ දණ්ඩන පනතේ, හිංසනය විග්‍රහ කර ඇති ආකාරය සංශෝධනය කිරීම වැනි පියවර ගන්නා ලෙස රජයට නිර්දේශ කරන ලදී.

# 6.4. වෙනත් ජාත්‍යන්තර සහයෝගිතා

බහුවිධ ආයතන සමග ද්වි-පාර්ශික රැස්වීම් ඔස්සේ ස්වකීය ජාත්‍යන්තර සහයෝගිතාවයන් පුළුල් කර ගැනීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී. පොදු ලැදියාවකින් යුත් කරුණු සහ සාක්ෂාත් කරගත හැකි වියහැකි සහයෝගිතා සාකච්ඡා කිරීම පිණිස, කොමසාරිස්වරු දකුණු අප්‍රිකානු මහ කොමසාරිස් කාර්යාලය වැනි විදේශ රාජදූත මණ්ඩලවල සාමාජිකයින් හමුවූහ. යුරෝපා සංගමයේ දූත මණ්ඩලය සහ පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලය් මානව හිමිකම් ඒකකයේ ප්‍රධානි වැනි ජාත්‍යන්තර සංවිධාන කිහිපයක නියෝජිතයෝද මානව හිමිකම් කොමිෂන් සභාව හමුවූහ. 2016 මාර්තු මස 21-23 දින ජිනීවාහි පැවැති, මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව පිළිබඳ ජාතික ආයතනවල ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුවේ 29 වන මහා සභා රැස්වීමට සභාපතිතුමිය සහභාගී වූවාය. එය ජාතික මානව අයිතිවාසිකම් ආයතනයන්හි ගෝලීය සන්ධානය වන අතර, පළපුරුද්ද, මතිමතාන්තර හා අදහස් බෙදාහදා ගැනීම සඳහා සන්ධානයේ පිරිස් සහ වෙනත් ජාතික මානව අයිතිවාසිකම් ආයතනයන්හි සහෘදයින් හමුවීමට වැදගත් වේදිකාවක් විය. ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස, නව කොමිෂන් සභාවේ දැක්ම හා සැලසුම් ජාතික මානව අයිතිවාසිකම් ආයතනයන්හි ගෝලීය ප්‍රජාව වෙත සංනිවේදනය කිරීමට අවස්ථාව උදා වූ නිසා, කොමිෂන් සභාවට මෙම රැස්වීම විශේෂ වැදගත්කමකින් යුක්ත විය.

තවද, කොමිෂන් සභාවේ සාමාජිකයෙකු, මානව හිමිකම් කොමිෂන් සභාව නියෝජනය කරමින්, 2016 ජූනි 21-23 දක්වා නෝර්වේහි පැවැති මරණීය දණ්ඩනය පිළිබඳ ලෝක සම්මන්ත්‍රණයට සහභාගී විය. ජාත්‍යන්තර අවධානය ආකර්ෂණය කර ගනිමින්, 2016 ජනවාරි මාසයේදී කොමිෂන් සභාව විසින් මරණීය දණ්ඩනය අහෝසි කිරීම රජයට නිර්දේශ කිරීමෙන් අනතුරුව, ජාත්‍යන්තර සංසදයකදී මරණීය දණ්ඩනය සම්බන්ධ ස්වකීය ස්ථාවරය සාකච්ඡාවට භාජනය කිරීමේ අවස්ථාව මෙම සම්මන්ත්‍රණයේදී උදා විය. එසේම මරණීය දණ්ඩනයට අදාලව ගෝලීය වශයෙන් අළුත්ම තත්ත්වය ඉගෙනීමට සහ එයින් පාඩම් ගැනීමටද මෙය කදිම අවස්ථාවක් විය.

# 7 වන පරිච්ඡේදය:

# ප්‍රාදේශීය හා උප කාර්යාල

7.1. දළ විශ්ලේෂණය
7.2. අවශ්‍ය කටයුතු කළ පැමිණිලි
7.3. මෙහෙයුම් පාලන ක්‍රියාකාරකකම
7.4. අධ්‍යාපන හා විහිදුම් ක්‍රියාකාරකම්

# 07 ප්‍රාදේශීය හා උප කාර්යාල

## 7.1. දළ විශ්ලේෂණය

මානව අයිතිවාසිකම් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ කොමිෂන් සභාවේ කටයුතු හැකිතරම් දුරට ජනතාවට සමීප කිරීම උදෙසා ප්‍රාදේශීය කාර්යාල 10ක් (අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුණේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය සහ වවුනියාව) සහ උප කාර්යාල 06ක් (කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, නුවරඑළිය, පොලොන්නරුව සහ පුත්තලම) හරහා කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ. මහජනතාවගෙන් බහුතරයක් කොමිෂන් සභාවට සමීපවන්නේ මෙකී කාර්යාල හරහාය. එම නිසා, ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය ජනතාව අතර හුදෙක් හරණයක්ම නොවී, කොමිෂන් සභාවේ කාර්ය භාරය සක්‍රීය ලෙස ඉෂ්ට සිද්ධ කිරීමේ තීරණාත්මක හා වැදගත් කාර්ය භාරයක් මෙම ප්‍රාදේශීය හා උප කාර්යාලවලින් ඉටු වේ. පැමිණිලි භාර ගැනීම, උල්ලංඝණ චෝදනා විභාග කිරීම, දෝෂාරෝපණය කෙරෙන මානව අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් උපදේශනය, ආරාවුල් සමථයට පත් කිරීම සඳහා මැදිහත්වීම, මානව අයිතිවාසිකම් උල්ලංඝණයන්, නිර්දේශ සඳහා ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම, අධීක්ෂණ කටයුතු මෙහෙයවීම, ප්‍රාදේශීය මට්ටමින් දැනුවත්වීමේ වැඩ සටහන් පැවැත්වීම සහ සිවිල් සමාජ සංවිධාන සමග සම්බන්ධීකරණය ඇතුළු පිරිපුන් ක්‍රියාකාරකම් මාලාවක් මෙම කාර්යාලවලින් ක්‍රියාත්මක වේ.

## 7.2. අවශ්‍ය කටයුතු කළ පැමිණිලි

- **ලද පැමිණිලි**

2016 වසරේදී, ප්‍රාදේශීය හා උප කාර්යාල වෙත ගොනු කරන ලද පැමිණිලි සංඛ්‍යාව 4202කි. ඉහළම පැමිණිලි සංඛ්‍යාව වන 796 පෞද්ගලික නිදහසට අදාල වූ අතර, සමස්ත පැමිණිලි සංඛ්‍යාවෙන් 19 %කි. රාජ්‍ය නිලධාරීන්ගේ අක්‍රීයත්වය සම්බන්ධයෙන් පැමිණිලි 769 (18%) ක් ලබුණ අතර, තුන්වන ඉහළම පැමිණිලි සංඛ්‍යාව සේවා නියුක්තියට අදාළවය. සමස්තයක් වශයෙන්, 2016 වසරේදී ලද පැමිණිලි සංඛ්‍යාවේ දක්නට ලැබුණේ ඉතා සුළු අඩුවක් වන අතර, එයින් පිළිබිඹු වන්නේ ජනතාව විසින් කොමිෂන් සභාව කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසයයි.

| පැමිණිලි වර්ගය | කලාපය | | | | | | | | | | | එකතුව ප්‍රා.කා. සහ උප. කා. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුර | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චි උප කාර්යාලය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | |
| පෞද්ගලික නිදහස | 16 | 116 | 13 | 41 | 87 | 24 | 50 | 106 | 175 | 48 | 120 | 796 |
| හිංසනය (ශාරීරික හා මානසික) | 2 | 36 | 1 | 7 | 2 | - | 10 | 27 | 27 | 7 | 10 | 129 |
| සාමාන්‍ය හිරිහැර | - | 27 | - | - | - | - | - | - | - | - | 25 | 52 |
| ලිංගික අතවර | - | - | - | - | - | 1 | - | 3 | - | - | 2 | 6 |
| තර්ජන | 1 | - | 8 | 12 | 38 | 14 | 17 | 23 | 68 | 14 | 33 | 228 |
| අවමන් සහගත සැළකිලි | 3 | - | 1 | - | 12 | 5 | 10 | 11 | 4 | 2 | 14 | 62 |
| අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්/රඳවාගැනීම් | 9 | 51 | 2 | 14 | 28 | 3 | 10 | 34 | 67 | 12 | 21 | 251 |
| රැඳවුම් තත්ත්වයන් | - | - | - | - | - | - | - | 1 | 1 | - | - | 2 |
| අත්අඩංගුවේදී මරණ | - | - | - | - | - | - | - | 1 | - | 1 | - | 2 |
| බලහක්කාරයන් හෝ අනිච්ඡානුගත අතුරුදහන්වීම් | - | - | - | - | - | - | - | - | 1 | - | - | 1 |
| පැහැර ගෙනයාම් | - | - | - | - | 1 | - | - | - | - | - | - | 1 |
| බාහ්‍ය-අධිකරණ ඝාතන | - | - | - | - | - | - | - | - | 1 | 1 | - | 2 |
| අහඹු මරණ | | | | | | | | | | | | |
| සිරකරු අයිතිවාසිකම් | - | 1 | - | - | 1 | - | - | - | 4 | - | - | 6 |
| අතුරුදහන්වූවන් | 1 | 1 | - | 8 | 5 | 1 | 3 | 5 | 2 | 11 | 14 | 51 |
| වෙනත් | - | - | - | - | - | - | - | 1 | - | - | 1 | 2 |
| වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් | - | - | - | 3 | 2 | - | - | 1 | 3 | - | - | 9 |
| භාෂණයේ නිදහස | - | - | - | 1 | - | - | - | - | 1 | - | - | 2 |
| රැස්වීමේ නිදහස | - | - | - | - | - | - | - | - | 2 | - | - | 2 |
| සමාගමයේ නිදහස | - | - | - | - | 1 | - | - | - | - | - | - | 1 |
| ආගමික නිදහස | - | - | - | 2 | - | - | - | 1 | - | - | - | 3 |
| යාම් ඊම් නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| තොරතුරු දැනගැනීමේ නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වෙනත් | - | - | - | - | 1 | - | - | - | - | - | - | 1 |
| සේවා නියුක්තිය | 43 | 161 | 55 | 36 | 39 | 6 | 75 | 165 | 120 | 19 | 30 | 749 |
| අධ්‍යාපනය | 5 | 30 | 24 | 21 | 30 | 3 | 37 | 103 | 82 | 7 | 14 | 357 |
| ජනප්‍රිය පාසල් වලට ඇතුළත් කිරීම් | - | 6 | 6 | 3 | 1 | - | 7 | 81 | 48 | - | 5 | 157 |
| වෙනත් අධ්‍යාපන අයිතිවාසිකම් | 6 | 24 | 18 | 18 | 29 | 3 | 30 | 22 | 34 | 7 | 9 | 123 |
| රාජ්‍ය සුබසාධන සේවා | 5 | 12 | 1 | 26 | 13 | 5 | 6 | 23 | 28 | 2 | 2 | 123 |
| යටිතල උපයෝගිතා | 13 | 20 | 16 | 1 | 1 | - | 6 | 14 | 30 | 1 | 8 | 110 |
| ඡන්ද ලියාපදිංචි පැමිණිලි | - | 1 | - | 2 | - | - | - | - | - | - | - | 3 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය ආයතනවල අක්‍රියත්වය | 33 | 117 | 33 | 102 | 80 | 12 | 90 | 190 | 36 | 46 | 30 | 769 |
| පොලිසිය | 16 | 64 | 26 | 71 | 62 | 7 | 68 | 92 | 20 | 11 | 27 | 464 |
| වෙනත් රාජ්‍ය ආයතන | 17 | 53 | 7 | 31 | 18 | 5 | 22 | 98 | 16 | 35 | 3 | 305 |
| ළමා අයිතිවාසිකම් | 2 | 3 | 1 | 1 | 2 | | 2 | - | 1 | - | 2 | 14 |
| ආබාධිත පුද්ගල අයිතිවාසිකම් | - | - | - | - | 1 | - | - | - | 4 | - | 2 | 7 |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | 2 | - | - | - | - | - | 1 | 3 |
| සංක්‍රමණික ශ්‍රමික අයිතිවාසිකම් | - | 1 | 1 | 13 | 1 | 1 | 3 | 5 | - | 3 | 5 | 33 |
| එල්ජීබීටීකිව් (සමකාමී,සමලිංගික, ද්විලිංගික සහ විමසුම්) | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| සෞඛ්‍යය | - | 2 | 3 | 2 | 1 | - | 2 | 2 | 1 | - | - | 13 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 44 | 161 | 37 | 36 | 14 | 61 | 35 | 69 | 89 | 27 | 53 | 626 |
| අස්ථානගතවූවන්/පෙර ළා පැමිණෙන සරණාගතයන් | - | - | - | - | - | 2 | - | - | - | 1 | 14 | 17 |
| පාරිසරික | - | 1 | 2 | 8 | - | - | 4 | 14 | 11 | - | - | 40 |
| පරිපාලන කරුණු | 1 | 34 | 18 | 34 | 7 | 8 | 7 | 40 | 33 | 22 | 8 | 212 |
| අවසරපත්‍ර/බලපත්‍ර | - | 2 | 8 | 1 | - | 1 | 3 | 3 | 2 | 2 | 2 | 24 |
| බලය අපහරණය/අවභාවිතය | 1 | 23 | - | 29 | 6 | 7 | - | 5 | 18 | 13 | 5 | 107 |
| වෙනත් පරිපාලන කරුණු | - | 9 | 10 | 4 | 1 | - | 4 | 32 | 13 | 7 | 1 | 81 |
| කාන්තා අයිතිවාසිකම් | - | 1 | - | 1 | - | - | 1 | 2 | 23 | 1 | - | 29 |
| වැඩිහිටි අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| විෂය පථයෙන් බැහැර/ නොපිළිගත් | 24 | 30 | 32 | 5 | 11 | 7 | - | 112 | 30 | 15 | 26 | 292 |
| **එකතුව** | **187** | **690** | **236** | **332** | **291** | **129** | **318** | **846** | **666** | **192** | **315** | **4202** |

- **නිමකරන ලද පැමිණිලි සංඛ්‍යා විස්තරය**

**විමසුම්**

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාලය | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | වවුනියාව | බදුල්ල | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | කිලිනොච්චි | අනුරාධපුර | යාපනය | මඩකලපුව | |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝන | 33 | 79 | 82 | - | 305 | 187 | 36 | 17 | 66 | 74 | 33 | 912 |
| සමථයට පත් කිරීම | 33 | 94 | 23 | 52 | 59 | 35 | 11 | 49 | 51 | 102 | 52 | 561 |
| සහන ප්‍රදාන | 34 | 34 | 31 | 159 | 58 | 77 | 29 | 10 | 111 | 19 | 136 | 698 |
| වෙනත් ආයතන වෙත යොමුකළ | - | - | - | 1 | 05 | 52 | 1 | - | - | 2 | - | 61 |
| නියෝග දුන් | - | - | - | - | - | 42 | 4 | 7 | - | 11 | 36 | 100 |
| පැමිණිලිකරු | 30 | - | 78 | 40 | 130 | 97 | 20 | 14 | 104 | 17 | 45 | 575 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උනන්දුවක් නැති | | | | | | | | | | | | |
| විෂය පථයෙන් බැහැර | 35 | - | 54 | - | 110 | 99 | 18 | 6 | - | 6 | - | 328 |
| ඉල්ලා අස්කර ගත් | 5 | 43 | 4 | - | 13 | 37 | 5 | 1 | 20 | 8 | 9 | 145 |
| කාලාවරෝධ | - | - | - | - | 07 | 27 | 3 | - | - | - | 1 | 38 |
| **එකතුව** | **170** | **250** | **272** | **252** | **687** | **653** | **127** | **104** | **352** | **239** | **312** | **3418** |

## 7.3. අධීක්ෂණ ක්‍රියාකාරකම්

රැඳවියන්ගේ අයිතිවාසිකම් සහතික කිරීම පිණිස ඔවුන් රඳවා ඇති ස්ථාන අධීක්ෂණය කිරීමට පවරා ඇති කාර්ය භාරය ප්‍රකාර, කොමිෂන් සභාවේ විහිදුම් වපසරිය ව්‍යාප්ත කරලීමෙහි ලා ප්‍රාදේශිය කාර්යාලවල සහ උප කර්යාලවල අධීක්ෂණ ක්‍රියාකාරකම් තීරණාත්මක හා වැදගත් ස්ථානයක් උසුලයි. පොලිස් ස්ථාන වෙත කෙරෙන ක්‍රමික විසැරි මෙන්ම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ රැඳවුම් මධ්‍යස්ථාන වෙත කෙරෙන සාමයිත විසැරි ඇතුළුව කෙමිෂන් සභාවේ අධීක්ෂණ ක්‍රියාකාරකම්වල බහුතරය ඉටු කරනු ලබන්නේ මෙම කාර්යාලවල කාර්ය මණ්ඩලය විසිනි.

| ප්‍රාදේශීය කාර්යාල | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොලිස් ස්ථාන | 140 | 296 | 80 | 140 | 211 | 72 | 238 | 479 | 100 | 158 |
| බන්ධනාගාර | - | 03 | 01 | 18 | 04 | - | 02 | 03 | 05 | 04 |
| ත්‍රස්.විමර්ශන දිසාව | - | - | - | - | - | - | - | 06 | - | 09 |
| ළමා නිවාස | 03 | 08 | 04 | 08 | 02 | 08 | 02 | 04 | 03 | - |
| ගැසට් කර ඇති රැඳවුම් මධ්‍යස්ථාන | 03 | 03 | - | 01 | - | - | - | - | 01 | - |
| පුරුත්ථාපන මධ්‍යස්ථාන | - | - | - | - | - | - | - | - | - | 7 |
| වැඩිහිටි නවාස | - | 04 | - | 02 | - | 01 | - | - | - | - |

( රැඳවුම් මධ්‍යස්ථානවල විසැරි - 2016)

ප්‍රාදේශීය කාර්යාල විසින් තම බලප්‍රදේශයේ මානව අයිතිවාසිකම් තත්ත්වය ක්‍රමිකව අධීක්ෂණය කරන අතර, යෝග්‍ය අවස්ථාවන්හිදී මැදිහත්වීමක් සිදු කෙරේ. උදාහරණයක් වශයෙන්, මහනුවර ප්‍රදේශීය කාර්යාලය මහනුවර අම්බුලුවාව කුණු කසළ කන්ද කඩා වැටුණ අවස්ථාවේදී, මැදිහත්වී, නගර සභාවේ, පළාත් සභාවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව අධීක්ෂණ කටයුතුවල නිමග්න විය. යළි පදිංචි කරවීම් කඩිනම්ව ඉටු කිරීම පිණිස සියළුම අවශ්‍ය පියවර ගැණෙන බවට සහතික වී, නැවත මෙවැනි විනාශයක් සිදුවීම වළක්වාලීම පිණිස පිළියම් යොදන ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් නිකුත් කෙරිණ.

පානම, සාස්ත්‍රවෙල සහ රාගම්වෙල පෞද්ගලික ඉඩම් යුදහමුදාවේ භාවිතය සඳහා ගැනීමේදී උද්ගත වූ ගැටලුවට අම්පාර ප්‍රාදේශීය කාර්යාල මැදිහත් වන ලදී. අර්බුද සමයේදී අස්ථානගතවූ ඉඩම් හිමියන් යුද හමුදා මෙම ඉඩම්වල පදිංචි වීමට ප්‍රථම, ස්වකීය ඉඩම්වලට ආපසු පැමිණි අවස්ථාවේදී, ආයුධ සන්නද්ධ හඳුණා නොගත් පිරිසක් ඉඩම් හිමියන් භයගන්වා බලපෑම් කර ඇත. පරීක්ෂණයකින් පසු, යුද හමුදා සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේදී විධිමත් ක්‍රියාදාමය

අනුගමනය කරන ලෙස රජයට නිර්දේශ කරන ලද අතර, වින්දිතයින්ට වන්දි ගෙවීම හෝ විකල්ප ඉඩම් සැපයීමද තවදුරටත් නිර්දේශ කෙරිණ.

2016 අගෝස්තු මස 26 වන දින වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සහ 2016 අප්‍රියෙල් මස 28 වන දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී, සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ ත්‍රිකුණාමල කලාපීය කාර්ය බලකාය විසින් පවත්වන ලද නඩු විභාගයේ කටයුතු ත්‍රිකුණාමල ප්‍රාදේශීය කාර්යාලය විසින් අධීක්ෂණය කරන ලද අතර, සාක්ෂි ලබා දෙන ලද සාක්ෂිකරුවන්ට භය ගන්වා තර්ජනය කිරීමක් හෝ හිංසාවක් නොවන බවට සහතික වන ලදී.

## 7.4. අධ්‍යාපනය හා බාහිර විහිදුම් ක්‍රියාකාරකම්

ස්වකීය තොරතුරු ප්‍රචාරණය ක්‍රියාකාරකම්වලදී වඩාත් විස්තාරණයවූ ප්‍රේක්ෂක ප්‍රවාහයකට සමීපවීමේ සම්භාව්‍යතාවය කොමිෂන් සභාවට නිර්මාණය කර දෙමින් ප්‍රාදේශීය මට්ටමින් අධ්‍යාපන හා බාහිර විහිදුම් වැඩසටහන් පැවැත්වීම ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල විසින් සිදු කරන ලදී. ඒ අතරතුර, ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීය මට්ටමින් කැඳවන ලද සිවිල් සමාජ රැස්වීම් වලදී කොමිෂන් සභාවේ අවධානයට යොමු විය යුතු ගැටළු හඳුනා ගැනීමට හැකිවූ අතර, එකී ගැටළු යෝග්‍ය විසඳුම් ලබාදීම පිණිස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී අදාළ රාජ්‍ය පාර්ශ්වකරුවන්ට යොමු කෙරිණ. 2016 වසරේද මෙම රැස්වීම් ක්‍රමිකව පැවැත්විණ. තවද, ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල විසින් ජාත්‍යන්තර කාන්තා දිනය, හිංසන වින්දිතයින්ට සහායවීමේ ජාත්‍යන්තර දිනය සහ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් දිනය, ඒ ඒ දින සනිටුහන් කෙරෙන විවිධාකාර ක්‍රියාකාරකම්ද සහිතව ප්‍රාදේශීය මට්ටමින් සමරණ ලදී. මේ කාර්යාල විසින් විවිධ ආයතන සහ ප්‍රජාවන් සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පවත්වා, බාහිර පාර්ශ්වයන් විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සම්පත් සහාය ලබා දෙන ලදී. ඉලක්කගත ප්‍රේක්ෂක ප්‍රවාහයට පාසල් දරුවන්, සිවිල් සමාජ සංවිධාන, පුවත්පත් කලාවේදීන්, රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව ඇතුළත් විය.

**2016 දී, ප්‍රාදේශීය කාර්යාල සම්පත් දායකත්වයෙන් පවත්වන ලද**
**මානව අයිතිවාසිකම් දැනුවත් වීමේ වැඩසටහන්**

| ප්‍රාදේශීය කාර්යාලය | වැඩ සටහන් සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 27 |
| අනුරාධපුරය | 09 |
| බදුල්ල | 03 |
| මඩකලපුව | 44 |
| යාපනය | 13 |
| මහනුවර | 14 |
| කල්මුණේ | 22 |
| මාතර | 07 |
| ත්‍රිකුණාමලය | 03 |
| වවුනියාව | 03 |

# 8 වන පරිච්ඡේදය :

# පරිපාලන හා මුදල්

8.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

8.2. සේවා නියුක්ති ප්‍රතිලාභ

8.3. සේවා නියුක්තිය හා පුරප්පාඩු

8.4. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

# 08 පරිපාලන හා මුදල්

## 8.1. කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

වර්තමාන කොමිෂන් සභාවේ නිල කාලය ආරම්භ වීමෙන් පසු, වෘත්තීමය විශිෂ්ඨත්වය සහ කාර්ය මණ්ඩල ධාරිතාවය වර්ධනය කරලීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැඩි උත්සාහයක් දරා ඇත. මානව අයිතිවාසිකම් උල්ලංඝණයන්ට සක්‍රීයව ප්‍රතිචාර දැක්වීමට සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා ආයතනික විශිෂ්ඨත්වය අත්‍යාවශ්‍ය බව කොමිෂන් සභාව වටහා ගෙන සිටී. එමනිසා, ස්වකීය වෘත්තීයත්වය, කාර්යක්ෂමභාවය, අභියෝග වටහා ගැනීම සහ තමන් සේවය කරනු ලබන ප්‍රජාවන්ට අවශ්‍ය සහාය ලබාදීම පිණිස ස්වකීය කුසලතා උපයෝගී කර ගැනීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීමට, දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන්, ලබා ගත හැකිව තිබෙන්නාවූ අනේකවිධ පුහුණු පහසුකම් වල ප්‍රතිලාභ ලබා ගැනීම ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල වල සේවය කරන කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂා කරන අතර, ඒ සඳහා නිරන්තරයෙන් ඔවුන් ධෛර්යමත් කරවනු ලැබේ. ඒ හා සමානවම, 2016 වසරේදී ලබා ගත හැකිව තිබූ අනේක විධ පුහුණු අවස්ථාවලට සහභාගී වී ප්‍රතිලාභ ගැනීමේ ප්‍රස්ථාවය කොමිෂන් සභා කාර්ය මණ්ඩලයද උදෙයා්ගයෙන් ඉල්ලා සිටින ලදී.

- **දේශීය පුහුණු අවස්ථා**

  - **තොරතුරු තාක්ෂණ කුසලතා ධාරිතාවය ඇගයීම**

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම ප්‍රමාණවත් නොවේයැයි පෙනී ගිය හෙයින්, 2016 වර්ෂයේදී කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කුසලතා ධාරිතාවයෙහි ඇගයීමක් සිදු කිරීමට පියවර ගන්නා ලදී. කාර්ය මණ්ඩලයේ මූලික මයික්‍රෝසොෆ්ට් කාර්යාල පැකේජය සහ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් භාවිතයේ නිපුණත්වය මොරටුව විශ්ව විද්‍යාලය විසින් ඇගයීමකට ලක් කරන ලදී. මෙම ඇගයීමේ ප්‍රතිඵල මත පදනම්ව දැඩි පුහුණුවක් 2017 වර්ෂයේදී ලබාදීම සඳහා උපලේඛනගත කර ඇත.

  - **අලුතින් හඳුන්වා දෙන ලද යොමු කිරීම් යාන්ත්‍රණය මත පුහුණුව**

පැමිණිලි හැසිරවීම පිණිස අලුතින් හඳුන්වා දෙන ලද යොමු කිරීම් යාන්ත්‍රණය සහ පරීක්ෂණ සහ විමර්ශන ක්‍රියා පරිපාටියට අදාළ පුහුණුව පරීක්ෂණ හා විමර්ශන අංශයේ කාර්ය මණ්ඩලයටද ලබා දෙන ලද අතර, පරීක්ෂණ හා විමර්ශන ක්‍රියා පරිපාටි සංග්‍රහයක් සම්පාදනය කිරීමද කොමිෂන් සභාව විසින් ආරම්භ කෙරිණ.

- **සමලිංගික හා ආශ්‍රිත ප්‍රභේදවල (එල්ජීබීටිඅයිකියු) පුද්ගලයින් සංවේදීකරණය**

සෑම පුරවැසියෙකුටම එක හා සමානව හා ඔවුන්ගේ ලිංගික අනුස්ථාපනය හෝ සමාජභාවී අනන්‍යතාවය නොතකා සැළකීමේ වැදගත්කම ගැන කාර්ය මණ්ඩලය සංවේදීකරණය කරවීමේ අරමුණින්, සමලිංගික හා ආශ්‍රිත ප්‍රභේදවල (එල්ජීබීටිඅයිකියු) පුද්ගලයින් සමග කටයුතු කිරීමට සහ සමලිංගික හා ආශ්‍රිත ප්‍රභේදවල (එල්ජීබීටිඅයිකියු) පුද්ගලයින් විෂයය වන විශේෂිත මානව අයිතිවාසිකම් උල්ලංඝණයන් හඳුනා ගැනීමට හැකිවනු පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතාව වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- **විශේෂ දේශන මාලාවක්**

ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් හා ඒ ආශ්‍රිත විෂයය ක්ෂේත්‍රයන්හි අද්‍යතන වර්ධනයන් පිළිබඳව කාර්ය මණ්ඩලය යාවත්කාලීන කරවීමේ ප්‍රයත්නයක් වශයෙන් වර්ෂය පුරාම කාර්ය මණ්ඩලය සඳහා මරණීය දණ්ඩනය පිළිබඳ සාමාජීය හා නෛතිකමය පර්යාලෝකයන්, මානව අයිතිවාසිකම් සාරධර්ම ප්‍රවර්ධනය සඳහා සෞන්දර්යවේදය භාවිතා කිරීම යන මාතෘකා මත විශේෂ දේශන මාලාවක්ද, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන උපදේශන කමිටුවේ වාර්තාව සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා මානව හිමිකම් කොමිෂන් සභා යෝජනා පිළිබඳව විශේෂ සාකච්ඡාවක්ද පවත්වන ලදී.

- **ජාත්‍යන්තර සරණාගත ආරක්ෂාව පිළිබඳ පුහුණුව**

එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සරණාගත ආරක්ෂාව පිළිබඳ පුහුණුවට විමර්ශන නිලධාරීන් සිව් දෙනෙකු සහභාගී වූ අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් සහ අභ්‍යාසලාභීන් සඳහා එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්ගේ ක්‍රියාකාරකම් මත හැඩගැසීමේ උපදේශන මාලාවක් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් විසින් පවත්වන්ට යෙදුණි.

- **විගණන විමසුම් අවම කිරීමේ පුහුණුව**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මුදල් ගණකාධිවරුන්ගේ සංගමය විසින් තාක්ෂණ විද්‍යා වෘත්තිකයින්ගේ අභ්‍යාස ආයතනයේදී සංවිධානය කරන්නට යෙදුණු "විගණන විමසුම් අවම කරන්නේ කෙසේද? " පුහුණුවට මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් සහභාගී විය.

- **ජාත්‍යන්තර වැඩසටහන්**

ජාතික මානව අයිතිවාසිකම් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා විශේෂයෙන් සම්පාදනය කරන ලද හා ආසියා ශාන්තිකර පදනම විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් ගණනාවකට කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සහභාගී වන ලදී.

- මානව හිමිකම් අධ්‍යාපනය මත ආසියා ශාන්තිකර සංසද මිශ්‍රිත අධ්‍යයන වැඩසටහන තායිලන්තයේ, බැංකොක් නුවර පවත්වන ලදී.

- වධ හිංසාව සම්බන්ධව ආසියා ශාන්තිකර සංසදය මගින් සංවිධානය කරන ලද පාඨමාලාව 2016 ජුනි 06 – 09 දක්වා මැලේසියාවේදී පවත්වන ලදී.

- ආසියා ශාන්තිකර සංසද සන්නිවේදන පද්ධති සහයෝගිතා වැඩමුළුව 2016 අප්‍රියෙල් මස 26-28 දක්වා නේපාලයේදී පවත්වන ලදී.

උපායශාන පුහුණු වැඩසටහන විසින් සංවිධානය කරන ලදුව, 2016 ඔක්තෝබර් මස 30 - නොවැම්බර් 06 දක්වා කටාර්හි, ඩෝහා නුවර පවත්වන ලද, මානව අයිතිවාසිකම් උපදේශනය හා මැද පෙරදිග සංක්‍රමණික ශ්‍රමිකයින් පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනට කොමිෂන් සභා නිලධාරියෙකු සහභාගී විය.

## 8.2. සේවා නියුක්ති ප්‍රතිලාභ

මෙතෙක් මුළුමණින්ම අනුගත නොවූ, ප්‍රසූත නිවාඩුවට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මානව හිමිකම් කොමිෂන් සභා සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කෙරිණ.

## 8.3. සේවා නියුක්තිය හා පුරප්පාඩු

2016 වර්ෂයේදී, සේවක සංඛ්‍යා තනතුරු 233 ක් සඳහා අනුමැතිය ලද නමුත්, බඳවා ගැනීමේ පරිපාටියක් අනුමතව නොතිබූ හෙයින්, බඳවා ගැනීම් කළ නොහැකිවිය.

මේ අතරතුර, පමාවූ පරීක්ෂණ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස, ස්විස් රජය විසින් මුදල් යෙදවෙන ව්‍යාපෘතියක් හරහා පරීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු සහ එක් ව්‍යාපෘති සහකාරවරයෙකු සේවයට බඳවා ගන්නා ලදී.

## 8.4. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කිරීම පිණිස අරමුදල් බහුතරය සපුරා ගන්නා ලද්දේ මහා භාණ්ඩාගාරයෙනි. කෙසේවුවද, කොමිෂන් සභාවල වැඩසටහන්ගත කාර්යයන් සමහරක් සඳහා බාහිර ප්‍රදායකයින් විසින් ලබා දෙන ලද මූල්‍යමය සහාය කොමිෂන් සභාව විසින් කෘතඥපූර්වකව භාර ගන්නා ලදී. ඒ අනුව, ස්විස් සමූහාණ්ඩුව පමාවූ පරීක්ෂණ නිම කිරීම පිණිස මූල්‍යමය සහාය ලබා දෙන ලදී; එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් තොරතුරු ජනතාව වෙත වඩාත් සමීප කරලීම පිණිස කොමිෂන් සභා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සහ සක්‍රීයත්වය වැඩි දියුණු කරලීම පිණිස කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ධාරිතාවය වැඩි කිරීම සහ සිවිල් සමාජ සංවිධාන හා එක්ව ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම වැනි හඳුණාගත් වැඩසටහන්ගත කාර්යයන් සඳහාද; ආසියා ශාන්තිකර සංසදය විසින්, ලිංගික අනුස්ථාපනය, සමාජභාවී අනන්‍යභාවයට සහ ලිංගික නෛසර්ගික ගත ලක්ෂණයන්ට අදාළව, මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව මත දකුණු අසියා මිශ්‍රිත අධ්‍යයන පාඨමාලාවෙහි කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය සුසාධ්‍යකරණය සඳහාද මූල්‍ය සහාය ලබා දෙන ලදී. බාහිර ප්‍රදායකයින් විසින් ලබා දෙන ලද මූල්‍ය සහාය මෙසේය:

| අරමුදල් යොදවන නියෝජිතායතනය | මුදල (රුපි) |
|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 2,503,000.00 |
| ස්විස් සමූහාණ්ඩුව | 2,951,962.00 |
| ආසියා ශාන්තිකර පදනම | 109, 458.00 |
| **එකතුව** | **5,564,420.00** |

2016 වසරේ එක් එක් කාර්තුව සඳහා සමස්ත මූල්‍ය ප්‍රතිපාදනය මෙසේය:

- **2016.01.01 සිට 2016.03.31 දක්වා මූල්‍ය ප්‍රතිපාදනය**

| | |
|---|---|
| **ආරම්භක ශේෂය** | |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | 44,352,000.00 |
| ප්‍රාග්ධන | 4,300,000.00 |
| වෙනත් ආදායම් | 160,087.81 |
| **එකතුව** | **48,612,087.81** |
| **වියදම** | |
| පුද්ගලික පඩිනඩි | 23,698,131.61 |
| ගමන් වියදම් | 789,582.83 |
| සැපයුම් | 936,522.83 |
| නඩත්තු වියදම් | 637,981.93 |
| සේවා | 15,733,56.63 |
| මාරු කිරීම් | 297,747.45 |
| ප්‍රාග්ධන වත්කම් පුන. හා වැඩි දියුණුව | |
| ප්‍රග්ධන වත්කම් අත්පත් කර ගැනීම | |
| ධාරිතා වර්ධනය | 285,752.90 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 2,505,724.76 |
| ආයෝජන - මා.අ.වැඩ සටහන් | |
| **සමස්ත වියදම** | **44,885,005.64** |

- **2016.04.01 සිට 2016.06.30 දක්වා මූල්‍ය ප්‍රතිපාදනය**

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 3,927,082.17 |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | 39,916.000.00 |
| ප්‍රාග්ධන | |
| වෙනත් ආදායම් | 447,460.90 |
| **එකතුව** | **44,290,543.07** |
| **වියදම** | |
| පුද්ගලික පඩිනඩි | 25,403,296.73 |
| ගමන් වියදම් | 94,368.50 |
| සැපයුම් | 1,057,648.88 |
| නඩත්තු වියදම් | 779,503.41 |

| | |
|---|---|
| සේවා | 8,606,750.72 |
| මාරු කිරීම් | |
| ප්‍රාග්ධන වත්කම් පුන. හා වැඩි දියුණුව | |
| ප්‍රග්ධන වත්කම් අත්පත් කර ගැනීම | |
| ධාරිතා වර්ධනය | 224,047.58 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 811,893.00 |
| ආයෝජන - මා.අ.වැඩසටහන් | |
| **සමස්ත වියදම** | **36,977,509.71** |

- **2016.07.01 සිට 2016.09.30 දක්වා මූල්‍ය ප්‍රතිපාදනය**

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 3,927,082.17 |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | 30,400,000.00 |
| ප්‍රාග්ධන | 2,000,000.00 |
| වෙනත් ආදායම් | 320,776.20 |
| **එකතුව** | **40,033,809.55** |
| **වියදම** | |
| පුද්ගලික පඩිනඩි | 24,361,495.14 |
| ගමන් වියදම් | 216,542.50 |
| සැපයුම් | 3,904,706.70 |
| නඩත්තු වියදම් | 495,202.84 |
| සේවා | 3,904,706.70 |
| මාරු කිරීම් | 721,947.22 |
| ප්‍රාග්ධන වත්කම් පුන. හා වැඩි දියුණුව | |
| ප්‍රග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 61,630.00 |
| ධාරිතා වර්ධනය | 639,784.71 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 2,128,875.12 |
| ආයෝජන - මා.අ.වැඩ සටහන් | |
| **සමස්ත වියදම** | **33,699,491.12** |

- **2016.10.01 සිට 2016.12.31 දක්වා මූල්‍ය ප්‍රතිපාදනය**

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 6,334,318.43 |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | 56,025,000.00 |
| ප්‍රාග්ධන | 5,300,000.00 |
| වෙනත් ආදායම් | 272,224.91 |
| **එකතුව** | **67,931,543.34** |
| **වියදම** | |
| පුද්ගලික පඩිනඩි | 26,717,669.48 |
| ගමන් වියදම් | 847,514.03 |
| සැපයුම් | 30,359,531.92 |

| | |
|---|---|
| නඩත්තු වියදම් | 1,459,322.80 |
| සේවා | 30,359,531.92 |
| මාරු කිරීම් | 359,159.00 |
| ප්‍රාග්ධන වත්කම් පුන. හා වැඩි දියුණුව | |
| ප්‍රග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 1,994,866.92 |
| ධාරිතා වර්ධනය | 1,186,270.08 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 3,353,506.22 |
| ආයෝජන - මා.අ.වැඩ සටහන් | |
| **සමස්ත වියදම** | **67,931,543.34** |

- **සමස්ත වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදනය**

| | |
|---|---|
| ආරම්භක ශේෂය | 00 |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල** | |
| පුනරාවර්තන | 170,693,000.00 |
| ප්‍රාග්ධන | 11,600,000.00 |
| වෙනත් ආදයම් | 1,200,549.82 |
| **එකතුව** | 183,493,549.82 |
| **වියදම** | |
| පුද්ගලික පඩිනඩි | 100,180,592.96 |
| ගමන් වියදම් | 1,948,007.56 |
| සැපයුම් | 4,817,181.49 |
| නඩත්තු වියදම් | 3,372,010.98 |
| සේවා | 58,604,550.97 |
| මාරු කිරීම් | 1,378,853.67 |
| ප්‍රාග්ධන වත්කම් පුන. හා වැඩි දියුණුව | |
| ප්‍රග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 2,056,496.92 |
| ධාරිතා වර්ධනය | 2,335,855.27 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 8,800,000.00 |
| ආයෝජන - මා.අ.වැඩ සටහන් | |
| **සමස්ත වියදම** | **183,493,549.82** |

# පරිශිෂ්ඨ

## ශ්‍රී ලංකා සිතියම



# නිර්දේශ ලේඛනය

| | ගොනු අංකය | දිනය | විෂයගත කාරණය |
|---|---|---|---|
| 1. | එච්ආර්සී/2694/15 | 2016.01.07 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 2. | එච්ආර්සී/1982/15 | 2016.01.07 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 3. | එච්ආර්සී/2497/15 | 2016.02.01 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 4. | එච්ආර්සී/එම්ටී/398/11 | 2016.01.21 | අත්අඩංගුවටගැනීම්/රඳවාතබා ගැනීම් |
| 5. | එච්ආර්සී/කේ/120/15 | 2016.01.19 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 6. | එච්ආර්සී/ඒපී/92/2015 | 2016.01.21 | ස්ථාන මාරු |
| 7. | එච්ආර්සී/3166/14 | 2016.04.04 | සේවා කොන්දේසි |
| 8. | එච්ආර්සී/2449/15 | 2016.05.17 | බඳවාගැනීම් |
| 9. | එච්ආර්සී/2146/15 | 2016.02.24 | වැඩ තහනම් කිරීම |
| 10. | එච්ආර්සී/3548/13 | 2016.02.17 | දේපළ අයිතිවාසිකම් |
| 11. | එච්ආර්සී/කේ/258/15 | 2016.04.28 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 12. | එච්ආර්සී/2444/15 | 2016/06/20 | මැතිවරණ නාම යෝජනා |
| 13. | එච්ආර්සී/2694/15 | 2016.01.07 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 14. | එච්ආර්සී/4326/15 | 2016.06.07 | විභාග |
| 15. | එච්ආර්සී/2856/13 | 2016.06.24 | සේවය අවසන්කිරීම් |
| 16. | එච්ආර්සී/එම්ටී/49/16/එන් | 2016.06.27 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 17. | එච්ආර්සී/3939/15 | 2016.08.12 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 18. | එච්ආර්සී/578/16 | 2016.08.16 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 19. | එච්ආර්සී/2124/16 | 2016.08.12 | අධ්‍යාපනඃගුරු හිංසන |
| 20. | එච්ආර්සී/කේ/52/16 | 2016.08.12 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 21. | එච්ආර්සී/3358/15 | 2016.08.10 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 22. | එච්ආර්සී/4706/15 | 2016.08.10 | රජයේ පාසල්වලටඇතුළත් කිරීම |
| 23. | එච්ආර්සී/1622/15 | 2016.08.09 | වධ හිංසනය |
| 24. | එච්ආර්සී/4743/14 | 2016.08.16 | අක්‍රියත්වය |
| 25. | එච්ආර්සී/කේ/09/16 | 2016.08.16 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 26. | එච්ආර්සී/4504/14 | 2016.08.16 | උසස්වීම |
| 27. | එච්ආර්සී/1862/15 | 2016.08.15 | වධ හිංසනය |
| 28. | එච්ආර්සී/3405/14 | 2016.07.29 | උසස්වීම |
| 29. | එච්ආර්සී/5005/13 | 2016.08.12 | ස්ථාන මාරුවීම |
| 30. | එච්ආර්සී/2056/15 | 2016.08.16 | උසස්වීම |
| 31. | එච්ආර්සී/කේ/376/15 | 2016.09.07 | සේවා කොන්දේසි |
| 32. | එච්ආර්සී/685/16 | 2016.09.20 | බලය අපහරණය/අවභාවිතය |
| 33. | එච්ආර්සී/4138/14 | 2016.09.21 | විශ්‍රාම වැටුප |
| 34. | එච්ආර්සී/ඒපී/734/13 | 2016.09.20 | වධ හිංසනය |
| 35. | එච්ආර්සී/2037/15 | 2016.10.03 | භාෂණයේ නිදහස |
| 36. | එච්ආර්සී/2038/15 | 2016.10.03 | භාෂණයේ නිදහස |

| | | | |
|---|---|---|---|
| 37. | එච්ආර්සී/1994/15 | 2016.10.30 | භාෂණයේ නිදහස |
| 38. | එච්ආර්සී/4236/15 | 2016.09.28 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 39. | එච්ආර්සී/08/16 | 2016.10.03 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 40. | එච්ආර්සී/4691/14 | 2016.10.04 | ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය |
| 41. | එච්ආර්සී/4718/15 | 2016.11.22 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 42. | එච්ආර්සී/3469/15 | 2016.12.07 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 43. | එච්ආර්සී/කේ/47/16 | 2016.12.14 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |
| 44. | එච්ආර්සී/4699/15 | 2016.12.26 | රජයේ පාසල්වලට ඇතුළත් කිරීම |

## දියත් කරන ලද ස්වයං- මෙහෙයුම් පරීක්ෂණ

| දිනය | ගොනු අංකය | වගඋත්තරකරු |
|---|---|---|
| 2016.01.04 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/01/16<br>එච්ආර්සී/එම්ටී/28/16/එන්<br>එච්ආර්සී/1033/16 | ඇඹිලිපිටිය පොලීසිය |
| 2016.02.23 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/02/16<br>එච්ආර්සී/931/16 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| 2016.05.10 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/03/16 | කළුතර විද්‍යාලය<br>විදුහල්පති/ක.වි. |
| 2016.05.12 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/04/16 | ත්‍රස්ත.විමර්.දිශාව |
| 2016.07.05 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/07/16<br>එච්ආර්සී/2593/16 | ගනේමුල්ල පොලීසිය |
| 2016.07.14 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/08/16<br>එච්ආර්සී/2631/16 | මතුගම ක. අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 2016.07.14 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/09/16 | ත්‍රි.වැ.ප.රැඳවුම්කරුවන්<br>/පොලිස්පතිත්‍රස්ත.වි.නි.පො |
| 2016.08.16 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/10/16 | කළුතර බන්ධනාගාරය |
| 2016.09.20 | එච්ආර්සී/එම්ටී/එස්යූඕ/එම්ඕටීයූ/01/16 | හම්බන්තොට පොලිසිය |
| 2016.09.22 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/11/16 | මහර බන්ධනාගාරය |
| 2016.10.04 | එච්ආර්සී/කේ/එස්යූඕ/එම්ඕටීයූ/493/16/ඒ<br>එච්ආර්සී/114/17 | හැටන් පොලිසිය |
| 2016.10.04 | **එච්ආර්සී/කේ/එස්යූඕ/එම්ඕටීයූ/477/16/ඩබ්.**<br>එච්ආර්සී/3643/16 | පුස්සැල්ල පොලිසිය |
| 2016.10.06 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/12/16 | ගනේමුල්ල පොලිසිය |
| 2016.10.13 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/13/16 | කැළණිය ක. අධ්‍යා අධ්‍යක්ෂ/.<br>ප්‍රා.ලේ.වත්තල |
| 2016.10.26 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/14/16 | ජාතික ළමාරක්ෂක අධිකාරිය |
| 2016.11.20 | එච්ආර්සී/එස්යූඕ/එම්ඕටීයූ/15/16<br>එච්ආර්සී/1633/16 | සෞඛ්‍ය අමාත්‍යාංශය |

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය සහ කොමසාරිස්වරුන් සහභාගී වූ රැස්වීම්/වැඩසටහන්/වැඩමුළු සහ අනෙකුත් අවස්ථාවන් - 2016

| දිනය 2016 | රැස්වීම/වැඩමුළුවෙහි තේමාව/අරමුණ |
|---|---|
| | **නිල රැස්වීම්/ වැඩසටහන්** |
| 01/14 | ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති සමඟ හමුවීම |
| 02/01<br>02/03 | මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීන් සතු කාර්යභාරය පිළිබඳව ආසියානු කලාපීය සම්මන්ත්‍රණය -පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය |
| 02/15 | ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ පද්ධති සිතියම්ගත කිරීම - ළමා සංවර්ධන අමාත්‍යාංශයේ පාලන කමිටුව සමඟ හමුවීම |
| 02/19 | සංක්‍රමණික සේවකයන්ගේ අයිතීන් පිලිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට යැවිය යුතු 2වන කාලච්ඡේද වාර්තාව පිලිබඳ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡාව. |
| 02/26 | ආගමන විගමන නිලධාරීන් සමඟ විශේෂ රැස්වීම |
| 02/26 | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්තුමා සමඟ විශේෂ රැස්වීම |
| 03/02 | එච්.අයි.වී./ ඒඩ්ස් සම්බන්ධ ගැටලු සහ අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය පිළිබඳ සංවාදය - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| 03/09 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස් දැන ගැනීම සඳහා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුව විසින් සංවිධානය කරන ලද හමුවීම |
| 03/30 | ගරු නීතිපතිතුමන් සමඟ හමුවීම |
| 04/07 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාතික ක්‍රියා සැලැස්ම ක්‍රියාවට නැංවීම ඇගයීම සඳහා වූ සාකච්ඡාව |
| 04/25 | විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය මංගල සමරවීර මහතා සමඟ හමුවීම |
| 05/06 | අතිගරු ජනාධිපතිතුමා සමඟ ස්වාධීන කොමිෂන් සභා සභාපතීන් ඇතුළු සාමාජිකයින් සඳහා වූ සාකච්ඡාව |
| 05/13 | අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලයේ වැඩකටයුතු පිළිබඳ දැනුවත් කිරීම - ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 05/24 | ශ්‍රී ලංකාවේ නීති ආධාර අංශය සඳහා උපායමාර්ගික ක්‍රියා සැලැස්මක් වැඩි දියුණු කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ උපදේශන සාකච්ඡාව - අධිකරණ අමාත්‍යාංශය |
| 07/08 | රාජ්‍ය සේවය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උප කමිටුවේ පාලන කමිටුව විසින් සංවිධානය කරන ලද ඉහළ කාර්ය සාධන රාජ්‍ය සේවය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ සංවාදය |
| 07/23 | මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සමඟ හමුවීම |
| 08/04 | මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍ය කමිටුව සමඟ හමුවීම - විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 09/06 | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡාව - විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 09/19 | පුරවර සැරිසර වැඩසටහන ක්‍රියාවට නැංවීමේ අවස්ථාවට සහභාගී වීම - ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය |
| 09/20 | අතුරුදන් වුවන්ගේ කාර්යාලය සහ ජාතික උපදේශන ක්‍රියාවලිය පිළිබඳ සිවිල් සමාජ සංවිධාන සමඟ පවත්වන විවෘත සංවාදය - විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 09/20 | කාන්තාවන් කුට්ඨනය පිළිබඳ සංවාදය - කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 09/26<br>–<br>09/28 | ව්‍යවස්ථාව සරල භාෂාවෙන් කෙටුම්පත් කිරීම පිළිබඳ වැඩමුළුව - ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා මණ්ඩල ලේකම් කාර්යාලය |

| | |
|---|---|
| 09/30 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු සභාපතිතුමා සමග හමුවීම |
| 10/06 | ජාතික කුට්යන විරෝධී කාර්ය සාධක බලකායේ රැස්වීමට සහභාගී වීම - අධිකරණ අමාත්‍යංශය |
| 10/13 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු සභාපතිතුමා සමග හමුවීම |
| 10/24 | පොලිස්පතිතුමන් සමග හමුවීම |
| 10/28 | කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුව (CEDAW Committee) වෙත ඉදිරිපත් කරන ලද 8වන කාලච්ඡේද වාර්තාව හා සම්බන්ද අවසන් නිරීක්ෂණ පිළිබඳ සාකච්ඡාවට සහභාගී වීම - කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 11/09 | ජාත්‍යන්තර ත්‍රස්ත මර්දන නීති රාමුව සහ ශ්‍රී ලංකාවේ යෝජිත තරස්ත මර්දන පනත පිළිබඳ ජාතික වැඩමුළුව - එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (USAID) සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| 11/23 | ලිංගික හා ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාතික ක්‍රියා සැලැස්ම එළි දැක්වීමට සහභාගී වීම - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය |
| 11/24 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු සභාපතිතුමා සමග හමුවීම |
| 11/24 | ජාතික නිවාස ප්‍රතිපත්තිය ඇගයීමේ උපදේශන වාරයට සහභාගී වීම - ජාතික නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය |
| 11/30 | සර්වජන ඡන්ද බලය - 85 වන සංවත්සරය සැමරුම - මැතිවරණ කොමිෂන් සභාව |
| **විදේශ රාජ්‍ය / ජාත්‍යන්තර සංවිධාන** | |
| 01/14 | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහා කොමසාරිස් කාර්යාලයේ (OHCHR) නිලධාරීන් සමග හමුවීම |
| 01/21 | එක්සත් ජාතීන්ගේ සරණාගතයින් වෙනුවෙන් වූ මහා කොමසාරිස් කාර්යාලයේ (UNHCR) නියෝජිතයින් සමග හමුවීම |
| 02/01 | එක්සත් ජාතීන්ගේ සත්‍ය, යුක්තිය, වන්දි ගෙවීම සහ පුනරාවර්තනය නොවීම සහතික කිරීම වෙනුවෙන් වූ විශේෂ රපොර්තුකරු සමග හමුවීම |
| 02/02 | දකුණු අප්‍රිකානු මහ කොමසාරිස් සමග හමුවීම |
| 02/05 – 02/06 | ආසියානු ශාන්තිකර සංසදය (APF)සමග පවත්වන ලද ඉහළ පෙළේ සංවාදය |
| 02/08 | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහා කොමසාරිස් සමග හමුවීම |
| 02/12 | ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය (ICRC) විසින් පසුගිය යුධ සමයේ අතුරුදන් වුවන්ගේ පවුල් වල අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණයේ සොයා ගැනීම් සහ ඒ මත පදනම් වූ නිර්දේශයන් සාකච්ඡා කිරීම සඳහා හමුවීම. |
| 02/15 | යුරෝපීය සංගමයේ මූලස්ථානයේ (EU) සිට ශ්‍රී ලංකාවට පැමිණි මෙහෙයුම් නිලධාරීන් සමග හමුවීම. |
| 03/21 | එක්සත් රාජධානියේ මහා කොමසාරිස්වරයාගේ දෙවන ලේකම් සමග හමුවීම |
| 03/23 | මරණ දණ්ඩනය තුරන් කිරීම කෙරෙහි ජාතික මානව හිමිකම් ආයතන වල කාර්යභාරය සාකච්ඡා කිරීම සඳහා හමුව - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය, ස්විස්ටර්ලන්තය |
| 04/05 | ස්විට්සර්ලන්ත තානාපති සමග හමුවීම |
| 04/26 | කැනේඩියානු මහ කොමසාරිස්වරිය සමග හමුවීම |
| 04/27 | ජර්මානු තානාපති කාර්යාලයේ මෙහෙයුම් නියෝජ්‍ය ප්‍රධානී සමග හමුවීම |
| 05/02 | විනිසුරුවරුන්ගේ හා නීතීඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ රපොර්තුකරු සහ වධහිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික, පහත් දඬුවම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ රපොර්තුකරු සමග හමුවීම |
| 05/03 | ජපන් තානාපතිතුමන් සමග හමුවීම |

| | |
|---|---|
| 05/04 | ජර්මානු විදේශ කාර්යාලයේ මානව හිමිකම් පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගීවූවන් සමඟ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාතාවරණය පිළිබඳ සාකච්ඡාව |
| 05/10 | ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්වරයා සමඟ පැවැති හමුව |
| 05/24 | පොදු රාජ්‍ය මණ්ඩලයේ නිලධාරීන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ පැවැති සාකච්ඡාව |
| 05/24 | වධහිංසා සහ අනෙකුත් කුරිරු, අමානුෂික, පහත් දඬුවම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ රපොර්තුකරු සමඟ මූලික නිරීක්ෂණ සාකච්ඡා කිරීම සඳහා හමුවීම - විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 05/30 | ආසියා ශාන්තිකර පදනමේ (APF) උපදේශක ක්‍රිස් සිදෝති මහතා සමඟ හමුවීම |
| 06/21 | GSP+ බදු සහන පිළිබඳ වට මේස සාකච්ඡාව - ශ්‍රී ලංකාවේ යුරෝපීය වාණිජ මණ්ඩලය (ECCSR) |
| 07/12 | එක්සත් ජනපදයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සහකාර රාජ්‍ය ලේකම් සමඟ හමුවීම - විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 09/01 | එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කි-මූන් මහතා නමින් පැවැත්වූ රාජ්‍ය භෝජන සංග්‍රහය - ජනාධිපති නිල නිවස |
| 09/02 | ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ බන්-සූන් තෙක් (Madam Ban Soon-taek) මහත්මිය සමඟ සාකච්ඡාව |
| 09/07 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (USAID) නිකොලස් බූත් මහතා සමඟ හමුවීම |
| 09/13 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (USAID) හා මානව හිමිකම් කොමිෂන් සභාව අතර ඉදිරි කටයුතු පිළිබඳ සහයෝගය ලබාදෙන්නේ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡාව |
| 09/27 | ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO)නියෝජිතයින් සමඟ හමුවීම |
| 10/10 | කාන්තාවන් සහ ගැහැණු දරුවන් වෙනුවෙන් වූ ඕස්ට්‍රේලියානු තනාපතිනිය පිළිගැනීම |
| 10/18 | සුළුතරයේ ගැටලු පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු සමඟ හමුවීම - විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 10/26 - 10/27 | ජාතික මානව හිමිකම් ආයතන පිළිබඳ ආසියා ශාන්තිකර සංසදයේ (APF) 21 වන වාර්ෂික රැස්වීම - තායිලන්තය |
| 10/27 | එක්සත් ජාතීන්ගේ සරණාගතයින් වෙනුවෙන් වූ මහා කොමසාරිස් කාර්යාලයේ (UNHCR) සරණාගත පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ වූ රැස්වීමට සහභාගී වීම |
| 11/07 | වධහිංසා පිළිබඳ සම්මුතිය ශ්‍රී ලංකාවේ ක්‍රියාවට නැංවීම පිළිබඳව වන 5වන කාලච්ඡේද වාර්තාව හා සබැඳි සාකච්ඡාව |
| 11/08 | ත්‍රස්තවාදය සහ ශ්‍රී ලංකාවේ යෝජිත තරස්ත මර්දන පනත පිළිබඳ ඉහළ පෙළේ සංවාද - එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) |
| 11/08 | එක්සත් රාජධානියේ මහ කොමසාරිස් කාර්යාලය සහ FOKUS සංවිධානය එකතුව සංවිධානය කරන ලද 'ලිංගික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම' යටතේ වූ වැඩමුළුව |
| 11/14 | මානව හිමිකම් ක්‍රියාධරයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ රපොර්තුකරු සමඟ හමුවීම |
| 11/15 | කැනේඩියානු සෙනෙට් සභික මොබීනා ජැෆර් (Mobina Jaffer) සමඟ හමුවීම - කැනේඩියානු මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ ආසියානු සංසදය |
| 11/23 | එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ නියෝජනායතනයේ ප්‍රජාතාන්ත්‍රවාදික පාලනය සහ වගවීම පිළිබඳ ව්‍යාපෘතිය එළි දැක්වීම |
| 12/01 | ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ (ICRC) නිලධාරීන් සමඟ හමුවීම |
| 12/12 – 12/16 | ආසියා ශාන්තිකර පදනම (APF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන එකතුව සංවිධානය කරන ලද ලිංගික ඇනුස්ථාපනය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, ලිංගික ලක්ෂණ හා සබැඳි මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා සුරක්ෂිත කිරීමේ කළාපීය වැඩමුළුව. |

| ජාත්‍යන්තර සිවිල් සමාජ සංවිධාන/ වෘත්තීමය සංවිධාන | |
|---|---|
| 02/23 | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය පිලිබඳ සාකච්ඡා කිරීම සඳහා නෝර්වේජියානු '*Landinfo*' ආයතනය සමග හමුවීම. |
| 04/06 | 'Democracy Reporting International' හී විධායක අධ්‍යක්ෂකතුමන් සමඟ හමුවීම |
| 04/06 | 'Global Criminal Justice' කාර්යාලයේ විශේෂ සම්බන්ධීකාරක සහ විශේෂ උපදේශක සමග හමුවීම |
| 08/01 – 08/02 | සංක්‍රමණික සේවකයන්ගේ යුක්තියට ප්‍රවේශය පිළිබඳව උප කලාපීය වැඩමුළුව - 'Solidarity Center' ආයතනය |
| **සිවිල් සමාජ සංවිධාන/ වෘත්තීමය සංවිධාන** | |
| 03/02 | පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳව මන්නාරම් පුරවැසි කමිටුව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා සබැඳිව ගත හැකි ක්‍රියා මාර්ග සාකච්ඡා කිරීම සඳහා හමුවීම |
| 04/21 | නවක වදය සහ, ලිංගික සහ ලිංගිකත්වය මත පදනම්වූ හිංසනය මැඩ පැවැත්වීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග පවත්වන ලද උපදේශනමය සංවාදය. |
| 05/04 | 'සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රවිචාරන කාර්ය සාධක බලකායේ' සභාපතිනි මනෝරි මුත්තේට්ටුවේගම මැතිනිය සමඟ පැවැති සාකච්ජාව |
| 05/17 | 'Right to Life' ආයතනය සමඟ වධහිංසා වැලැක්වීම උදෙසා ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ජාව |
| 06/14 | ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් පිලිබඳ වැඩසටහන - නීතිය හා සමාජ භාරකාරත්වය (LST) |
| 06/27 | එක්සත් ජාතීන්ගේ වධහිංසාවට පාත්‍ර වුවන්ට සහය දැක්වීමේ ජාත්‍යන්තර දිනය නිමිත්තෙන් සංවිධානය කරනු ලබන විශ්ෂ උත්සවය - 'Right to Life' ආයතනය |
| 10/05 | මානව හිමිකම් හා සංවර්ධන කේන්ද්‍රය සමඟ සාකච්ඡාව |
| 10/17 | ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් වූ එක්සත් ජාතීන්ගේ විශේෂ රපොර්තුකරු වෙත ඉදිරිපත් කල යුතු වාර්තාව සැකසීම සඳහා උපදේශනය සැපයීම වෙනුවෙන් වූ රැස්වීම - නීතිය හා සමාජ භාරකාරත්වය (LST) |
| 10/18 | අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනතට යෝජිත සංශෝධන පිලිබඳ සාකච්ජාව - ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| 11/05 | ආගමික නිදහස හා සම්බන්ද ආරම්භක ජාතික ජාල රැස්වීම පිලිබඳ මානව හිමිකම් සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පසු විපරම් සාකච්ජාව |
| 11/08 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය පිලිබඳ උපදේශන වැඩසටහන - කාන්තා හා මාධ්‍ය එකමුතුව |
| 12/22 | 'Youth for Human Rights International' සංවිධානය සමඟ රැස්වීම |
| 12/23 | කුරුණෑගල මානව හිමිකම් සංවිධානයේ ජාත්‍යන්තර මානව හිමිකම් දින සැමරුමට සහභාගී වීම |
| **අනෙකුත් විවිධ වැඩසටහන්** | |
| 02/11 | දෘශ්‍ය හා රංග කලා විශ්ව විද්‍යාලයේ ඉතිහාසය සහ කලා න්‍යාය පිලිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානී සමඟ හමුවීම |
| 05/17 | කොළඹ විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් අධ්‍යයනය පිලිබඳ මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ සාකච්ජාව |
| 05/29 – 05/30 | පාර්ලිමේන්තු මන්ත්‍රීන් සඳහා වන මානව හිමිකම් අධ්‍යයන සම්මන්ත්‍රණය - පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය |
| 06/13 | 'ගෝලීය කටයුතු සහ ශ්‍රී ලංකාව: 2015 ජනවාරි සිට ආ මඟ' යන තේමාව යටතේ පැවති සංවාදය - ජනාධිපති ලේකම් කාර්යාලය සහ ජාත්‍යන්තර අධ්‍යයනය පිලිබඳ බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති ඇගයීම් අංශය |
| 06/16 | සරණාගතයින් පිලිබඳ සංධානය හා හමුව |
| 06/28 | පොලිස් සේවා නවීකරණය පිලිබඳ වැඩමුළුව - ජාතික පොලිස් කොමිෂන් සභාව සහ නීතිය හා සාමය පිලිබඳ අමාත්‍යාංශය |

| | |
|---|---|
| 06/29 | රූපවාහිණී නාලිකාවේ 'ආයුබෝවන් සුභ දවසක්' වැඩසටහනට වධහිංසාවට පාත්‍ර වූවන්ට සහය දැක්වීමේ ජාත්‍යන්තර දිනය වෙනුවෙන් සහභාගී වීම |
| 08/12 | ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ අබාධිත වූවන් පිලිබඳ නීති කෙටුම්පතෙහි අවශ්‍යතාවය සහ වැදගත්කම පිලිබඳ සංවාදය - ජනවාර්ගික අධ්‍යයනය පිලිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES) |
| 08/12 | තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් අනුස්මරණ දේශනය |
| 08/15 | ජාතික කුට්ඨන විරෝධී කාර්ය සාධක බලකායේ රැස්වීමට සහභාගී වීම |
| 08/26 | මානව හිමිකම්, පුරවැසිභාවය, සහ ප්‍රජාතන්ත්‍රීයකරණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - කොළඹ විශ්ව විද්‍යාලයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය |
| 09/18 | බටහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් අබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කිරීම උදෙසා සංවිධානය කරන ලද වැඩසටහනට සහභාගී වීම |
| 10/08 | ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය සහ මානසික සහන සේවා පිළිබඳ වාර්තාව එළි දැක්වීමට සහභාගී වීම |
| 10/09 | ශ්‍රී ලංකා වයෝවෘධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ සංගමය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුමට සහභාගී වීම |
| 10/10 | ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර මානසික සෞඛ්‍ය දිනයට සහභාගී වීම |
| 10/11 | ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය සැමරීමේ ජාතික වැඩසටහනෙහි සම්පත්දායකයකු ලෙස සහභාගී වීම - ජාතික ළමාරක්ෂක අධිකාරිය |
| 10/13 | සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතාගේ ජන්ම දිනය සිහිපත් කර නිදහස් අධ්‍යාපනය මූලික අයිතාවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට ඇතුළත් කරන ලෙස ඉල්ලන මහජන පෙත්සම - ජාතික ළමාරක්ෂක අධිකාරිය |
| 11/07 | 'කලාව තුලින් සංහිඳියාව' යන තේමාව යටතේ වූ ජාත්‍යන්තර සමුළුව - ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය |
| 12/09 | දූෂණ විරෝධී ජාතික සමුළුවට සහභාගී වීම - නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය සහ අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |

## එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස්ගේ 2016.03.08 දින දරන ලිපිය

NATIONS UNIES
DROITS DE L'HOMME
HAUT-COMMISSARIAT

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

HAUT-COMMISSARIAT AUX DROITS DE L'HOMME • OFFICE OF THE HIGH COMMISSIONER FOR HUMAN RIGHTS
PALAIS DES NATIONS • 1211 GENEVA 10, SWITZERLAND
www.ohchr.org • TEL: +41 22 917 9000 • FAX: +41 22 917 9008 • E-MAIL: registry@ohchr.org

REFERENCE:

8 March 2016

Dear Dr. Udagama,

It was such a pleasure to meet with you and your fellow Commissioners during my recent visit to Sri Lanka. Thank you very much for your kind hospitality over lunch.

The revival of the Human Rights Commission, I believe, is one of the most important and hopeful steps the new Government has taken to advance human rights in Sri Lanka. While not underestimating the many challenges ahead, I am confident that the Commission will play a very important and independent role, thanks to the energy and commitment of its new leadership.

I will continue to highlight the importance of the Human Rights Commission and its work in all my interactions with Government, the United Nations and other bilateral partners. You can count on the maximum support from my Office as you take the work of the Commission forward.

Yours sincerely

Zeid Ra'ad Al Hussein
High Commissioner for Human Rights

Dr. Deepika Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

RECEIVED
1 5 MAR 2016